යෝජිත ව්‍යවස්ථාවෙන් හඳුන්වාදෙන

ශ්‍රී ලංකා
ඔරුමිත්ත නාඩුව

ශ්‍රී ලංකාව ෆෙඩරල් රාජ්‍යයක් බවට පරිවර්තනය කරන
නව ව්‍යවස්ථා සංශෝධන පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්

ජාතික ඒකාබද්ධ කමිටුව

© ජාතික ඒකාබද්ධ කමිටුව
පළමු වන මුද්‍රණය : ඔක්තෝබර 2018

ජාතික ඒකාබද්ධ කමිටුව විසින් ප්‍රකාශිත වෙනත් ග්‍රන්ථ
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ මෙහෙයුම්
කමිටු අතුරු වාර්තාව පිළිබඳ විවරණයක්
- පළමු මුද්‍රණය 2017

මුද්‍රණය : දීපානී මුද්‍රණ / ප්‍රකාශන (පෞද්ගලික) සමාගම
464, හයිලෙවල් පාර, ගංගොඩවිල, නුගේගොඩ.

ප්‍රකාශක : ජාතික ඒකාබද්ධ කමිටුව

සම්පාදනය : ජනාධිපති නීතිඥ මනෝහර ද සිල්වා
ගෙවිඳු කුමාරතුංග

පිටකවරය : තිලක් සමරවික්‍රම

අනුග්‍රහය : SLUNA - Canada
WSPUR - Australia
SPUR - Vict., Australia
SPUR - NSW, Australia

ලේ දහදිය හා තම ජීවිතය ද පුදා

අප ගේ වීරෝදාර රණවිරුවන් රැකගත් ඒකීය ශ්‍රී ලංකාව

ෆෙඩරල් රාජ්‍යයක් බවට පරිවර්ථනය කිරීම සඳහා

ජාත්‍යන්තරයට දුන් පොරොන්දු ඉටු කිරීමට

යෝජිත නව ව්‍යවස්ථා නිර්දේශ මගින්

හඳුන්වාදෙන රාජ්‍ය ව්‍යුහය 'ඒකීය රාජ්‍ය ව්‍යුහයක්' බවට

සාවද්‍ය ප්‍රකාශ කරමින්

ව්‍යවස්ථාවේ ඉංගිරිසි පිටපතේ

ඇති 'යුනිටරි' යන පදය පවා ව්‍යවස්ථාවෙන් ඉවත් කොට

එක්සත් (ෆෙඩරල්) අරුත ගෙනදෙන 'ඔරුමිත්ත නාඩු' යන දමිළ පදය

වර්තමාන ව්‍යවස්ථාවේ දෙමළ පිටපතේ යොදාගෙන ඇති

ඒකීය පදයට සම අරුත් ඇති

'ඔට්ට්‍රිඅච්චි' යන පදය වෙනුවට යොදාගනිමින්

ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාවේ සිංහල හා ඉංගිරිසි පිටපත්වලට පවා

එ කී ඔරුමිත්ත නාඩු යන පදය ඇතුළත් කොට

'ඒකීය' පදයේ පිළිගත් නෛතික අර්ථ නිරූපණය වෙනස් කර

ඊට සාවද්‍ය අර්ථකථනයක් ලබාදෙමින් ද

ෆෙඩරල් රාජ්‍යයක් ඇති කිරීමට අවශ්‍ය විධිවිධාන ඇතුලත්

ව්‍යාජ ඒකීය ලේබලයක් සහිත ව ෆෙඩරල් ව්‍යුහයක්

හඳුන්වාදෙන මෙහෙයුම් කමිටුවට ඉදිරිපත් කර ඇති

ව්‍යවස්ථා යෝජනා පිළිබඳ

විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්

මෙ සේ ජනතාව වෙත පිළිගන්වමු.

ජාතික ඒකාබද්ධ කමිටුව

පෙරවදන

වර්තමාන රජයේ ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලියේ යටි අරමුණ ශ්‍රී ලංකාව බෙදා වෙන් කිරීමට ඉඩ සලසන ෆෙඩරල් රාජ්‍යකට පරිවර්තනය කිරීම බව දැන් සක්සුදක් සේ පැහැදිලි ය.

මේ ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය ආරම්භ වූයේ ලාල් විජේනායක මහතා ගේ ප්‍රධානත්වයෙන් මහජන අදහස් ලබාගැනීමට යැ යි කියා කමිටුවක් පත් කරනු ලැබීමෙනි. ඔවුන් ගේ නිර්දේශ ඉදිරිපත් කිරීමෙන් පසු ව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මෙහෙයුම් කමිටුව පත් කළ අනුකමිටු 6ක් විසින් සිය නිර්දේශ ඉදිරිපත් කරනු ලැබිණි. ඒ නිර්දේශ පදනම් කරගෙන 2017 සැප්තැම්බර මස 21 වන දින මෙහෙයුම් කමිටුවේ අතුරු වාර්තාවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදන මණ්ඩලයට ඉදිරිපත් කළ අතර අවසානයේ මෙහෙයුම් කමිටුවට අනුබද්ධ විශේෂඥයන් 6 දෙනකු විසින් පිළියෙළ කළ ව්‍යවස්ථා කෙටුම්පතක් ද ඉදිරිපත් විය. එ කී සියලු වාර්තාවල සුසංයෝජනයක් 2018 ජූලි 18 වන දින මෙහෙයුම් කමිටුවට ඉදිරිපත් කර ඇත. මෙය ඒ යෝජනා පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයකි.

ඉහත කී සමස්ත කමිටු සඳහා තෝරා පත් කරගන්නා ලද තැනැත්තන් බහුතරයක් රාජ්‍යයේ ඒකීය ස්වභාවයට විරුද්ධ, බුද්ධාගමට ප්‍රමුඛස්ථානය දීම හෙළාදකින, නැත හොත් එ කී වැදගත්කම නොදකින අය බව විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණකි.

උදාහරණයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ඒකීය භාවය පිළිබඳ සඳහන් වන ව්‍යවස්ථාවේ 2 වන වගන්තිය කිසි දු සංශෝධනයකින් තොර ව එ ලෙස ම තබාගත යුතු බවට කියා සිටින්නේ ලාල් විජේනායක කමිටු සාමාජිකයන් 19 දෙනා ගෙන් එක් සාමාජිකයකු[1] පමණි. බුද්ධාගමට ප්‍රමුඛස්ථානය ලබාදෙන 9 වන වගන්තිය හා එය ඇතුළත් වන ව්‍යවස්ථාවේ II පරිච්ඡේදයට කිසි දු වෙනසක් නො කළ යුතු බව පවසන්නේ එකී 19 දෙනා ගෙන් සාමාජිකයන් දෙ දෙනකු[2] පමණි.

ලාල් විජේනායක කමිටුවේ නිර්දේශ අතර ශ්‍රී ලංකාව අනාගමික රාජ්‍යයක් විය යුතු බවත්, බුද්ධාගමට දී ඇති 'ප්‍රමුඛස්ථානය' ඊට අහිමි කොට සියලු ආගම්වලට සමාන තත්ත්වයක් ලබාදිය යුතු බවටත් වූ යෝජනා විය. එ සේ ම බුද්ධාගම සඳහා වෙන් වුණු ව්‍යවස්ථාවේ II පරිච්ඡේදය සියලු ආගම්වලට වෙන් කිරීම ඔවුන් ගේ තවත් යෝජනාවකි. ශ්‍රී ලංකාව ඒකීය රාජ්‍යයක් විය යුතු බව ව්‍යවස්ථාවෙන් ඉවත් කිරීම ද මේ කමිටුව කළ යෝජනාවකි. ජාතික ධජය වෙනස් කොට අනාගමික රජ්‍යයකට සුදුසු ධජයක් නිර්මාණය කිරීම, දෙමළ ජාතික ගීයක් හඳුන්වාදීම ඒ වාර්තාවේ ඇති අනිකුත් නිර්දේශ අතර විය. මේ විජේනායක වාර්තාවේ නිර්දේශ සම්බන්ධයෙන් මහා සංඝයා වහන්සේලා ගේ ද ගිහි බෞද්ධ ජනතාව ගේ ද විරෝධයට ප්‍රතිචාර දැක්වූ රජය ප්‍රකාශ කළේ ඒ වාර්තාව හුදෙක් මහජන අදහස් මිස රජය අනුමත කරන නිර්දේශ නොවන බව යි. ලාල් විජේනායක මහතා ගේ කමිටුවට ඒකීය රාජ්‍යයට පක්ෂ ව ඉදිරිපත් කළ යෝජනා බොහොමයක් ඇතුළත් කර නැති අතර ඒ අදහස් ප්‍රකාශ කළ සමහර අය ගේ නම් පවා ඒ කමිටු වාර්තාවෙන් ඉවත් කිරීමට කටයුතු කර තිබීම කනගාටුදායක ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මෙහෙයුම් කමිටුව පත් කළ අනුකමිටු හයෙහි සාමාජිකයන් බොහෝ දෙ නෙකු ද, ඒවාට අනුබද්ධ විශේෂඥයන් සියල්ලන් ම පාහේ ෆෙඩරල් මතවාදීන් වන අතර ඒකීය රාජ්‍යයක් වෙනුවෙන් පෙනීසිටින අය ඒ කමිටුවලට පත් නොකරගැනීමට රජය උපායශීලී විය. බලය බෙදීමේ නිර්දේශ

1. ජනාධිපති නීතිඥ කුෂාන් ද අල්විස් මහතා (ඒ වාර්තාවේ 24 පිටුව.)
2. ජනාධිපති නීතිඥ කුෂාන් ද අල්විස් හා එම්. කේ. දමයන්ති, දේශපාලන විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (වාර්තාවේ 17 වන පිටුව).

ඉදිරිපත් කිරීම සඳහා පත් කර ඇති අනුකමිටුවේ ප්‍රධාන හිටපු ප්ලොට් (PLOTE) සංවිධානයේ නායක වර්තමාන දෙමළ ජාතික සන්ධානය නියෝජනය කරන මන්ත්‍රීවරයෙකි. දෙමළ ජාතික සංවිධානය වෙන ම රාජ්‍යයක් වෙනුවෙන් කටයුතු කරන පක්ෂයක් බව නොරහසකි. ඔවුන් ෆෙඩරල් රාජ්‍යය ඉල්ලා සිටින්නේ රට බෙදන ව්‍යාපෘතියේ එක් මූලික පියවරක් වශයෙනි. එ වැනි අයකු බලය බෙදීමේ කමිටුවේ සභාපති ධුරයට පත් කිරීමේ යටි අරමුණ පැහැදිලි ය.

අගමැතිතුමා සභාපතිත්වය දරන මෙහෙයුම් කමිටුවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා කළමණාකරණ කමිටුවක් පත් කර ඇති අතර එහි සම සභාපතිවරුන් වන්නේ දෙමළ ජාතික සන්ධාන මන්ත්‍රී සුමන්දිරන් හා කලක් සමසමාජ පක්ෂයේ සිට දැන් එක්සත් ජාතික පක්ෂයේ ජාතික ලැයිස්තු මන්ත්‍රී වශයෙන් පත් ව ඇති ජයම්පති වික්‍රමරත්න යන මහතුන් ය.

කලින් සඳහන් අනුකමිටු වාර්තා 6 අතරින් මධ්‍ය-පර්යන්ත අනුකමිටුව සිය වාර්තාවේ සඳහන් කළේ ඒකීය රාජ්‍ය ව්‍යුහය පළාත් සභාවල පරිපාලනයට බාධාවක් බව ය. මේ අනුකමිටුවේ නිර්දේශ ඉලක්ක කර තිබුණේ ශ්‍රී ලංකාව ෆෙඩරල් රාජ්‍යයක් බවට පරිවර්තනය කිරීමට ය. සමගාමී ලැයිස්තුව ඉවත් කිරීම, පළාතක ආණ්ඩුකාරවරයා ගේ විධායක බලතල ඉවත් කිරීම, ආණ්ඩුකාරවරයා මහ ඇමති ගේ අභිමතය පරිදි පත් කිරීම හා කටයුතු කිරීම, ඉඩම් හා පොලිස් බලතල පළාත් සභාවලට ලබාදීම, ග්‍රාම සේවක, ප්‍රාදේශීය ලේකම් හා දිසා ලේකම් මුල් වූ රජයේ අණසක ගමට ගෙනයන යාන්ත්‍රණය ම පළාත් සභා යටතට පත් කිරීම ඇතුළු රාජ්‍යයේ ඒකීය භාවය විනාශ කරන යෝජනා සමූහයක් ඒ නිර්දේශවලට ඇතුළත් විය.

මේ අනුකමිටුවල අවංක භාවය පිළිබඳ අපට ඇත්තේ බරපතළ ගැටලුවකි. උදාහරණයක් වශයෙන් නීතිය හා සාමය පිළිබඳ අනුකමිටු වාර්තාවේ සිංහල පිටපතේ II කොටසෙහි හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කළ හැකි එක් අවස්ථාවක් ලෙස හඳුන්වන්නේ 'ශ්‍රී ලංකාවේ ඒකීය භාවයට භෞමික අඛණ්ඩතාවට හා ස්වෛරී භාවයට පහර එල්ල වන අවස්ථාවක් ය. එහෙත් එහි ඉංගිරිසි පිටපතේ ඒකීය භාවය විස්තර කිරීමට යොදා ඇති වචනය 'Unity' යන්න මිස 'Unitary' යන වචනය නො වේ. 'Unity' යනු 'එක්සත්' බව යි (ඒ වචනය යොදන්නේ රාජ්‍ය 'එකතු' වී හැදෙන ෆෙඩරල් රාජ්‍යකට ය). මෙයින් පෙනීයන්නේ සිංහල පාඨකයා නොමඟ යැවීමට අපමන වෙහෙසක් මේ ව්‍යවස්ථා සම්පාදකයන් විසින් ගනු ලබන බව යි.

මේ අනුකමිටු වාර්තාවලට මහා සංඝයා වහන්සේලා ගෙන් ද ගිහි බෞද්ධ ජනතාව ගෙන් ද, අනෙකුත් ආගම්වලට අයත් දේශප්‍රේමී කොටස්වලින් ද එල්ල වූයේ දැඩි විරෝධයකි. මේ විවේචනවලට ප්‍රතිචාර දැක්වූ රජය ප්‍රකාශ කළේ ශ්‍රී ලංකාවේ ඒකීය භාවය නැති කිරීමට හෝ බුද්ධාගමට දී ඇති ප්‍රමුඛස්ථානය අහිමි කිරීමට හෝ රජය කිසි විටෙකත් කටයුතු නොකරන බව යි.

එහෙත් දැන් ඉදිරිපත් කර ඇති මෙහෙයුම් කමිටු අතුරු වාර්තාවේ නිර්දේශ කර ඇත්තේ ද ශ්‍රී ලංකාවේ ඒකීය භාවය සම්පූර්ණයෙන් ම විනාශ කොට ෆෙඩරල් රාජ්‍යයක් ඇති කරන රාජ්‍ය ව්‍යුහයකි. ආණ්ඩුවේ ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලියට සම්බන්ධ විශේෂඥයනටත් ශ්‍රී ලංකාවේ ජනතාව ගේ පරමාධිපත්‍යයට කිසි දු ගෞරවයක් ඇති බවක් නො පෙනේ. අගවිනිසුරු, යෝජිත ව්‍යවස්ථාධිකරණයේ සභාපති, අභියාචනාධිකරණයේ සභාපතිවරයා සම්බන්ධ විනය කටයුතු පිළිබඳ සොයාබැලීමට පොදුරාජ්‍ය මණ්ඩලයේ විනිසුරුවරුනට භාර කිරීමට කරන යෝජනාව[3] මොවුන් ගේ පරජාතික මානසිකත්වයට එක් නිදසුනකි.

ජාතික ඒකාබද්ධ කමිටුව

3. ව්‍යවස්ථා කෙටුම්පත 116(3) වගන්තිය

පටුන

I වන පරිච්ඡේදය
යෝජිත නව ව්‍යවස්ථා සංශෝධන 9

II වන පරිච්ඡේදය
ඒකීය සංකල්පය පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 1 හා 2 වන පරිච්ඡේද සම්බන්ධ නිර්දේශ 13

III වන පරිච්ඡේදය
රට දෙකඩ කිරීමට විරුද්ධ ව වර්තමාන ව්‍යවස්ථාවේ තිබෙන විධිවිධාන අකර්මණ්‍ය කිරීම 16

IV වන පරිච්ඡේදය
ශ්‍රී ලංකාවේ දේශසීමාව තීරණය කිරීම ජාත්‍යන්තරයට භාරදීම 18

V වන පරිච්ඡේදය
ජනතාව ගේ පරමාධිපත්‍යය කොටස් කිරීමට දරන ප්‍රයත්නය 19

VI වන පරිච්ඡේදය
බුද්ධාගමට දී ඇති ප්‍රමුඛස්ථානය අහිමි කිරීම 23

VII වන පරිච්ඡේදය
දෙමළ ජාතික් ගීය ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම 27

VIII වන පරිච්ඡේදය
භාෂාව - සිංහල භාෂාවට සමතැන නොලැබීම 27

IX වන පරිච්ඡේදය
බලය බෙදා රට බෙදීම 28

X වන පරිච්ඡේදය
පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක බලය දුර්වල කිරීම 37

XI වන පරිච්ඡේදය
විධායකය දුර්වල කිරීම 39

XII වන පරිච්ඡේදය
ව්‍යවස්ථා අධිකරණය 43

XIII වන පරිච්ඡේදය
රාජ්‍ය ඉඩම් සම්බන්ධ බලය 45

XIV වන පරිච්ඡේදය
මැතිවරණ ක්‍රමය 47

XV වන පරිච්ඡේදය
ජාතික ආරක්ෂාවට වන බලපෑම 49

XVI වන පරිච්ඡේදය
නීතිය හා සාමය - මහ ඇමති පාලනය කරන පොලිසි නිර්මාණය කිරීම 52

XVII වන පරිච්ඡේදය
මූලික අයිතිවාසිකම් - අන්‍යාගමිකරණය, සමලිංගික ක්‍රියා නීතිගත කිරීම හා විදේශිකයන්ට පුරවැසිභාවය ලබාදීම 54

යෝජිත නව ව්‍යවස්ථා සංශෝධන

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මෙහෙයුම් කමිටු අතුරු වාර්තාවෙන් එහි අනුකමිටු වාර්තාවන්ගෙන් හා විශේෂඥයන් ගේ කෙටුම්පතින් ඉදිරිපත් කර ඇති මූලික නිර්දේශයන් ගේ සාරාංශයක් පහතින් දැක්වේ.

(1). ඒකීය රාජ්‍ය සංකල්පය ව්‍යවස්ථාවෙන් ඉවත් කිරීම හා ශ්‍රී ලංකා රාජ්‍යය 'ඔරුමිත්ත නාඩු' ලෙස හැඳින්වීම.

ව්‍යවස්ථාවේ ඉංගිරිසි පිටපතේ 2 වන වගන්තියේ 'ඒකීය රාජ්‍යය' යන්නට සමාන අරුතක් ඇති Unitary යන පදය ඉවත් කර දෙමළ භාෂාවෙන් එක්සත් (ෆෙඩරල්) යන අරුත ඇති 'ඔරුමිත්ත නාඩු' යන පදය ඉංගිරිසි පිටපතටත් සිංහල පිටපතටත් ඇතුළු කිරීමට යෝජනා කර ඇත.

(2). 'ඒකීය' පදයේ නෛතික අරුත වෙනස් කිරීම.

ඉහත සඳහන් විකල්ප යෝජනාවේ ඒකීය රාජ්‍යය යන්න සඳහන් ව තිබුණ ද ඒකීය රාජ්‍ය සංකල්පයේ සාම්ප්‍රදායික අර්ථය වෙනස් කර 'ඒකීය' යන පදයට සාවද්‍ය අර්ථනිරූපණයක් ලබාදී ඇත. ඒ අර්ථනිරූපණයට අනුව ඒකීය රාජ්‍යයක් යනු බෙදිය නොහැකි රාජ්‍යයකි. මෙය සාවද්‍ය අර්ථනිරූපණයක් පමණක් නො ව ජනතාව මුළා කිරීම සඳහා ඉදිරිපත් කර ඇති අර්ථනිරූපණයකි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 'ඒකීය රාජ්‍යය' යන පදය යොදා ඇත්තේ 'ෆෙඩරල්' රාජ්‍යයකින් වෙන් කොට හඳුනාගැනීමට මිස ශ්‍රී ලංකාව බෙදා වෙන් කළ හැකි ද, නොහැකි ද, යන්න විස්තර කිරීමට නො වේ. රාජ්‍යයක් ඒකීය වුව ද, ෆෙඩරල් වුව ද බෙදා වෙන් කළ නොහැකි ය. ඇමරිකානු ජනාධිපති දිවුරුමේ ඇමරිකාව හඳුන්වන්නේ බෙදිය නොහැකි රාජ්‍යයක් ලෙස ය. එහෙත් එය ෆෙඩරල් රාජ්‍යයකි. මේ අලුත් අර්ථනිරූපණයට අනුව බෙදා වෙන් විය නොහැකි රාජ්‍යයක් ඒකීය රාජ්‍යක් නම් බෙදා වෙන් කළ හැකි රාජ්‍යයක් ෆෙඩරල් රාජ්‍යයක් විය යුතු ය. මෙසේ අරුත් වෙනස් කිරීමෙන් රජය බලාපොරොත්තු වන්නේ ව්‍යවස්ථාවේ ශ්‍රී ලංකාව ඒකීය රාජ්‍යයක් ලෙස පිළිගෙන ඇති බව පෙන්වා එහි අර්ථය වෙනස් කර වංචනික ලෙස ශ්‍රී ලංකාව ෆෙඩරල් රාජ්‍යයක් බවට පත් කිරීමට ය. මෙය වගකීමක් ඇති රජයක් නො කළ යුතු වංචනික ක්‍රියාවක් බව අපි ප්‍රකාශ කර සිටිමු.

(3). ශ්‍රී ලංකාවේ ඒකීය භාවය විනාශ කිරීමට යෝජනා කර ඇති වෙනත් යෝජනා

ශ්‍රී ලංකාවේ ඒකීය භාවය විනාශ කිරීමට ඇති යෝජනා අතර පහත සඳහන් යෝජනා විශේෂයෙන් හඳුනාගත හැකි ය.

i. පළාත් සභාවට ඉහළින් නියෝග දීමට හැකි විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම.[4]

ii. ආණ්ඩුකාරවරයා පළාත් අමාත්‍ය මණ්ඩලයේ උපදෙස් මත ක්‍රියා කිරීම.[5]

4. විශේෂඥයන් ගේ ව්‍යවස්ථා කෙටුම්පත 18 වන වගන්තිය, මේ වගන්තියට අනුව ජනාධිපති කටයුතු කළ යුත්තේ අගමැති ගේ උපදෙස් පරිදි ය.

5. විශේෂඥ කෙටුම්පත 181 වගන්තිය, අතුරු වාර්තාව II පරිච්ඡේදය 7 වගන්තිය.

iii. සමගාමී ලැයිස්තුව[6] ඉවත් කිරීම හෝ සීමා කිරීම හා සංවෘත ලැයිස්තුවේ විෂයයන් සීමා කිරීම.

iv. ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා නීති පැනවීමට මධ්‍යම රජයට ඇති අයිතිය අහිමි කිරීම හා හැකි තාක් සීමා කිරීම.[7]

v. ඉඩම් බලතල පළාත් සභාව සතු කිරීම.[8]

vi. ජාතික සමඟිය විනාශ කොට රට ජාති, ආගම්, කුල වශයෙන් බෙදීමට මඟ සලසන ප්‍රජා සභා පිහිටුවීම.[9] ව්‍යවස්ථා සම්පාදකයන් ගෙන් අප බලාපොරොත්තු වන්නේ ශ්‍රී ලංකාවේ සිටින සැම තැනැත්තකු ම එක ධජයක් යටතේ එකමුතු කිරීම ය. ජාති, ආගම්, කුල භේද පදනම් කරගෙන ප්‍රජා සභා පිහිටුවීම ජාතියේ සංහිඳියාවට හිතකර නො වේ. මේ යෝජනා රට බෙදා වෙන් කිරීමේ මානසිකත්වයක් ඇති බෙදුම්වාදීන් ගේ ප්‍රයත්නයක් බව මොනවට පැහැදිලි ය.

vii. පළාත් සභා නීතිවල ව්‍යවස්ථානුකූල භාවය තීරණය කිරීමට නව ව්‍යවස්ථාධිකරණයක් හඳුන්වාදීම.[10]

ඉහත යෝජනා සවිස්තරාත්මක ව ඉදිරි පරිච්ඡේදවල විස්තර කෙරේ.

(4). රට බෙදීම වළකන 6 වන ව්‍යවස්ථා සංශෝධන විධිවිධාන ඇතුළත් නොකිරීම.

6 වන ව්‍යවස්ථා සංශෝධනය මඟින් හඳුන්වාදුන් රට බෙදීමට එරෙහි විධිවිධාන ඇතුළත් නො කොට, දණ්ඩනීති වගන්ති රට බෙදීමට කටයුතු කරන තැනැත්තනට එරෙහි ව කටයුතු කිරීමට නොහැකි වන්නා වූ ද, කිසි දු හරයක් නොමැති වගන්තියක් ආදේශ කිරීම.

(5). රට බෙදීමට එරෙහි ව මහජන නියෝජිතයන් හා රජයේ සේවකයන් විසින් ගත යුතු විශේෂ දිවුරුම ව්‍යවස්ථාවට ඇතුළත් නොකිරීම.

(6). බුද්ධාගමට ඇති ප්‍රමුඛස්ථානය අහිමි කිරීම.[11]

බුද්ධාගමට ප්‍රමුඛස්ථානය ලබාදීම පිළිබඳ වර්තමාන ආණ්ඩුව ව්‍යවස්ථාවේ 9 වන වගන්තිය වෙනස් කිරීම සඳහා යෝජනාවක් ඇතුළත් කර ඇත. අනෙකුත් ආගම් ද 'වෙන් කොට සැලකීමකින් තොර ව' (ඉංගිරිසියෙන්; Without Discrimination) යන වචන 9 වන වගන්තියට ඇතුළත් කිරීමට යෝජනා කර ඇත. බුද්ධාගමට ප්‍රමුඛස්ථානය ලබාදිය යුතු බවට සඳහන් 9 වන වගන්තියෙන් බුද්ධාගමට ලබාදී ඇති ප්‍රමුඛස්ථානය අහිමි කිරීමට යොදන ලද කපටි උපායක් බව පෙනේ.

මේ විකල්ප යෝජනාවට විරුද්ධ බව ශ්‍රී.ල.නි.ප. ඒකාබද්ධ විපක්ෂය හා ජාතික හෙළ උරුමය ප්‍රකාශ කර ඇති අතර ජ.වි.පෙ. ඒ පිළිබඳ අදහසක් ප්‍රකාශ කර නැත්තේ ඒ විකල්ප යෝජනාවට ඔවුන් එකඟ නිසා විය යුතු ය.

---

6. අතුරු කමිටු වාර්තාවෙන් සමගාමී ලැයිස්තුව ඉවත් කිරීමට යෝජනා කර තිබුණ ද, විශේෂඥ වාර්තාවේ 73, 74 හා 183 වගන්තිවල සමගාමී ලැයිස්තු පිළිබඳ සඳහනක් ඇත (එහෙත් කිසිදු ලැයිස්තුවක් කෙටුම්පතට එකතු කර නැත. ඒ අනුව සමගාමී ලැයිස්තුවේ ඇති වැදගත් විෂයයන් ඉන් ඉවත් කිරීමට ඉදිරියේ දී කටයුතු කිරීමට ඉඩ තිබේ).
7. අතුරු වාර්තා II පරිච්ඡේදය 5.2.
8. විශේෂ කෙටුම්පත 243 වගන්තිය.
9. අතුරු වාර්තාව II පරිච්ඡේදය, 5 වන පිට.
10. XIV පරිච්ඡේදය බලන්න.
11. VI පරිච්ඡේදය බලන්න.

දෙමළ ජාතික සන්ධානය යෝජනා කරන්නේ ශ්‍රී ලංකාව අනාගමික රාජ්‍යයක් විය යුතු බව යි.

(7). ව්‍යවස්ථාවේ පූර්විකාවේ ශ්‍රී බුද්ධ වර්ෂය පිළිබඳ සඳහන ඉවත් කිරීමට කටයුතු කිරීම (විශේෂ පදයක් පිළියෙළ කළ කෙටුම්පතෙහි සඳහන් වන අන්දමට).

(8). දෙමළ ජාතික ගීතයක් ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම.[12]

දෙමළ ජාතික ගීයක් ව්‍යවස්ථාවට ඇතුළත් කිරීමට අතුරු ව්‍යවස්ථා මෙන් ම ව්‍යවස්ථා කෙටුම්පතක් ද යෝජනා වී ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවේ ජාතික ගීතය සිංහල 'ශ්‍රී ලංකා මාතා' පමණක් නො ව දෙමළ 'ශ්‍රී ලංකා තායේ' ද වනු ඇත.

(9). උතුරු හා නැගෙනහිර පළාත් ඒකාබද්ධ කිරීම.

ඉදිරිපත් කර ඇති යෝජනා අතර උතුරු හා නැගෙනහිර පළාත් ඒකාබද්ධ කොට තනි පළාතක් සකස් කිරීමට ඉඩ සලසන යෝජනා ඉදිරිපත් කර ඇත.[13] එසේ ඒකාබද්ධ කිරීමේ දී උතුරු නැගෙනහිර පළාත්වල ජනතාව ගේ එකගත්වය පමණක් ලබාගැනීමට වූ මේ යෝජනාව බෙදුම්වාදීන් ගේ දෙමළ නිජභූමි සංකල්පය නීතිගත කිරීමට ගත් පියවරකි.

(10). ජනතාව ගේ පරමාධිපත්‍යය බෙදා වෙන් කොට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විධිවිධාන එකතු කිරීම.

(11). ශ්‍රී ලංකාවේ දේශ සීමාව නිර්ණය කිරීමට ජාත්‍යන්තර ප්‍රජාවට ඉඩ සැලසෙන පරිදි වර්තමාන ව්‍යවස්ථාවේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

(12). පළාත් සභාවක නීතියක් අහෝසි කිරීමට හෝ සංශෝධනය කිරීමට හෝ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ ඇතුළත් ව ඇති සීමාවන් තවත් දැඩි කිරීම.

වර්තමාන ව්‍යවස්ථාව යටතේ පළාත් සභා නීතියක් අහෝසි කිරීමට හෝ සංශෝධනය කිරීමට හෝ 2/3ක බලයක් පමණක් අවශ්‍ය නමුත් වර්තමාන යෝජනා යටතේ ජනමත විචාරණයක දී ජනතාව ගේ අනුමතිය ලබා ගැනීමට ද යෝජිත දෙවන මන්ත්‍රණ සභාවේ අනුමතිය ලබාගැනීමට ද නිර්දේශ ඉදිරිපත් වී ඇත.

(13). පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක බලය දුර්වල කිරීම සඳහා ව්‍යවස්ථාදායක බලතල සහිත දෙ වන මන්ත්‍රණ සභාවක් හඳුන්වාදීම මගින් රාජ්‍ය බලය දුර්වල කිරීමට කටයුතු කිරීම.

(14). ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා සන්නද්ධ කැරැල්ලක් අත්‍යාසන්න අවස්ථාවක දී පළාත් සභාවක් සතු බලතල ක්‍රියාත්මක කිරීමට ජනාධිපති සතු බලය සීමා කිරීමට යෝජනා කිරීම.

---

12. විශේෂඥ වාර්තාව, 6 වන වගන්තිය.

13. ව්‍යවස්ථා කෙටුම්පත 176 (3) වගන්තිය හා අතුරු වාර්තාවේ II පරිච්ඡේදයේ 2 වන ඡේදය.

(15). පළාත් ආණ්ඩුවලට පොලිස් බලතල ලබාදීම.

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පොලිස් බලතල පළාත් සභාවලට ලබාදුන්න ද පුරා 30 වසරක් තුළ කිසි දු ජනාධිපතිවරයකු ඒ බලතල ක්‍රියාත්මක කිරීමට ඉඩ ලබා නොදුන්නේ එහි ඇති භයානක බව අවබෝධ කරගැනීමෙනි. එහෙත් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමත් සමඟ ම මේ නව නිර්දේශවලින් යෝජනා කෙරෙන පොලිස් බලතල ක්‍රියාත්මක කිරීම වැළැක්විය නොහැකි වනු ඇත.

(16). විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම.

විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමෙන් බලාපොරොත්තු වන්නේ පළාත් සභාවල අමාත්‍ය මණ්ඩලවලට තමාට රිසි පරිදි කටයුතු කිරීමට ඉඩ ප්‍රස්තාව ලබාදීම වේ.

(17). අන්‍යාගමිකකරණයට මඟ පෑදීම.

ආගම ප්‍රචාරය කිරීමට (Propogation) ඉඩ සලසන පරිදි මූලික අයිතිවාසිකම් පිළිබඳ විධිවිධාන සංශෝධන කිරීම මඟින් අන්‍යාගමිකකරණයට ඉඩ සලසා ඇත. එ සේ ම මේ අයිතිවාසිකම පුරවැසියනට පමණක් නො ව සියලු ම තැනැත්තනට විවෘත කිරීම හරහා බුදධ ශාසනය ආරක්ෂා කොට පෝෂණය කිරීමට සහතික වී ඇති 9 වන වගන්තිය අකර්මණ්‍ය කිරීමට කටයුතු කරමින් සිටී.

(18). සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීමට පුරවැසියනට පමණක් නො ව සියලු තැනැත්තන් හට ඉඩ දීම.

වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සංස්කෘතිය ප්‍රවර්ධනය කළ හැක්කේ පුරවැසියනට පමණි. එහෙත් මේ අයිතිවාසිකම සියලු තැනැත්තන් හට විවෘත කිරීම මඟින් ශ්‍රී ලංකාවට නුසුදුසු පර සංස්කෘතීන් ප්‍රවර්ධනයට ඉඩ සලසා ඇත.

(19). පළාත් සභා නීතිවල ව්‍යවස්ථානුකූල භාවය තීරණය කිරීමට නව ව්‍යවස්ථාධිකරණයක් හඳුන්වාදීම.[14]

14. XIV පරිච්ඡේදය බලන්න.

ඒකීය සංකල්පය පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 1 හා 2 වගන්ති සම්බන්ධ නිර්දේශ

(අ). ඒකීය සංකල්පය පිළිබඳ ව්‍යවස්ථාවේ 1 වන හා 2 වන වගන්ති වෙනස් කිරීම හා ශ්‍රී ලංකාව 'ඔරුමිත්ත නාඩුවක්' ලෙස හැඳින්වීමට කර ඇති නිර්දේශ.

1972 සිට ශ්‍රී ලංකාවේ ඒකීය භාවය තහවුරු කරන පැහැදිලි විධිවිධානයක් ව්‍යවස්ථාවට ඇතුළත් කර තිබිණි. 1978 දී දෙ වන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත කිරීමේ දී පවා කිසි දු වෙනස්කමක් නො කර ඒ විධිවිධාන එ ලෙස ම ව්‍යවස්ථාවට ඇතුළත් කරනු ලැබිණි. මේ වන විට පුරා අවුරුදු 45කට අධික කාලයක් ඒකීය රාජ්‍යය තහවුරු කරන මේ විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පවතී.

පළමු වන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ද දෙ වන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ද ඒ ව්‍යවස්ථාවල දෙ වන වගන්තියේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යුහය විස්තර කරනු ලැබූයේ *'ශ්‍රී ලංකා ජනරජය ඒකීය රාජ්‍යකි'* යනුවෙනි. ව්‍යවස්ථාවේ ඉංගිරිසි පිටපතේ එය විස්තර වන්නේ '*Republic of Sri Lanka is a Unitary state*' ලෙස ය.

මේ නව යෝජනාවලියෙන් යෝජනා කර ඇත්තේ ව්‍යවස්ථාවේ ඉංගිරිසි පිටපතේ ඇති *'Unitary state'* යන පදය ඉවත් කොට *'ඒකීය රාජ්‍ය / ඔරුමිත්ත නාඩු'* යන සිංහල හා දෙමළ වචන ඉංගිරිසි පිටපතට ඇතුළත් කිරීමට ය.

ව්‍යවස්ථාවේ ඉංගිරිසි පිටපතේ 1 හා 2 වන වගන්ති වෙනුවට ඇතුළත් කිරීමට යෝජනා කර ඇති විධිවිධාන මෙ සේ යඃ

> *"Sri Lanka (Ceylon) is a free, sovereign and independent Republic which is an **aekiya rajya/orumiththa nadu**, consisting of the institution of the centre and of the provinces which shall exercise power as laid down in the constitution.*
>
> *"In this Article **aekiya rajya/orumiththa nadu** means a state which is undivided and indivisible, and in which the power to amend the Constitution, or to repeal and replace the constitution, shall remain with the Parliament and the People of Sri Lanka as provided in this Constitution."*

වර්තමාන ව්‍යවස්ථාවේ සිංහල පිටපතේ 1 හා 2 වන වගන්ති වෙනුවට අතුරු වාර්තාව යෝජනා කරන අලුත් වගන්තිය මෙ සේ යඃ

> *"ශ්‍රී ලංකාව නිදහස්, ස්වෛරී සහ ස්වාධීන ජනරජයක් වනු ඇති අතර, ව්‍යවස්ථාවෙන් නියම කර ඇති බලතල ක්‍රියාත්මක කරන මධ්‍යම හා පළාත්බද ආයතන වලින් සමන්විත වන ඒකීය රාජ්‍යයක්/ඔරුමිත්ත නාඩු වනු ඇත.*
>
> *"මේ ව්‍යවස්තාවෙහි **ඒකීය රජ්‍යය/ඔරුමිත්ත නාඩු** යන්නෙන් අදහස් වන්නේ නොබෙදූ සහ බෙදිය නොහැකි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඕනෑ ම සංශෝධනයක් සඳහා හෝ එය පරිච්ඡින්න කොට ඒ වෙනුවට වෙනත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැනවීම සඳහා වන බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ*

දක්වා ඇති ආකාරයට පාර්ලිමේන්තුවට සහ (අදාළ වන තැන්හි) ශ්‍රී ලංකාවේ ජනතාව වෙත පවතිනු ඇති රාජ්‍යයක් වනු ඇත."

වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ශ්‍රී ලංකාවේ ඒකීය භාවය පිළිබඳ සඳහන් 2 වන වගන්ති ඉවත් කොට ඉහත යෝජනාව ඔවුන් ඉදිරිපත් කරන්නේ පහත සඳහන් පැහැදිලි කිරීම කරමිනි.

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය ස්ථාපිත කිරීම සඳහා වූ යෝජනා සම්මතය පිළිබඳ ව අදහස් දක්වමින් ජනාධිපතිතුමා සඳහන් කර ඇත්තේ දකුණේ ජනතාව 'ෆෙඩරල්' (Federal) නමැති වචනයට බියක් දක්වන්නා සේ ම උතුරේ ජනතාව 'ඒකීය' යන වචනයට බියක් දක්වන බවකි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යනු ජනතාව බියක් දක්වන ලේඛනයක් නො වේ.

*"'යුනිටරි ස්ටේට්' (Unitary State) යන ඉංගිරිසි පදයේ සාම්ප්‍රදායික නිර්වචනය වෙනස්කම්වලට භාජනය වී තිබේ. උතුරු අයර්ලන්තයට සහ ස්කොට්ලන්තයට එක්සත් රාජධානියෙන් වෙන් ව යා හැකි තත්ත්වයක් වර්තමානය වන විට එක්සත් රාජධානියේ පවතී. ඒ නිසා **'යුනිටරි ස්ටේට්' (Unitary State) යන ඉංගිරිසි පදය ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් භාවිතයට සුදුසු නො වේ.**"*

මෙහෙයුම් කමිටුව සිය අතුරු වාර්තාවෙන් ප්‍රකාශ කරන්නේ 'Unitary State' යන ඉංගිරිසි පදයේ සාම්ප්‍රදායික නිර්වචනය එක්සත් රාජධානියේ වෙනස් වී ඇති බවත්, ඒ නිසා 'Unitary' යන ඉංග්‍රීසි වචනය ශ්‍රී ලංකාවට ම නුසුදුසු බව යි. 'Unitary' යන පදයත් 'Federal' යන පදයත් ආණ්ඩුක්‍රම නීතියේ පැහැදිලි ව හඳුනාගත් නිශ්චිත අර්ථනිරූපණයක් ඇති තාක්ෂණික පද දෙකකි. එහි අරුත යම් රටක සිදු වන දේශපාලන වෙනස්කම් මත වෙනස් නො වේ. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඉංගිරිසි පිටපතේ 'ඒකීය' වචනයට සමාන 'Unitary' වචනය ඉවත් කර ඉංගිරිසි පිටපතේ සිංහල හා දෙමළ පද (**ඒකීය රාජ්‍ය / ඔරුමිත්ත නාඩු**) ඇතුළත් කිරීම විහිළුවකි. මෙය සමස්ත ශ්‍රී ලංකා ජනතාව මුළා කිරීමට ගත් නිර්ලජ්ජී උත්සාහයක් බව පෙනේ. මෙහෙයුම් කමිටුව කෙරෙහි ඇති ජනතා විශ්වාසය ගිලිහී ඇත්තේ මෙ වැනි ක්‍රියාවන් නිසා ය.

එ සේ ම අතුරු වාර්තාව මෙ සේ ද ප්‍රකාශ කරයිඃ

"'ඒකීය රාජ්‍යය' නැමැති සිංහල පදයේ නොබෙදුණු සහ බෙදිය නොහැකි රටක් යන්න මනා ව විස්තර වේ. මේ හා සමාන දෙමළ පදය වන්නේ 'ඔරුමිත්ත නාඩු' යන්න යි."

මෙය සම්පූර්ණ අසත්‍යයකි. විද්වත් වංචාවකි. වර්තමාන ආණ්ඩුව ව්‍යවස්ථාවේ දමිළ පිටපතේ 'ඒකීය' වචනය වෙනුවට යොදා ඇත්තේ 'ඔට්ට්‍රි ආච්චි' යන වචනය මිස 'ඔරුමිත්ත නාඩු' වචනය නො වේ.

රජයේ නව ව්‍යවස්ථා යෝජනාවල ඒ 'ඔට්ට්‍රියාච්චි' යන පදය යොදා නොගෙන 'ඔරුමිත්ත නාඩු' යන වචනය ඊට ආදේශ කර ඇත්තේ 'ඔරුමිත්ත නාඩු' යන වචනයේ අරුත 'එක්සත්' (ෆෙඩරල්) වීම නිසා ය. 'ඒකීය' අරුත ඇති දැනට භාවිත කරන 'ඔට්ට්‍රියාච්චි' යන පදය යොදානොගන්නේ මේ නිසා ය.

අනෙකුත් පනත් මෙන් නො ව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් දෙමළ පිටපත් අභිභවා සිංහල පිටපත බලාත්මක වන බව ව්‍යවස්ථාවේ සඳහන් නො වේ. එ බැවින් අනාගතයේ දී කුමන පදයක් බලාත්මක වේ ද යන්න අවිනිශ්චිත ය.

මෙහෙයුම් කමිටු අතුරු වාර්තාව විවිධ දේශපාලන පක්ෂ විසින් ඉදිරිපත් කළ යෝජනා එහි ඇමුණුම් වශයෙන් ඇතුළත් කොට ඇත. එක්සත් ජාතික පක්ෂයේ නමින් කිසි දු යෝජනාවක් ඇමුණුම්වලට ඇතුළත් නොවන්නේ අතුරු

වාර්තාව එක්සත් ජාතික පක්ෂයේ ද සහයෝගයෙන් ඉදිරිපත් කර ඇති නිසා ඒවා ඒ පක්ෂයේ නිර්දේශයන් නිසා විය යුතු ය. මේ අනුව ලංකාව ඔරුමිත්ත නාඩුවක් ලෙස හඳුන්වාදීම පිළිබඳ ඔවුන් ගේ එකඟතාවක් ඇති බව පෙනේ.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ද, ඒකාබද්ධ විපක්ෂය ද, හෙළ උරුමය ද සඳහන් කරන්නේ ශ්‍රී ලංකා ජනරජය ඒකීය රාජ්‍යයක් බවට සඳහන් වන 2 වන වගන්තිය ඒ ආකාරයෙන් ම ඇතුළත් විය යුතු බව යි.

ජනතා විමුක්ති පෙරමුණ ඒකීය රාජ්‍යය පිළිබඳ ව අතුරු වාර්තාවේ සඳහන් නව අර්ථනිරූපණය පිළිබඳ කිසි දු අදහසක් ඉදිරිපත් කොට නොමැත්තේ ඔවුනට ඒ නිර්දේශය පිළිබඳ වියවුලක් නොමැති නිසා ද යන්න සැක සහිත ය.

දෙමළ ජාතික සන්ධානය ශ්‍රී ලංකාව සඳහා යෝජනා කරන්නේ ෆෙඩරල් රාජ්‍යයකි.

(ආ). ව්‍යවස්ථාවේ 'ඒකීය' පදයට සාවද්‍ය නව අර්ථ නිරූපණයක් ලබාදීම.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මෙහෙයුම් කමිටු වාර්ථාවේ සිංහල පිටපතේ 'ඒකීය රාජ්‍යය' යන පදයට නව අර්ථ නිරූපණයක් ලබාදී ඇත. ඒ අර්ථ නිරූපණයට අනුව ඒකීය රාජ්‍යයක් යනු නො බෙදිය හැකි රාජ්‍යයකි. එ සේ නම් ෆෙඩරල් රාජ්‍යක් අත්‍යවශ්‍යයෙන් ම බෙදිය හැකි රාජ්‍යයක් විය යුතු ය. ඇත්ත වශයෙන් ම ෆෙඩරල් රාජ්‍යයක් වුව ද බෙදා වෙන් කළ හැකි රාජ්‍යයක් නො වේ. යම් රාජ්‍යයක් බෙදිය නොහැකි වූ පමණින් එය ඒකීය රාජ්‍යයක් වන්නේ ද නැත. ඉන්දියාව ෆෙඩරල් රාජ්‍යයකි. එහෙත් එය බෙදිය නොහැකි ය. ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයා දිය යුතු දිවුරුමහි ඇමරිකාව විස්තර කරන්නේ, 'දෙවි කෙනකු අදහන නො බෙදිය හැකි එක රාජ්‍යයක්' ලෙසිනි.

ඒකීය යන පදයට නව අරුතක් එක් කරමින් එහි අදහස බෙදිය නොහැකි රාජ්‍යයක් ලෙස පැවසීම හුදෙක් '*Unitary*' යන ඉංගිරිසි පදයේ සාම්ප්‍රදායික අරුත බැහැර කිරීමට දරා ඇති වංචනික ප්‍රයත්නයකි.

ව්‍යවස්ථා නීතිය පිළිබඳ සිංහලෙන් ලියැවී ඇති පතපොත ඉතා විරල ය. මේ නිසා 'ඒකීය රාජ්‍යය' යන පදයෙහි අරුත පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට ව්‍යවස්ථා නීතියේ ඉංගිරිසි පතපොත ආධාර කරගැනීම අවශ්‍ය වේ. ඉංගිරිසි භාෂාවෙන් '*Unitary*' යන ඉංගිරිසි පදයෙහි අරුත ඉංගිරිසියෙන් ලියැවී ඇති ග්‍රන්ථවල මනා ලෙස විස්තර කරදී ඇත. මෙහි අරුත අප ගේ ශ්‍රේෂ්ඨාධිකරණය පවා 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ තීරණය ලබාදෙමින් සිය තීන්දුවේ විස්තර කරනු ලැබුයේ ඉංගිරිසි බසිනි. '*Unitary State*' යන වචන ව්‍යවස්ථාවේ ඉංගිරිසි පිටපතෙන් ඉවත් කර ඇත්තේ 'ඒකීය රාජ්‍යය' (*Unitary State*) යන පදයට ඇති අන්තර්ජාතික ලෙස පිළිගැනෙන සාම්ප්‍රදායික නිශ්චිත අර්ථයෙන් බැහැර ව නව සාවද්‍ය අරුතක් ලබාදීම සඳහා ය.

මේ සංශෝධනවල සමස්ත ප්‍රතිඵලය වනුයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේ දී ශ්‍රී ලංකාව ෆෙඩරල් (සන්ධීය) රාජ්‍යයක් ලෙස අර්ථ නිරූපණය වීම යි. මෙ සේ ව්‍යවස්ථාවේ ඇති පද අරුත් වෙනස් කිරීම වංචනික ව කර තිබෙනවා පමණක් නො ව සිංහල ජනයා නොමඟ යැවීමට උපයෝගී කර ඇති නීච උපක්‍රමයක් බව කිව යුතු ය.

මෙ වැනි අදූරදර්ශී යෝජනා සිංහල ජනතාව ගේ බුද්ධියට කරන ලද නිගාවක් බව කනගාටුවෙන් වුව ද පැවසිය යුතු යි. විවිධ විදේශීය බලවේගවල වුවමනාවනට අනුව යෝජිත ව්‍යවස්ථාවේ නිවැරැදි ස්වභාවය සඟවා ජනතාව මුළා කිරීමට දරන උත්සාහය අප හෙළාදැකිය යුතු ය.

රට දෙකඩ කිරීමට විරුද්ධ ව වර්තමාන ව්‍යවස්ථාවේ තිබෙන විධිවිධාන අකර්මණ්‍ය කිරීම

(අ). වර්තමාන ව්‍යවස්ථාවේ තිබෙන විධිවිධාන.

වර්තමාන ආණ්ඩුව ව්‍යවස්ථාවට ගෙන එනු ලැබූ 6 වන ව්‍යවස්ථා සංශෝධනයේ රට බෙදීමට විරුද්ධ විධිවිධාන ගණනාවක් ඇතුළත් විය. ඉන් ප්‍රධාන තැනක් ගන්නේ 157 අ (1), (2) හා (3) වගන්ති යි. එය පහත සඳහන් කරමු:

"157අ. (1) ශ්‍රී ලංකාවේ දේශය තුළ වෙන ම රජයක් පිහිටුවීම, කෙළින් ම හෝ අන්‍යාකාරයකින් හෝ, ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් පිටත දී හෝ ආධාර කිරීම, අනුබල දීම, අනුග්‍රහය දැක්වීම, මුදල් යෙදවීම, ධෛර්යය දීම හෝ දේශනා කිරීම හෝ කිසි දු තැනැත්තකු විසින් නො කළ යුතු ය.

(2) ශ්‍රී ලංකාවේ දේශය තුළ වෙන ම රජයක් පිහිටුවීම තම අරමුණුවලින් නැත හොත් පරමාර්ථවලින් එකක් ලෙස කිසි දු දේශපාලන පක්ෂයක් හෝ වෙනත් සංගමයක් හෝ සංවිධානයක් හෝ විසින් නොපිළිගනු ලැබිය යුතු ය.

(3) (1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන කඩ කරමින් ක්‍රියා කරන කවර වුව ද තැනැත්තකු, අධිචෝදනාවක් මත සහ නීතියෙන් නියම කර ඇති කාර්යපටිපාටියට අනුකූල ව පවත්වනු ලබන නඩු විභාගයකින් පසු ව අභියාචනාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට,

(අ) ඒ අධිකරණය විසින් තීරණය කරනු ලබන අවුරුදු හතක් නොඉක්මවන කාලයක් සඳහා ප්‍රජා අශක්නුතාවට ඔහු යටත් වන්නේ ය.

(ආ) ඔහු ගේ සහ ඔහු ගේ පවුලේ අය ගේ ජීවිකා වෘත්තිය පවත්වාගෙනයාම පිණිස අවශ්‍ය ය යි ඒ අධිකරණයේ ආඥාවක් මඟින් තීරණය කරනු ලබන දේපළ හැර, ඔහු ගේ චංචල සහ නිශ්චල දේපළ රාජසන්තක වන්නේ ය.

(ඇ) ඒ අධිකරණය විසින් තීරණය කරනු ලබන අවුරුදු හතක් නොඉක්මවන කාලයක් සඳහා ප්‍රජා අයිතිවාසිකම්වලට හිමිකම් ඔහුට නොලැබෙන්නේ ය; තව ද

(ඈ) ඔහු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වේ නම් හෝ 165 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ සඳහන් සේවාවකට අයත් වන හෝ ධුරයක් දරන හෝ තැනැත්තෙක් වේ නම්, ඔහු මන්ත්‍රීවරයකු වීම හෝ එකී සේවයේ සිටීම හෝ එකී ධුරය දැරීම හෝ අවසන් වන්නේ ය."

ඉහත වගන්තියේ ඇති වැදගත්කම වන්නේ රට බෙදීම සඳහා දේශනා කරන ආධාර දෙන, මුදල් යොදවන තැනැත්තනට එරෙහි ව නඩු විභාගයකින් පසු වැරැදිකරුවකු කොට දඬුවම් දීමට හැකි වීම ය. මේ නිසා ඉහත 157අ වගන්තිය තව දුරටත් ව්‍යවස්ථාවේ පවත්වාගත යුතු ය.

(ආ). රට බෙදීමට විරුද්ධ විධිවිධාන සලසා ඇති බවට අතුරු කමිටු වාර්තාවේ ඇති යෝජනාවල ව්‍යාජ ස්වභාවය

මෙහෙයුම් කමිටුවේ අතුරු වාර්තා නිර්දේශ මඟින් ද විශේෂඥ කමිටුවේ ව්‍යවස්ථා කෙටුම්පතින් ද විකල්ප වගන්තියක් යෝජනා කර ඇත. ඒ විකල්ප

වගන්තිය, වර්තමාන ව්‍යවස්ථාවට 6 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් හඳුන්වාදුන් ප්‍රබල වගන්තිය වෙනුවට ගෙන එනු ලබන දුර්වල විධිවිධානයක් බව පැහැදිලි යි. එ කී විකල්ප යෝජනාව මෙ සේ ය;

> *"ශ්‍රී ලංකාවේ භූමි ප්‍රදේශයෙන් කිසි ම කොටසක් වෙන ම රාජ්‍යයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට හෝ එයට පක්ෂව කථා කිරීමට හෝ ශ්‍රී ලංකාවේ පළාතක් හෝ එයින් කොටසක් හෝ වෙන් කිරීමට හෝ* ***කිසි ම පළාත් සභාවක් හෝ වෙනත් අධිකාරියක් හෝ*** *කටයුතු නො කළ යුතු ය."*[15]

අතුරු වාර්තාවෙන් ද, විශේෂඥයන් ගේ ව්‍යවස්ථා කෙටුම්පතින් ද යෝජනා කර ඇති ඉහත වගන්තිය හා වර්තමාන ව්‍යවස්ථාවේ 6 වන සංශෝධනයේ දැක්වෙන පෙර කී 157 අ වගන්තිය අතර පැහැදිලි වෙනසක් තිබේ. එ නම් 157 අ වගන්තියට අනුව රට බෙදීමට කටයුතු කිරීමට කිසි ම '**තැනැත්තකුට**' නොහැකි ය. එහෙත් යෝජිත නව වගන්තියේ ඒ තහනම ඇත්තේ **පළාත් සභාවකට හෝ වෙනත් අධිකාරියකට හෝ පමණි.** ඒ අනුව පළාත් සභාවකට බෙදුම්වාදය ප්‍රවර්ධනය කිරීම කළ නොහැකි නමුත් එහි සාමාජිකයකුට හෝ වර්ගවාදී දේශපාලකයකුට හෝ එ සේ කටයුතු කිරීමට හැකි වනු ඇත.

ඉහත යෝජිත වගන්තියේ විශේෂ ලක්ෂණය වන්නේ 6 වන සංශෝධනයෙන් ව්‍යවස්ථාවට ඇතුළත් කළ 157 අ වගන්තියේ සඳහන් කිසි දු දණ්ඩනීය විධිවිධානයක් එයට ඇතුළත් නොවීම යි.

මෙයින් පැහැදිලි වන්නේ වර්තමාන ව්‍යවස්ථාවට ගෙන එනු ලැබූ 6 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් හඳුන්වාදුන් විධිවිධාන අතහැරදැමීමට රජය කටයුතු කරනු ඇති බව යි.

රට බෙදීමට එරෙහි ව අවශ්‍ය විධිවිධාන ඇතුළත් කර ඇති බවට රජය පුනපුනා ප්‍රකාශ කළත් සත්‍යය නම් 6 වන සංශෝධනයෙහි ඇති දණ්ඩනීය වගන්ති අලුත් ව්‍යවස්ථාවට ඇතුළත් නොකිරීම හරහා, බෙදුම්වාදීනට තම අරමුණු ඉටු කරගැනීමට මඟ පාදා තිබීම යි.

(ඇ). රට බෙදීමට එරෙහි දිවුරුම ව්‍යවස්ථාවෙන් ඉවත් කිරීම.

වර්තමාන අණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පර්ලිමේන්තු මන්ත්‍රීවරුන් මෙන් ම රාජ්‍ය නිලධාරීන්, අධිකරණ නිලධාරීන් හා සංස්ථා නිලධාරීන් 6 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ හඳුන්වාදුන් රට බෙදීමට උදවු නොකරන බවට පොරොන්දු වන ප්‍රතිඥාවක්/දිවුරුමක් ගත යුතු ව තිබේ. එහෙත් ඒ වගන්තිය මේ යෝජිත නව ව්‍යවස්ථාවෙන් ඉවත් කිරීමට කටයුතු කර ඇති බව පෙනේ.[16]

නව ව්‍යවස්ථාවෙන් දෙ වන මන්ත්‍රණ සභාවක් හඳුන්වාදෙන නමුත් රට බෙදීමට එරෙහි දිවුරුම ගැනීමේ අවශ්‍යතාවක් එහි සාමාජිකයනට නැති බව සඳහන් කළ යුතු ව ඇත.

---

15. අතුරු වාර්තාවේ 5 වන වගන්තිය හා විශේෂඥ කමිටුවේ ව්‍යවස්ථා කෙටුම්පතේ 4 වන වගන්තිය.
16. බලන්න විශේෂඥයන් ගේ ව්‍යවස්ථා කෙටුම්පතේ 37 හා 52 වගන්ති.

ශ්‍රී ලංකාවේ දේශසීමාව තීරණය කිරීමට ජාත්‍යන්තරයට භාර දීම

වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ශ්‍රී ලංකා ජනරජයේ දේශසීමාවන් එහි 5 වන වගන්තියේ විස්තර වන්නේ මෙ සේ යිඃ

> *"5. ශ්‍රී ලංකා ජනරජයට අයත් දේශය පරිපාලන දිස්ත්‍රික්ක [විසිපහෙන්] ද ජනරජයේ දේශීය ජල තීරයෙන් ද සමන්විත වන්නේ ය. පරිපාලන දිස්ත්‍රික්ක [විසිපහෙහි] නම් පළමු වැනි උපලේඛනයෙහි දැක්වෙන්නේ ය.*
>
> *එ සේ වුව ද, පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මගින් තීරණය කරනු ලබන පරිදි ඒ පරිපාලන දිස්ත්‍රික්ක, ඒවාට වෙනස් වූ පරිපාලන දිස්ත්‍රික්ක සංයුක්ත වන පරිදි, නැවත බෙදීම හෝ ඒකාබද්ධ කිරීම හෝ කරනු ලැබිය හැක්කේ ය."*

මෙහෙයුම් කමිටුව සිය වාර්තාවේ එහි 5 වන වගන්තිය සංශෝධනය කිරීමට යොජනා කර අත්තේ මෙ සේ යඃ

> *"ශ්‍රී ලංකාවේ දේශසීමාව **ජාත්‍යන්තර නීතිය යටතේ පිළිගෙන ඇති භූගෝලීය භූමි ප්‍රදේශයෙන්** සමන්විත වන අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ උපලේඛනයේ දක්වා ඇති පළාත් හා එහි දේශීය මුහුදු සීමාවන් සහ ගුවන් අවකාශ ද, අනාගතයේ අත්පත් කරගන්නා වූ අතිරේක භූමි ප්‍රදේශ ද ඇතුළු වන්නේ ය. ශ්‍රී ලංකාවේ භූමි ප්‍රදේශයට අදාළ ව නීති, චාරිත්‍ර හා භාවිත මගින් පිළිගෙන ඇති සියලු ම අයිතිවාසිකම් ශ්‍රී ලංකාවට හිමි වේ.*
>
> *"ශ්‍රී ලංකාවේ භූමි ප්‍රදේශයෙන් කිසි ම කොටසක් වෙන ම රාජ්‍යයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට හෝ එයට පක්ෂ ව කතා කිරීමට හෝ ශ්‍රී ලංකාවේ පළාතක් හෝ එයින් කොටසක් හෝ වෙන් කිරීමට හෝ කිසි පළාත් සභාවක් හෝ වෙනත් අධිකාරියක් හෝ කටයුතු නො කළ යුතු ය."*

ඉහත වගන්තියට අනුව ශ්‍රී ලංකාවේ දේශසීමාව තීරණය කරනුයේ ජාත්‍යන්තර නීතිය යි. සැම රාජ්‍යයක් ම තම දේශසීමා තීරණය කිරීමේ අයිතිය තමන් වෙත රඳවා ගනී. ඉන්දීය ව්‍යවස්ථාවේ වුව ද ඒ අයිතිය ජාත්‍යන්තරයට පාවා දී නැත. ජාත්‍යන්තර නීතිය යන්නට ජාත්‍යන්තර සම්මුති පමණක් නො ව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තීරණ මෙන් ම ජාත්‍යන්තරය පිළිගත් සිරිත් පවා ඇතුළත් වේ. රටක් වටා ඇති සමුද්‍ර තීරය ජාත්‍යන්තර නීතිය යටතේ පිළිගනු ලැබුව ද, රාජ්‍යයක දේශසීමා සැම විට ම තීරණය කරනුයේ ඒ රාජ්‍යය විසිනි. මේ සංශෝධනය යෝජනා කර ඇත්තේ බෙදුම්වාදීන් ගේ අවශ්‍යතාවන් ඉටු කිරීමට බව මොනවට පැහැදිලි ය.

මේ පිළිබඳ ව අප ගේ විරෝධතාව හමුවේ විශේෂඥ කමිටුවෙන් ඉදිරිපත් කර ඇති ව්‍යවස්ථා කෙටුම්පතේ "ජාත්‍යන්තර නීතිය" යන පදය ඉවත් කර ඇති බව පෙනේ. එහෙත් ඒ පදය නැවැත කාරක සභා අවස්ථාවේ දී රිංගවීමට ඇති ඉඩකඩ නිසා අපි මෙහි දී එහි බරපතළකම පෙන්වාදීමට කැමැත්තෙමු.

ජනතාව ගේ පරමාධිපත්‍යය කොටස් කිරීමට දරන ප්‍රයත්නය

(1). 1, 2, 3, 5, 6, 7, 8 හා 9 වන වගන්තිවල සඳහන් 'ශ්‍රී ලංකා ජනරජය' යන්න 'ශ්‍රී ලංකාව' වශයෙන් වෙනස් කිරීම.

වර්තමාන ව්‍යවස්ථාවේ 1, 2, 3, 5, 6, 7, 8 හා 9 වන වගන්තිවල ශ්‍රී ලංකා රාජ්‍යය හඳුන්වන්නේ 'ශ්‍රී ලංකා ජනරජය' වශයෙනි. එහෙත් අතුරු වාර්තාවෙන් යෝජනා කරන ඊට අනුරූප බොහෝ වගන්තිවල '**ජනරජය**' යන පදය සම්පූර්ණයෙන් ම ඉවත් කොට ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඉහත වගන්තිවල '**ජනරජය**' යන පදය නිර්දේශිත වගන්තිවලින් ඉවත් කිරීමට කර ඇති යොජනාව යටි අරමුණකින් කර ඇති බව පෙනේ. ශ්‍රී ලංකා භූමි ප්‍රදේශය ශ්‍රී ලංකාව යනුවෙන් හඳුන්වන අතර, ශ්‍රී ලංකා රාජ්‍යය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හඳුන්වන්නේ 'ශ්‍රී ලංකා ජනරජය' යන පදයෙනි. ඒ අනුව වර්තමාන 3 වන වගන්තියේ 'ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපත්‍යය ජනතාව සතු ය' යනුවෙන් සඳහන් වන්නේ ශ්‍රී ලංකා ජනරජයේ (සමස්ත ශ්‍රී ලංකා රාජ්‍යයේ) පරමාධිපත්‍යය සමස්ත ජනතාව සතු බව විස්තර කිරීමට ය.

එහෙත් ව්‍යවස්ථාවේ 1 හා 2 වන වගන්ති සංශෝධනය[17] කොට ශ්‍රී ලංකා ජනරජය මධ්‍යම හා පළාත්බද ආයතනවලින් සමන්විත බවටත් 'ශ්‍රී ලංකාවේ පරමාධිපත්‍යය ජනතාව සතු' බවටත් වෙනස් කිරීම ඒ ඒ පළාත තුළ පරමාධිපත්‍යය ඒ ඒ පළාතේ ජනතාවට පමණක් සතු බව කියාපෑමේ අදහසින් කළ වෙනස්කමක් දැ යි සැක සහිත ය. එ වැනි යටි අරමුණක් නැති නම් ශ්‍රී ලංකාවේ නාමය වෙනස් කිරීමට හේතුවක් නැත. මේ වෙනස්කම කිරීමේ අදහස වන්නේ ශ්‍රී ලංකාවේ භූමි ප්‍රදේශ තුළ (පවතින පළාත් නවය තුළ) පරමාධිපත්‍යය සමස්ත ජනතාව පොදුවේ භුක්ති විඳිය යුතු ය යන අදහස වෙනස් කිරීමට බව පැහැදිලි ය.

'ඒකීය රාජ්‍යය' පිළිබඳ ඉහත 1 හා 2 වගන්ති හා එක් ව ගත් විට ශ්‍රී ලංකාව තුළ ඒ ඒ පළාත්වල පරමාධිපත්‍යය ඒ ඒ පළාතේ ජනතාවට පමණක් වෙන වෙන ම භුක්ති විඳීමට හැකි වන පරිදි ව්‍යවස්ථාව සකස් කිරීමට උත්සාහ කරන බව පෙනේ. එ සේ නොමැති නම් සමස්ත රාජ්‍යය ම විස්තර කිරීමට උපයෝගී කරගන්නා '**ශ්‍රී ලංකා ජනරජය**' යන්න '**ශ්‍රී ලංකාව**' යන පදයට වෙනස් කිරීමට හේතුවක් නැත.

එ පමණක් නො ව වර්තමාන ව්‍යවස්ථාවේ 9 වන වගන්තියේ සඳහන් වන්නේ "ශ්‍රී ලංකා ජනරජය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේ ය යනුවෙනි." මේ වාක්‍යයේ ජනරජය යන පදය ඉවත් කළ හොත් එය කියැවෙන්නේ "ශ්‍රී ලංකාව බුදධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේ ය" යනුවෙනි. මෙහි අදහස වන්නේ, ශ්‍රී ලංකාවේ ජනතාව බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනැමුව ද රාජ්‍ය යාන්ත්‍රණය එ සේ ප්‍රමුඛස්ථානය ලබානොදීමට කටයුතු සැලසීම ය. අලුත් ව්‍යවස්ථා අධිකරණයක් ස්ථාපනය කිරීමේ අපේක්ෂාව තමනට රිසි පරිදි මේ අලුත් වගන්තිය අර්ථ නිරූපණය කරගැනීමට මඟ පාදාගැනීම ය.

---

17. බලන්න - පරිච්ඡේදය II

(2). ජනතා පරමාධිපත්‍යය පිළිබඳ වර්තමාන 4 වන වගන්තිය වෙනස් කිරීම.

වර්තමාන ආණ්ඩක්‍රම ව්‍යවස්ථාවේ 4 වන වගන්තියේ දැක්වෙන්නේ ජනතාව ගේ ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ බලය ක්‍රියාත්මක කරන ආකාරය යි. වර්තමාන ව්‍යවස්ථාවේ දැක්වෙන ආකාරයට ඒ වගන්තිය මෙ සේ යි.

(අ) වර්තමාන 4 වන වගන්තිය

"4. ජනතාව ගේ පරමාධිපත්‍යය ක්‍රියාත්මක වීම ද භුක්ති විඳීම ද මතු දැක්වෙන ආකාරයෙන් සිදු වන්නේ ය.

(අ) ජනතාව ගේ ව්‍යවස්ථාදායක බලය ජනතාව විසින් තෝරා පත් කරගනු ලබන මන්ත්‍රීවරයන් ගෙන් සමන්විත පාර්ලිමේන්තුව විසින් ද ජනමත විචාරණයක දී ජනතාව විසින් ද ක්‍රියාත්මක කළ යුත්තේ ය.

(ආ) රටේ ආරක්ෂාව ඇතුළු ව ජනතාව ගේ විධායක බලය ජනතාව විසින් තෝරා පත් කරගනු ලබන ජනරජයේ ජනාධිපතිවරයා විසින් ක්‍රියාත්මක කළ යුත්තේ ය.

(ඇ) නීතිය අනුව පාර්ලිමේන්තුව විසින් ම ක්‍රියාත්මක කළ හැකි පාර්ලිමේන්තුවේ සහ එහි මන්ත්‍රීවරයන් ගේ වරප්‍රසාද, පරිහාර හා බලතල සම්බන්ධයෙන් විනා ජනතාව ගේ අධිකරණ බලය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඇති කොට පිහිටුවන ලද හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගන්නා ලද නැත හොත් වෙනත් යම් නීතියකින් ඇති කොට පිහිටුවන ලද අධිකරණ විනිශ්චය අධිකාර සහ ආයතනය මඟින් පාර්ලිමේන්තුව විසින් ක්‍රියාත්මක කළ යුතතේ ය.

(ඈ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගනු ලබන මූලික අයිතිවාසිකම් සියලු පාලන ආයතන විසින් ගරු කරනු ලැබිය යුත්තේ ය. ආරක්ෂා කරනු ලැබිය යුත්තේ ය. වර්ධනය කරනු ලැබිය යුත්තේ ය. තව ද ඒ මූලික අයිතිවාසිකම් මෙහි මින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට සහ ප්‍රමාණයට මිස සංක්ෂිප්ත කිරීම, සීමා කිරීම හෝ අහිමි කිරීම හෝ නො කළ යුත්තේ ය.

(ඉ) අටළොස් විය සම්පූර්ණ කර ඇත්තා වූ ද මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි ඡන්ද හිමියකු වීමට සුදුසුකම් ලැබ තමා ගේ නම ඡන්ද හිමි නාමලේඛනයේ ඇතුළත් කරනු ලැබ සිටින්නා වූ ද සැම පුරවැසියකු විසින් ම ජනරජයේ ජනාධිපතිවරයා තෝරා පත් කිරීමේ ඡන්ද විමසීමේ දී ද පාරලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කිරීමේ මැතිවරණයේ දී ද සැම ජනමත විචාරණයෙක දී ද ඡන්ද බලය ක්‍රියාත්මක කළ හැකි විය යුතු වන්නේ ය."

ඉහත 4 වන වගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට අතුරු වාර්තාවෙන් යෝජනා වී ඇත.

(ආ) යෝජිත සංශෝධිත වගන්තිය

"ජනතාව ගේ ව්‍යවස්ථාදායක විධායක හා අධිකරණ බලය ක්‍රියාත්මක කළ යුත්තේ අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ප්‍රතිපාදනය කර ඇති ආකාරයට යි."[18]

18. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ මෙහෙයුම් කමිටුවේ අතුරු වාර්තාව, 2 පිටුව.

අතුරු වාර්තාවෙන් යෝජනා කරනු ලැබ ඇත්තේ දැනට ජනතාව ගේ ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ බලය ක්‍රියාත්මක කරන්නේ කවර ආයතන දැ යි නිශ්චිත ව දැක්වෙන 4 වන වගන්තිය ඉවත් කොට ඒ බලතල ව්‍යවස්ථාවේ අන් තැනක 'ප්‍රතිපාදනය කර ඇති ආකාරයට' විය යුතු බව සඳහන් කිරීම ය. මෙයින් පැහැදිලි වන කාරණය නම් ජනතාව ගේ ව්‍යවස්ථාදයක, විධායක හා අධිකරණ බලය කවරකු විසින් ක්‍රියාත්මක කරන්නේ ද යන්න ව්‍යවස්ථාවේ අභ්‍යන්තරයේ සැඟවීමට උත්සාහ කරන බව යි.

(ඇ) 2000 ව්‍යවස්ථා කොටුම්පතේ ප්‍රතිපාදන

2000 වසරේ දී චන්ද්‍රිකා කුමාරතුංග රජය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ ව්‍යවස්ථා කෙටුම්පතේ ඉහත 4 වන වගන්තිය සංශෝධනය කිරීමට යෝජනා කළේ මෙ සේ ය.

"2 (2) (අ) - ජනතාව ගේ ව්‍යවස්ථාදායක බලය, ජනමත විචාරණයක දී ජනතාව විසින් ද, පාර්ලිමේන්තුව විසින් ද, අදාළ ප්‍රමාණ අනුව පළාත් සභා විසින් ද, ***මෙහි මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට*** *ද, ක්‍රියාත්මක කරනු ලැබිය යුත්තේ ය.*

"2 (2) (ආ) - ජනතාව ගේ විධායක බලය, අග්‍රාමාත්‍යවරයා ගේ සහ අමාත්‍ය මණ්ඩලයේ උපදෙස් මත ක්‍රියා කරමින් ජනරජයේ ජනාධිපතිවරයා විසින් ද, ඒ ඒ ප්‍රධාන අමාත්‍යවරයන් ගේ සහ පළාත් අමාත්‍ය මණ්ඩලවල උපදෙස් මත ක්‍රියා කරමින් ආණ්ඩුකාරවරයන් විසින් ද, ***මෙහි මින් මතු විධිවිධාන සල්වා ඇති ප්‍රමාණයට*** *ක්‍රියාත්මක කරනු ලැබිය යුත්තේ ය."*

(i) 2000 කෙටුම්පතේ විධායක බලය ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ව ඇතුළත් කරන 'මතු විධිවිධාන' සඳහන් වන්නේ 65 වන හා 130 වන වගන්තිවල ය.

"65 (1) - 'අමාත්‍ය මණ්ඩලයක් විය යුතු අතර,

(අ) ජනරජයේ,

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් මධ්‍යම විධායකය වෙත පවරාදී ඇති සහ

(ඇ) දෙ වන උපලේඛනයේ පළමු වන ලැයිස්තුවෙහි දක්වා ඇති විෂයයනට හා කර්තව්‍යවලට අදාළ ව,

විධායක බලය ක්‍රියාත්මක කිරීම ද ඇතුළු ව අමාත්‍ය මණ්ඩලය වග කිව යුතු වන්නේ, යම් කාරණයක් සම්බන්ධයෙන් ද ඒ කාරණා මෙහෙයවීමේ හා පාලනය කිරීමේ භාරය අමාත්‍ය මණ්ඩලය වෙත පැවරෙන්නේ ය. අමාත්‍ය මණ්ඩලය ඒ කාරණා සම්බන්ධ ව පාර්ලිමේන්තුවට සාමූහික ව වග කීමට බැඳී සිටින්නේ ය."

"130 (1) (අ) - පළාතේ විධායක බලය ආණ්ඩුකාරවරයා වෙත පැවරෙන අතර, ඒ බලය අදාළ වන්නේ ප්‍රඥප්ති සෑදීම පිණිස පළාත් සභාවකට බලය තිබෙන කාරණා සම්බන්ධයෙන් ද එ සේ අදාළ වන තාක් දුරට, ආණ්ඩකාරවරයා ප්‍රධාන අමාත්‍යවරයා ගේ සහ අමාත්‍ය මණ්ඩලයේ උපදෙස් මත ක්‍රියා කළ යුතතේ ය."[19]

19. 2000 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත් සඳහා බලන්න: ද සිල්වා, ජනාධිපති නීතිඥ මනෝහර ආර්., ***බෙදුම්වාදීන් ගේ උපායමාර්ග හා ව්‍යවස්ථා සංශෝධන, 2017.***

(ii) 2000 ව්‍යවස්ථා කෙටුම්පත යටතේ ව්‍යවස්ථාදායක බලය ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ව ඇතුළත් කර ඇති හා මතු විධිවිධාන.

ශ්‍රී ලංකා ජනතාව ගේ ව්‍යවස්ථාදායක බලය බෙදා වෙන් කොට ක්‍රියාත්මක කිරීමට යෝජනා වූ අතර, එහි 91 (1) වන වගන්තිය අනුව පාර්ලිමේන්තුවට ව්‍යවස්ථාදායක බලය ඇත්තේ, ඒ කෙටුම්පතේ සංවෘත ලැයිස්තුවේ ඇති විෂයයන් සම්බන්ධයෙන් පමණි.

2000 කෙටුම්පතේ 137 (1) වගන්තියට අනුව 'පළාත් ලැයිස්තුවට' අයත් විෂයයක් සම්බන්ධයෙන් නීති හැදීමේ **අනන්‍ය බලය** ඇත්තේ පළාත් සභාවට යි. 137 (1) වගන්තිය විස්තර වන්නේ මෙ සේ ය.

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විධිවිධානවලට යටත් ව, **පළාතක පළාත් සභාවට**, ඒ පළාත සඳහා හෝ ඒ පළාතේ යම් කොටසක් සඳහා හෝ 'පළාත් ලැයිස්තුව' යනුවෙන් සඳහන් කර ඇති දෙ වන උපලේඛනයේ II වන ලැයිස්තුවෙහි දක්වා ඇති කවර හෝ කාරණයක් සම්බන්ධයෙන් අතීතයට බලපාන ප්‍රඥප්ති ද ඇතුළු ව **ප්‍රඥප්ති සෑදීමේ අනන්‍ය බලය ඇත්තේ ය.**"

මෙයින් පෙනෙන්නේ වර්තමාන ව්‍යවස්ථාව යටතේ ජනතාව ගේ පරමාධිපත්‍යයේ කොටසක් වන විධායක හා ව්‍යවස්ථාදායක බලය මධ්‍යම රජය විසින් ක්‍රියාත්මක කළ ද 2000 කෙටුම්පත මඟින් විධායක හා ව්‍යවස්ථාදායක බලය මධ්‍යම රජය හා පළාත් අතර බෙදාදී ඇති බව ය. අතුරු වාර්තාවෙන් උත්සාහ කරන්නේ ද ඒකීය රාජ්‍යය ෆෙඩරල් රාජ්‍යයක් බවට පරිවර්තනය කොට මධ්‍යම හා පළාත් ආණ්ඩු අතර බලය බෙදා වෙන් කිරීමට ය. එහෙත් මේ ආකෘතිය ජනතාව ගෙන් සැඟවීම සඳහා ව්‍යවස්ථාදායක හා විධායක බලය ක්‍රියාත්මක කරන ආකාරය ව්‍යවස්ථාවේ මින් මතුවට ඇති බව පවසා ව්‍යවස්ථාවේ විවිධ තැන්වල සැඟවීමට නිර්ලජ්ජිත ව උත්සාහ කර ඇති බව පැහැදිලි ය.

බුද්ධාගමට දී ඇති ප්‍රමුඛස්ථානය අහිමි කිරීම

වර්තමාන ව්‍යවස්ථාවේ II වන පරිච්ඡේදය 'බුද්ධාගම' සඳහා වෙන් කර ඇති අතර ඒ පරිච්ඡේදයට ඇතුළත් කර ඇති 9 වන වගන්තිය මඟින් බුද්ධාගමට ප්‍රමුඛස්ථානය ලබාදීමටත් බුද්ධ ශාසනය ආරක්ෂා කොට පෝෂණය කිරීම රජයේ වගකීම බවට සහතික වීමටත් කටයුතු කර ඇත.

වර්තමාන ව්‍යවස්ථාවේ 9 වන වගන්තිය මෙ සේ යඃ

"ශ්‍රී ලංකා ජනරජය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේ ය. එ හෙයින් 10 වන ව්‍යවස්ථාවෙන් සහ 14 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඉ) ඡේදයෙන් සියලු ම ආගම්වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂා කරදෙන අතර බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේ ය."

(අ) 9 වන වගන්තිය වෙනස් කිරීම.

නව මෙහෙයුම් කමිටු අතුරු වාර්තාවේ නිර්දේශ

2017 සැප්තැම්බර මස 21 වන දින ඉදිරිපත් කළ මෙහෙයුම් කමිටු අතුරු වාර්තාවෙන් ඉදිරිපත් කර ඇති නිර්දේශ මෙ සේ ය.ඃ

"ශ්‍රී ලංකාව බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේ ය. එ හෙයින් 10 වැනි ව්‍යවස්ථාවෙන් සහ 14 වැනි ව්‍යවස්ථාවෙන් (1) වැනි අනුව්‍යවස්ථාවේ (ඉ) ඡේදයෙන් සියලු ම ආගම්වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂා කරදෙන අතර, බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේ ය."

හෝ

*"ශ්‍රී ලංකාව බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේ ය. **එ හෙයින් සියලු ආගම් හා විශ්වාසයනට ගෞරවයෙන් හා අභිමානයෙන් සලකමින් හා වෙන් කෙට සැලකීමකින් තොර** ව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහතික කර ඇති මූලික අයිතිවාසිකම් සියලු ම පුද්ගලයනට සහතික කරමින්, බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේ ය."*[20]

1. ඉහත කී විකල්ප විධිවිධාන දෙකෙන් පළමු වැන්න වර්තමාන 9 වන වගන්තියට බොහෝ සෙයින් සමාන නමුත් වර්තමාන ව්‍යවස්ථාවේ 9 වන වගන්තියේ 'ශ්‍රී ලංකා ජනරජය' 'ශ්‍රී ලංකාව' යනුවෙන් වනෙස් කර ඇත. මේ සංශෝධනය කර ඇත්තේ යටි අරමුණක් ඇති ව බව පැහැදිලි ය. බුද්ධාගමට ප්‍රමුඛස්ථානය දීම ශ්‍රී ලංකා ජනරජයේ වගකීමක් ලෙස වර්තමාන 9 වන වගන්තියේ දැක්වෙන්නේ බුද්ධාගමට ප්‍රමුඛස්ථානය දීම රාජ්‍ය වගකීමක් බවට සහතික වනු පිණිස ය. මේ වගන්තියෙන් 'ජනරජය' යන වචනය ඉවත් කර ඇත්තේ බුද්ධාගමට ප්‍රමුඛතාව ලබාදීම සඳහා ඇති රාජ්‍ය වගකීමෙන් නිදහස් වීමට බව පෙනේ.

---

20. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මෙහෙයුම් කමිටුවේ අතුරු වාර්තාව, 3 පිටුව. විශේෂඥ කෙටුම්පතේ 8 වන වගන්තිය.

2. දෙ වන විකල්ප විධිවිධානයෙන් කර ඇති යෝජනාවේ පහත සඳහන් කරුණු හඳුනාගත හැකි යː

(i). බුද්ධාගමට ප්‍රමුඛස්ථානය දෙන බව සඳහන් කරන අතර සෙසු ආගම් සමාන ලෙස සැලකීමටත්, වෙනස් ලෙස නො සැලකිය යුතු බවටත් සඳහන් වේ. මේ ස්ථාවර දෙක එකිනෙකට පරස්පර ය. සියලු ආගම් සමාන ලෙස සලකන්නේ නම් බුද්ධාගමට ප්‍රමුඛස්ථානය දිය නොහැකි ය.

(ii). දැනට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන වගන්තියේ සෙසු ආගම්වලට තහවුරු කර ඇත්තේ ව්‍යවස්ථාවේ ආගම් ඇදහීම පිළිබඳ 10 වන වගන්තියේ හා ආගම් ප්‍රකාශ කිරීම පිළිබඳ 14 (1) (ඉ) වගන්තියේ සඳහන් මූලික අයිතිවාසිකම් දෙක පමණි. 9 වන වගන්තියේ සමාන ලෙස සැලකීම පිළිබඳ 12 වන වගන්තියේ සඳහන් මූලික අයිතිවාසිකම ඇතුළත් නොවන්නේ බුද්ධාගමත් අනෙකුත් ආගම් එක සමාන ලෙස සැලකිය නොහැකි බැවිනි.

(iii). රජය ඉදිරිපත් කර ඇති විකල්ප යෝජනාවල සියලු ම ආගම්වලට අයත් පුද්ගලයනට සියලු ම මූලික අයිතිවාසිකම් සහතික කිරීමේ අදහස වන්නේ, 12 වන වගන්තියේ සඳහන් සමානාත්මතාවට යටත් ව 9 වන වගන්තිය ක්‍රියාත්මක කිරීම හරහා 9 වන වගන්තිය මඟින් ලබාදී ඇති ප්‍රමුඛතාව නිෂ්ක්‍රිය කිරීමට ය.

(iv). වර්තමාන 9 වන වගන්තියේ අන්‍ය ආගමිකයනට සහතික කර ඇති 14 (1) (ඉ) වගන්තියේ සඳහන් ආගමික අයිතිවාසිකම් පුරවැසියනට පමණක් නො ව ඕනෑ ම පුද්ගලයකුට ලබාදීම කර ඇති තවත් යෝජනාවකි. වර්තමාන ව්‍යවස්ථාවේ 14 (1) (ඉ) වගන්තියේ සඳහන් වන්නේ තම ආගම ප්‍රකාශ කිරීමේ නිදහස යි. ඒ නිදහස වර්තමානයේ ලබාදී ඇත්තේ පුරවැසියනට පමණි. එහෙත් ඒ නිදහස 'සැම පුද්ගලයකුට ම' ලබාදීමේ අරමුණ වන්නේ, 9 වන වගන්තියෙන් ලබාදී ඇති අයිතිය විදේශිකයන් ගේ මූලික අයිතිවාසිකම්වලට පවා යටත් කිරීම යි.

උදාහරණයක් වශයෙන් සවුදි අරාබි ජාතිකයකුට හෝ ඇමරිකානුවකුට හෝ ශ්‍රී ලංකාව තුළ පල්ලි ගොඩ නැඟීම ඇතුළු තම ආගම් ප්‍රකාශ කිරීමේ නිදහසට යටත් ව බුද්ධාගමට හිමි තැන භුක්ති විඳීමටත් බුද්ධ ශාසනය පවත්වාගෙනයාමටත් සිදු වීම මෙයින් ඇති විය හැකි ප්‍රතිවිපාකයකි.

(v) මේ 'සියලු ආගම් හා විශ්වාසයනට ගෞරවයෙන් හා අභිමානයෙන් සලකමින්' යන වාක්‍යය ඇතුළත් කිරීමේ අපේක්ෂිත අදහස නම් දැනට ශ්‍රී ලංකාවේ අන්‍ය ආගම් හා විශ්වාසයනට ලබාදී නැති ගෞරවයක් හා අභිමානයක් මේ ව්‍යවස්ථාවෙන් පිරිනමන බව කියාපෑමත්, එ සේ ම දැනට අන්‍ය ආගම්වලට වෙනස් ලෙස සලකන නිසා ඔවුනට මේ ව්‍යවස්ථාවෙන් සමතැන් දිය යුතු බවත් ය.

2016 මේ ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය ආරම්භ වූ දා සිට බුද්ධාගමට හිමි තැන නැති කිරීමට ගත් උත්සාහය අපමණ ය.

ලාල් විජේනායක කමිටුවෙන් කළ යෝජනා

2016 මැයි මස රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද ලාල් විජේනායක කමිටු වාර්තාවෙන් වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන වගන්තිය හා ව්‍යවස්ථාවේ II පරිච්ඡේදය සංශෝධනය කිරීමට යෝජනා කෙරිණි. ඊට මහා සංඝයා වහන්සේලා ගෙන් ද බෞද්ධ අබෞද්ධ ජනතාව ගෙන් ද දැඩි විරෝධයක් එල්ල වූ අතර රජය

ඊට පිළිතුරු දෙමින් කියා සිටියේ 9 වන වගන්තිය වෙනස් කිරීමට කිසි දු අදහසක් නොමැති අතර එ සේ 9 වන වගන්තිය වෙනස් කරන බවට එල්ල වී ඇති චෝදනා පදනම් විරහිත බව යි.

9 වන වගන්තිය වෙනස් කිරීමට මෙහෙයුම් කමිටු අතුරු වාර්තා කෙටුම්පතින් කළ යෝජනා

ඉන් පසු ව 2017 මැයි මස මෙහෙයුම් කමිටුව ඉදිරිපත් කළ මූලික අතුරු වාර්තා කෙටුම්පතේ ඉහත විධිවිධාන වෙනුවට විකල්ප විධිවිධාන 7ක් යෝජනා කෙරිණි. ඒ විකල්ප විධිවිධාන 7 මෙ සේ ය:

"විකල්ප 1 (දැනට පවතින)

බුද්ධාගම

ශ්‍රී ලංකාව බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේ ය. එ හෙයින් 10 වන ව්‍යවස්ථාවෙන් හා 14 වන ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාවේ (ඉ) ඡේදයෙන් සියලු ම ආගම්වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂා කරදෙන අතර බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේ ය.

"විකල්ප 2

ආගම

ශ්‍රී ලංකාව බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේ ය. එ හෙයින් අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් සෑම පුද්ගලයකුට ම සහතික කරදෙන අතර බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේ ය.

"විකල්ප 3

ආගම

ශ්‍රී ලංකාව බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන අතර සියලු ආගම් හා විශ්වාසයනට ගෞරවයෙන් හා අභිමානයෙන් සලකමින් හා කිසි ම ආකාරයක වෙනස් ලෙස සැලකීමකින් තොර ව බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේ ය.

"විකල්ප 4

ආගම

(1) ත්‍රිපිටකයේ විවරණය කර ඇති ආකාරයට ශ්‍රී ලංකාව බුද්ධාගමට ප්‍රමුඛස්ථානය දිය යුතු ය. බුද්ධ ශාසනය ආරක්ෂා කිරීම හා පෝෂණය කිරීම රජයේ වගකීම විය යුතු ය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් සියලු ම පුද්ගලයනට සහතික කරමින් හා කිසි ම වෙනස් ලෙස සැලකීමකින් තොර ව ශ්‍රී ලංකාව සියලු ම ආගම් හා විශ්වාසයනට ගෞරවයෙන් හා අභිමානයෙන් සැලකිය යුතු ය.

"විකල්ප 5

ආගම

ශ්‍රී ලංකාව බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේ ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් සියලු ම පුද්ගලයනට සහතික කරමින් හා කිසි ම වෙනස් ලෙස සැලකීමකින් තොර ව සියලු ම ආගම් හා විශ්වාසයනට ගෞරවයෙන් හා අභිමානයෙන් සලකමින් බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේ ය.

"විකල්ප 6

ආගම

ශ්‍රී ලංකාව බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේ ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් සියලු ම පුද්ගලයනට සහතික කරමින් හා කිසි ම වෙනස් ලෙස සැලකීමකින් තොර ව සියලු ම ආගම් හා විශ්වාසයන්ට සලකමින් බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේ ය.

"විකල්ප 7

ආගම

ශ්‍රී ලංකාව බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේ ය. ඒ අනුව බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේ ය.

ශ්‍රී ලංකාව සියලු ම ආගම් හා විශ්වාසවල සමානත්වය පිළිගන්නා අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් සියලු ම පුද්ගලයනට සහතික වේ."[21]

රජය 9 වන වගන්තිය සංශෝධනය කිරීමේ උත්සාහයක නිරත නො වේ නම් ඒ වගන්තිය සංශෝධනය කරන විකල්ප විධිවිධාන 7 ක් එ කී අතුරු වාර්තා කොටුම්පත මඟින් යෝජනා කිරීමට හේතුවක් නොමැත.

ඉහත විකල්ප යෝජනාවලට ත්‍රෛයිනිකායික මහා සංඝ සභාවලින් දැඩි විරෝධයක් එල්ල වූ අතර එහි ඍජු ප්‍රතිඵලයක් වශයෙන් ඒ විකල්ප යෝජනා හකුළාගන්නා ලදි. එහෙත් ඒ විකල්ප යෝජනාවලට සමාන විකල්ප යෝජනාවක් 2017 සැප්තැම්බර 21 වන දින ඉදිරිපත් කළ මෙහෙයුම් කමිටු වාර්තාවෙන් ඉදිරිපත් කර ඇත.

(ආ) ව්‍යවස්ථාවේ පූර්විකාවේ ශ්‍රී බුද්ධ වර්ෂය පිළිබඳ සඳහන ද ඉවත් කිරීම.

වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පූර්විකාව වෙනස් කිරීමට මෙහෙයුම් කමිටුවේ විශේෂඥ මණ්ඩලය යෝජනා කර තිබේ. එක් යෝජනාවක් අනුව ශ්‍රී බුද්ධ වර්ෂය පිළිබඳ සඳහන පූර්විකාවෙන් ඉවත් කර ඇත.

(ඇ) ව්‍යවස්ථාවේ දෙ වන පරිච්ඡේදයේ 'බුද්ධාගම' යන මාතෘකාව වෙනස් කිරීම.

දැනට පවතින ව්‍යවස්ථාවේ බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනැමෙන 9 වන වගන්තිය වෙන ම පරිච්ඡේදයකට (2 වන පරිච්ඡේදය) වෙන් කොට දක්වා එයට 'බුද්ධාගම' ලෙස මාතෘකාව යොදා ඇත්තේ ශ්‍රී ලංකා රාජ්‍යය ඓතිහාසික ලෙස හැඩගැස්වීමෙහි ලා බුද්ධාගම ඉටු කළ කාර්යභාරය පිළිගැනීමක් වශයෙන් මෙන් ම බුද්ධාගම ආරක්ෂා කොට පෝෂණය කිරීමේ ලා ශ්‍රී ලංකා ජනරජයේ වගකීම අවධාරණය කරනු පිණිස ය. ඉහත මෙහෙයුම් කමිටු වාර්තාවේ විකල්ප 7න් 6ක ම ඒ පරිච්ඡේදයේ මාතෘකාව ලෙස යොදා ඇත්තේ 'බුද්ධාගම' නොව 'ආගම' යන්න ය. දැන් මෙහෙයුම් කමිටුව හමුවේ ඇති ව්‍යවස්ථා කෙටුම්පතෙහි 'බුද්ධාගම' යන මාතෘකාව මුළුමනින් ම ඉවත් කොට 'ආගම' යන්න යොදා ඇත.

---

21. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ මෙහෙයුම් කමිටුවේ අතුරු වාර්තා කෙටුම්පත, 4-5 පිටු.

VII වන පරිච්ඡේදය

දෙමළ ජාතික ගීයක් ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම[22]

වර්තමාන අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ජාතික ගීය හඳුන්වන්නේ 'ශ්‍රී ලංකා මාතා' යනුවෙනි. එහෙත් අතුරු කමිටු යෝජනාවල ජාතික ගීය 'ශ්‍රී ලංකා මාතා / ශ්‍රී ලංකා තායේ' විය යුතු ය යනුවෙන් වෙනස් කර ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවේ ජාතික ගීය ලෙස 'ශ්‍රී ලංකා මාතා' ගීය ද, දෙමළ බසින් ඇති 'ශ්‍රී ලංකා තායේ' ගීතය ද පිළිගැනෙනු ඇත.

VIII වන පරිච්ඡේදය

භාෂාව - සිංහල භාෂාවට සමතැන නොලැබීම

මෙහෙයුම් කමිටුවේ අතුරු කමිටු වාර්තාවේ භාෂාව සම්බන්ධයෙන් වන විධිවිධාන පිළිබඳ සඳහනක් නැති අතර, භාෂාව පිළිබඳ විශේෂ සඳහනක් නොමැත්තේ ජේ. ආර්. ජයවර්ධන සමයේ දී ආණ්ඩුව ව්‍යවස්ථාවට ගෙන එනු ලැබූ 16 වන ව්‍යවස්ථා සංශෝධනය හරහා සිංහල ජනතාවටත් ඔවුන් ගේ භාෂාවටත් හිමිවිය යුතු තැන අහිමි කරමින් ද, උතුරු හා නැඟෙනහිර දෙමළ ජනතාවට අනිසි වාසි සැලසෙන පරිදි ද ව්‍යවස්ථාවට විධිවිධාන එක් කර ඇති නිසා ය.[23]

මේ සම්බන්ධයෙන් වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 22 (1) වගන්තිය උපුටා දැක්වීම වැදගත් වේ.

> *"සිංහල සහ දෙමළ භාෂා ශ්‍රී ලංකාව මුළුල්ලේ ම පරිපාලන භාෂා විය යුත්තේ ය. රාජ්‍ය ආයතන විසින් පොදු වාර්තා තබාගැනීම සඳහා සහ සියලු කටයුතු ඉටු කිරීම සඳහා **දෙමළ භාෂාව භාවිත කරන උතුරු සහ නැඟෙනහිර පළාත් හැර, ශ්‍රී ලංකාවේ සියලු ම පළාත්වල පරිපාලන භාෂාව සිංහල භාෂාව විය යුතු** අතර ඒ පළාත්වල රජයේ ආයතන විසින් පොදු වාර්තා තබාගැනීම සහ සියලු කටයුතු ඉටු කිරීම සඳහා සිංහල භාෂාව භාවිත කළ යුතු ය. එ සේ වුව ද උපදිසාපති කොට්ඨාසයක් සංයුක්ත වන යම් ඒකකයක මුළු ජනගහනයට ඒ ප්‍රදේශයේ සිංහල හෝ දෙමළ හෝ භාෂාමය සුළු ජන කොටස දරන අනුපාතය කෙරෙහි සැලකිල්ල ඇති ව, ජනාධිපතිවරයා විසින් සිංහල හා දෙමළ භාෂා දෙක ම හෝ ඒ ප්‍රදේශයේ පිහිටි පළාතේ පරිපලන භාෂාව වශයෙන් භාවිත කරනු ලැබූ භාෂාව නොවන වෙනත් භාෂාවක් හෝ ඒ ප්‍රදේශය සඳහා පරිපාලන භාෂාව වශයෙන් භාවිත කරනු ලැබීමට විධාන කරනු ලැබිය හැකි ය."*

ඒ සංශෝධනයට අනුව සිංහල, දෙමළ භාෂා දෙක ම ශ්‍රී ලංකාව මුළුල්ලේ පරිපාලන භාෂා විය යුතු බව එහි පළමු වන වාක්‍යයේ සඳහන් වේ. එහෙත් මේ ප්‍රකාශයේ හරය ඒ වගන්තියේ ඊ ළඟ වාක්‍යයෙන් වෙනස් කර ඇත. එ නම් " **දෙමළ භාෂාව භාවිත කරන උතුරු හා නැඟෙනහිර පළාත් හැර ශ්‍රී ලංකාවේ සියලු ම පළාත්වල පරිපාලන භාෂාව සිංහල භාෂාව විය යුතු"** බව යි.

මෙයින් පැහැදිලි වන්නේ වර්තමානයේ ව්‍යවස්ථාවට අනුව ප්‍රායෝගික ව පරිපාලන භාෂාව වශයෙන් සිංහල භාෂාව ක්‍රියාත්මක කළ හැකි වන්නේ උතුරු හා නැඟෙනහිර පළාත් හැර සෙසු පළාත්වල පමණක් බව යි.

---

22. විශේෂඥ කෙටුම්පත, 6 වන වගන්තිය.
23. බලන්න මනෝහර ද සිල්වා විසින් රචිත බෙදුම්වාදයේ උපායමාර්ග හා ව්‍යවස්ථා සංශෝධන ග්‍රන්ථයේ 9 වන පර්ච්ඡේදය.

බලය බෙදා රට බෙදීම

(අ). පළාත් සභාවල නොමනා ක්‍රියා පාලනයට 13 වන සංශෝධනයේ තිබූ විධිවිධාන ඉවත් කිරීම.

1987 දී ගෙන ආ 13 වන ව්‍යවස්ථා සංශෝධනය මඟින් බලය බෙදා පළාත් සභා පිහිටුවනු ලැබූව ද පළාත් සභාවක නොමනා ක්‍රියා පාලනය කිරීමට එ කී සංශෝධනයේ ම විධිවිධාන ගණනාවක් ඇතුළත් කර තිබිණි.

13 වන සංශෝධනය බෙදුම්වාදීනට අවශ්‍ය පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි වූයේ විශේෂයෙන් ම පහත සඳහන් විධිවිධාන 13 වන සංශෝධනයට ඇතුළත් ව තිබුණු නිසා ය.

1. මධ්‍යම රජයට මෙන් ම පළාත් රජයට එක සේ ක්‍රියාත්මක කළ හැකි බලතල සමගාමී ලැයිස්තුවට ඇතුළත් කිරීම හරහා මධ්‍යම රජයට පළාත් සභාවක නොමනා ක්‍රියාවකට එරෙහි ව කටයුතු කිරීමට ඉඩ සලසා තිබීම.

2. ආණ්ඩුකාරවරයා ජනාධිපතිවරයා විසින් පත් කිරීමත්, එ සේ පත් වන ආණ්ඩුකාරවරයා ජනාධිපතිවරයා ගේ විධායක බලයට අනුකූල ව කටයුතු කළ යුතු බවට නියම කරන විධිවිධාන ව්‍යවස්ථාවේ 154 ආ (2) වගන්තියෙහි ඇතුළත් කිරීම.

3. ඕනෑ ම විෂයයක් (පළාත් සභා විෂයයක් වුව ද) සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්ති නීතිගත කිරීමට මධ්‍යම ආණ්ඩුවට ඉඩ ලැබෙන පරිදි ජාතික ප්‍රතිපත්ති පිළිබඳ විෂයය සංවෘත ලැයිස්තුවට ඇතුළත් කිරීම.

4. සංවෘත ලැයිස්තුවේ විෂයයන් ක්‍රියාත්මක කිරීමේ බලය මධ්‍යම ආණ්ඩුවට පමණක් සීමා කිරීමට වග බලාගැනීම.

5. පළාත් සභා නීති ව්‍යවස්ථාවට අනනුකූල නම් හෝ යෝග්‍ය නො වේ නම් හෝ ඒ පිළිබඳ කටයුතු කිරීමට අධිකරණයට හා ආණ්ඩුකාරවරයාට අවශ්‍ය බලය ලබාදීම.

13 වන සංශෝධනයට ඇතුළත් ව තිබුණු ඉහත විධිවිධාන ඉවත් කර නැත හොත් වෙනස් කර 13 වන සංශෝධනය යටතේ බෙදූ බලතල පළාත් ආණ්ඩුවලට නිදහසේ ක්‍රියාත්මක කිරීමට ඉඩ සැලසීම පිණිස අතුරු වාර්තාවෙන් විධිවිධාන ගණනාවක් යෝජනා කර ඇත. අතුරු කමිටු වාර්තාවේ II පරිච්ඡේදයේ සඳහන් ප්‍රධාන යෝජනා සමහරක් පහත සඳහන් කරමු.

(1). ආණ්ඩුකාරවරයා ගේ විධායක බලය අහිමි කොට ඔහුට චාරිත්‍රානුකූල කාර්යභාරයක් පමණක් පැවරීම හෝ ආණ්ඩුකාර පදවිය සම්පූර්ණයෙන් ම අහෝසි කළ යුතු බව හෝ දැක්වෙන අදහස් මෙහෙයුම් කමිටු යෝජනාවලට ඇතුළත් කර ඇත. එ සේ ම ආණ්ඩුකාරවරයා පළාත් අමාත්‍ය මණ්ඩලයේ උපදෙස් මත ක්‍රියා කළ යුතු බව තවත් යෝජනාවකි.[24]

(2). සමගාමී ලැයිස්තුව ඉවත් කිරීමටත් ජාතික (සංවෘත) ලැයිස්තුව හා පළාත් ලැයිස්තුව පමණක් ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම; නැතිනම් සමගාමී ලැයිස්තුව සීමා කිරීම.[25]

24. අතුරු කමිටු වාර්තාව, II පරිච්ඡේදය, 7 වන වගන්තිය.
25. අතුරු කමිටු වාර්තාව, II පරිච්ඡේදය, 4 වන වගන්තිය.

(3) ජාතික ප්‍රතිපත්ති පිළිබඳ විෂයය සංවෘත ලැයිස්තුවට ඇතුළත් නොකිරීමටත් මධ්‍යම රජය විසින් ජාතික ප්‍රතිපත්ති තීරණය කළ හැකි අවස්ථාවන් සඳහා වෙන ම විධිවිධාන ඇතුළත් කිරීම.

වර්තමානයේ පළාත් සභා විෂයයක් සම්බන්ධයෙන් වුව ද ජාතික ප්‍රතිපත්ති සකස් කිරීමට මධ්‍යම රජයට බලය තිබේ. මේ බලය අහිමි කොට පහත සඳහන් විධිවිධාන එකතු කිරීමට අතුරු වාර්තාවේ II පරිච්ඡේදයෙහි 6 වන වගන්තිය යෝජනා කර තිබේ.[26]

"ජාතික ප්‍රතිපත්ති මඟින් පළාත් ලැයිස්තුවේ ඇති කාරණාවක් සම්බන්ධයෙන් පළාත් සභාව විසින් පනවන ලද ප්‍රඥප්ති උල්ලංඝනය නො විය යුතු ය."

මෙ වැනි විධිවිධානවල ප්‍රතිඵලය ඉතා ම භයානක ය. උදාහරණයක් වශයෙන් පළාත තුළ ආහාර සැපයීම හා බෙදා හැරීම යන විෂයය පළාත් සභා ලැයිස්තුව යටතට ගැනෙන විෂයයකි. 'ආහාර බෙදාදීමේ දී සියලු ජන කොට්ඨාසවලට ආහාර නිසි ලෙස බෙදාහැරීම තහවුරු නොවන පරිදි පළාත් සභා ප්‍රඥප්ති සැකසුව හොත් හෝ ක්‍රියාත්මක කළ හොත් එය වළක්වන හෝ නිවැරැදි කරන හෝ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට නොහැකි වනු ඇත.

එ සේ ම වර්තමාන පළාත් සභා ලැයිස්තුවට ප්‍රාථමික පාසල් ඇතුළත් වේ. ප්‍රාථමික පාසල් ස්ථාපනය කිරීමේ හා පාලනය කිරීමේ දී කිසියම් ජනවර්ග යකට අසාධාරණයක් වන පරිදි පළාත් සභා ප්‍රඥප්ති පැනවුව හොත් හෝ ක්‍රියාත්මක කළ හොත් හෝ මධ්‍යම ආණ්ඩුවට එය නිවැරැදි කරන ජාතික ප්‍රතිපත්තියක් සකස් කළ නොහැකි වනු ඇත.

(4). පළාත් ප්‍රඥප්තිවල ව්‍යවස්ථානුකූල භාවය තීරණය කිරීම අලුතෙන් ඇති කිරීමට යෝජිත ව්‍යවස්ථානුකූල අධිකරණයෙන් පමණක් සිදු කිරීමට යෝජනා කර ඇති අතර එ සේ කර ඇත්තේ තමනට රිසි අය පත් කරගන්නා මේ විශේෂ අධිකරණය හරහා තමනට අවශ්‍ය පරිදි ඒ ප්‍රඥප්ති අර්ථ නිරූපණය කරගැනීමට ඉඩ සලසාදීම සඳහා වේ.[27]

ඉදිරිපත් වී ඇති යෝජනා සවිස්තරාත්මක ව සලකා බලමු.

(1). සමගාමී ලැයිස්තුව ඉවත් කිරීම හෝ දුර්වල කිරීම[28]

බලය බෙදා ඇති රාජ්‍යයක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සමගාමී ලැයිස්තුවක් ඇතුළත් කිරීමේ වැදගත්කම වන්නේ යම් පළාතක් එක් ජන කොට්ඨාසයක් විසින් පාලනය කරනු ලබන විටක දී ඒ පළාතේ අනෙකුත් ජන කොට්ඨාසවල ජනයා ගේ යහපත පිණිස මධ්‍යම ආණ්ඩුවට මැදිහත් වීමට අවස්ථාව සලසාදීම ය. මෙහි දී විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණක් වන්නේ, ඉන්දියාවේ ද, දකුණු අප්‍රිකාවේ ද ව්‍යවස්ථාවන්හි සමගාමී ලැයිස්තු ඇතුළත් ව තිබීම යි.

විශේෂයෙන් ම නැඟෙනහිර පළාතේ 40%ක් දෙමළ ජාතිකයෝ ද, 30% බැගින් සිංහල හා මුස්ලිම් ජාතිකයෝ ද ජීවත් වෙති. නැඟෙනහිර පළාතේ භූමි ප්‍රදේශයෙන් 50%කට අධික භූමි ප්‍රදේශයක සිංහල ගම්මාන ව්‍යාප්ත ව පවතී. යම් හෙයකින් ඉතිහාසයේ අත්විඳි පරිදි සිංහල හෝ මුස්ලිම් හෝ ගම්මානයකට ත්‍රස්තවාදී ප්‍රහාරයක් එල්ල වුව හොත් එ වැනි ප්‍රහාරයකින් අසරණ වන ජනතාවට උපකාර කිරීමට පළාත් රාජ්‍යයන් උත්සුක නො වේ නම් ඒ ජනයාට පිහිට වීමට සමගාමී ලැයිස්තුව හරහා මධ්‍යම ආණ්ඩුවට පුළුවන. එ සේ ම නැඟෙනහිර

---

26. අතුරු කමිටු වාර්තාව, II පරිච්ඡේදය, 5 වන වගන්තිය.
27. අතුරු කමිටු වාර්තාව, II පරිච්ඡේදය, 8 වන වගන්තිය.
28. අතුරු වාර්තාවේ II පරිච්ඡේදයේ 4 වන ඡේදය.

පළාතේ ආණ්ඩුව විසින් ඒ ගම්මානවල ජීවත් වන ජනයාට පිහිට වීමට උත්සුක නොවුණ අවස්ථාවක සමගාමී ලැයිස්තුවට ඇතුළත් කර ඇති සමාජ සේවා හා පුනරුත්ථාපන, ජාතික නිවාස හා ඉදිකිරීම්, කෘෂිකර්ම හා ගොවිජන සේවා, සෞඛ්‍ය වැනි විෂයයනට අදාළ බලතල ක්‍රියාත්මක කොට ඒ ජනතාවට සහන සැලසීමට අවස්ථාව තිබේ.

සමගාමී ලැයිස්තුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඉවත් කළ යුතු බවට හෝ සීමා කළ යුතු බවට හෝ බෙදුම්වාදීන් කියා සිටින්නේ මේ නිසා ය. ඔවුනට අවශ්‍ය වන්නේ මධ්‍යගත ව පිහිටි ශ්‍රී ලංකා රජයට පළාත්බද ජනතාවට ඍජු ව බලපාන විෂයයන් සම්බන්ධයෙන් මැදිහත් වීමට නොහැකි වන පරිදි ආණ්ඩුක්‍රම ව්‍යූහයක් නිර්මාණය කිරීම යි. චන්ද්‍රිකා කුමාරතුංග රජය ගෙනඑනු ලැබූ ව්‍යවස්ථා යෝජනාවල[29] ද සර්ව පාර්ශ්වික නියෝජිත කමිටුව පිළියෙළ කළ බහුතරයේ යෝජනාවලියේ ද සමගාමී ලැයිස්තුව ඉවත් කිරීමට නිර්දේශ කරනු ලැබුවේ මේ හේතුවෙනි.

(2). මධ්‍යම රජය දැනට ක්‍රියාත්මක කරන සංවෘත ලැයිස්තුවේ විෂයයන් සීමා කිරීමට කරන යෝජනාව.[30]

අතුරු වාර්තාව යෝජනා කරන්නේ මධ්‍යම රජයට අයත් විෂයයන් ශ්‍රී ලංකාවේ ස්වෛරීත්වය, භෞමික අඛණ්ඩතාව, ජාතික ආරක්ෂාව හා ආර්ථික ඒකීය භාවය යන විෂයයන් විය යුතු බව යි. මීට කලින් නිකුත් වූ අතුරු වාර්තාවේ ඊට අමතර ව විදේශ කටයුතු, ආගමන/පුරවැසි භාවය, සන්නිවේදන, ජාතික ප්‍රවාහනය, අන්තර්ජාතික වෙළෙඳාම, සමුද්‍රීය කලාප වැනි කාරණාවලට සීමා විය යුතු බව සඳහන් විණි.[31] කෙසේ වෙතත් සංවෘත ලැයිස්තුවේ විෂයයන් සීමා කිරීමේ උත්සාහයක නිරත වන බව නම් පැහැදිලි ය.

සමගාමී ලැයිස්තුව සම්පූර්ණයෙන් ම ඉවත් කිරීමෙන් පසු හෝ සීමා කිරීමෙන් පසු ව හෝ සංවෘත ලැයිස්තුවේ බලතල උතුරු හා නැගෙනහිර සිංහල හා මුස්ලිම් ජනතාවට ඍජු ව බලනොපාන විෂය ක්ෂේත්‍රයනට සීමා කිරීම ඒ පළාත්වල ජීවත් වන සිංහල හා මුස්ලිම් ජනතාවට කරනු ලබන බලවත් අසාධාරණයකි. අතුරු වාර්තා නිර්දේශයන් ගෙන් පැහැදිලි වන කරුණක් වන්නේ සමගාමී ලැයිස්තුව ව්‍යවස්ථාවෙන් ඉවත් කොට නැත හොත් සීමා කොට ඒ බලතල පළාත් සභා ලැයිස්තුවට එක් කිරීමට ගන්නා උත්සාහයට අමතර ව සංවෘත ලැයිස්තුවේ එදිනෙදා ජන ජීවිතයට අදාළ විෂයයන් පළාත් සභා ලැයිස්තුවට එක් කිරීමට තැත් කරන බව ය.

(3). මධ්‍යම රජයේ (සංවෘත ලැයිස්තුවේ) විෂයයන් සම්බන්ධයෙන් විධායක බලය ක්‍රියාත්මක කිරීමට පළාත් රජයට බලය පැවරීමට කරන යෝජනාව

> *"4.3 ජාතික ලැයිස්තුවෙන් තෝරාගත් විෂයයන් හා සම්බන්ධ කාර්යයන් පළාත් සභා විසින් ක්‍රියාත්මක කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් නීති මඟින් අවශ්‍ය විධිවිධාන සලස්වාදිය යුතු ය."*[32]

---

29. 2000 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත පිළිබඳ අධ්‍යයනයක් සඳහා බලන්න: ද සිල්වා, ජනාධිපති නීතිඥ මනොහර ආර්., ***බෙදුම්වාදීන් ගේ උපායමාර්ග හා ව්‍යවස්ථා සංශෝධන***, 2017.
30. අතුරු වාර්තාවේ 11 පරිච්ඡේදයේ 4.2 වගන්තිය
31. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ මෙහෙයුම් කමිටුවේ අතුරු වාර්තාව, 6 පිටුව.
32. මහජන අදහස් විමසීමේ කමිටුවේ නිර්දේශ, 62 පිටුව හා කේන්ද්‍ර - පර්යන්ත සබඳතා උප කමිටු වාර්තාව, 24 හා 25 පිටු.

මීට කලින් 2017 මැයි 3 සැකසූ අතුරු වාර්තා කෙටුම්පතේ මේ යෝජනාව ම මීට වඩා විස්තරාත්මක ව සඳහන් වූයේ මෙ සේ ය:

"6. තෝරාගත් මධ්‍යම විෂයයන් පිළිබඳ නීති ක්‍රියාත්මක කිරීම හැකි සැම අවස්ථාවක ම පළාත්වලට ලබාදීම."

"ජර්මනිය, ඔස්ට්‍රියාව, ස්විස්ටර්ලන්තය ඇතුළු රටවල් ගණනාවක් ජාතික නීති සම්බන්ධයෙන් නියෝජිත කාර්යයන් / ක්‍රියාත්මක කිරීම පළාත්වලට පැවරීමේ හැකියාව පිළිගෙන තිබේ."[33]

"පළාතට / පළාත් පාලන ආයතනය හඳුනාගත් මධ්‍යම නීති සඳහා ක්‍රියාත්මක කිරීමේ ආයතනය බවට පත් කිරීමේ සංකල්පය ගැන එකඟත්වයක් ඇත් නම්, අදාළ ජාතික ලැයිස්තු විෂයයන් වෙන ම හඳුනාගත හැකි යි. උදාහරණයක් වශයෙන් එය 'ජාතික ලැයිස්තුවේ II කොටස' ලෙස දැක්වීමට හෝ පළාත්වලට පරිපාලන බලතල පැවරීමට මධ්‍යම රජයට ඇති හැකියාව පිළිගන්නා ප්‍රතිපාදන සකස් කිරීමට හෝ හැකි වේ. මෙහෙයුම් කමිටුව ඉහත සඳහන් මූලධර්මයට එකඟ විය."[34]

වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සංවෘත ලැයිස්තුවේ ඇති විෂයයන් (මධ්‍යම රජයට පමණක් ක්‍රියාත්මක කළ හැකි විෂයයන්) සම්බන්ධයෙන් 'නීති ක්‍රියාත්මක කිරීම හැකි සැම අවස්ථාවක දී ම පළාත්වලට ලබාදීම' යෝග්‍ය බව එ කී අතුරු වාර්තාව මඟින් නිර්දේශ කෙරිණි. ඒ සඳහා ඔවුන් පාදක කරගන්නේ ජර්මනිය, ඔස්ට්‍රියාව, ස්විස්ටර්ලන්තය යන රටවල් ය. මේ රටවල් ෆෙඩරල් රාජ්‍යයන් ය. මෙයින් පෙනීයන්නේ ශ්‍රී ලංකාව ෆෙඩරල් රාජ්‍යයක් කිරීමට දරන ප්‍රයත්නය යි.

මධ්‍යම රජයේ නීති පළාත් රාජ්‍යයට ක්‍රියාත්මක කිරීමට ඉඩ දීමෙන් අදහස් කරන්නේ සංවෘත ලැයිස්තුවේ විෂයයන් සම්බන්ධයෙන් ද විධායක බලය ක්‍රියාත්මක කිරීමට පළාත් ආණ්ඩුවලට අවස්ථාව දීම යි. මෙය සිදු කර ඇත්තේ මධ්‍යම රජය දුර්වල කොට පළාත් ආණ්ඩු ශක්තිමත් කිරීමට ය.

(4). ජාතික ප්‍රතිපත්තිය පිළිබඳ විෂයය සංවෘත ලැයිස්තුවෙන් ඉවත් කිරීමට කරන යෝජනාව

ජාතික ප්‍රතිපත්ති සංවෘත ලැයිස්තුවෙන් ඉවත් කිරීමට අතුරු වාර්තාව නිර්දේශ කර ඇත්තේ මෙ සේ ය.

"5.2 ජාතික ප්‍රතිපත්තිය

"මෙහෙයුම් කමිටුවේ අදහස වූයේ ජාතික ප්‍රතිපත්තිය අමාත්‍ය මණ්ඩලයට අයත් කාරණයක් බව යි. පහත දැක්වෙන කරුණු ගැන ද අවධානය යොමු කරන ලදි.

"1. ජාතික ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වෙන ම හරයාත්මක ව්‍යවස්ථාවක් තිබිය යුතු ය. මෙය (ව්‍යවස්ථාදායක බලය සම්බන්ධ ව අදාළ වන) සංවෘත ලැයිස්තුවට ඇතුළත් නො කළ යුතු ය."[35]

ජාතික ප්‍රතිපත්ති පිළිබඳ විෂයය සංවෘත ලැයිස්තුවෙන් ඉවත් කිරීමේ අදහස වන්නේ පළාත් සභා විෂය සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්ති පිළිබඳ නීති සැකසීමට වර්තමාන ව්‍යවස්ථාවෙන් මධ්‍යම රජයට දී ඇති අවකාශය නැති කිරීම හෝ සීමා කිරීම හෝ ය.

---

33. මහජන අදහස් විමසීමේ කමිටුවේ නිර්දේශ, 62 පිටුව හා කේන්ද්‍ර - පර්යන්ත සබඳතා උපකමිටු වාර්තාව, 24 හා 25 පිටු.
34. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ මෙහෙයුම් කමිටුවේ අතුරු වාර්තාව, 16 පිටුව.
35. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මෙහෙයුම් කමිටුවේ අතුරු වාර්තාව, 7-8 පිටු.

රටක ජාතික ප්‍රතිපත්ති ඒ රටේ මධ්‍යම රජය විසින් තීරණය කළ යුතු කාර්යයකි. එය පළාත් පාලනය කරනු ලබන ආයතනවලට කළ නොහැකි ය. මේ යෝජනාවේ යටි අරමුණ ශ්‍රී ලංකාව ෆෙඩරල් රාජ්‍යයක් බවට පරිවර්තනය කිරීම බව පැහැදිලි ය.

(5). ආණ්ඩුකාර පදවිය ඉවත් කිරීම හෝ ආණ්ඩුකාරවරයා මහ ඇමති ගේ උපදෙස් මත පත් කිරීම හා ආණ්ඩුකාරවරයාට මහ ඇමති ගේ උපදෙස් මත කටයුතු කිරීමට සැලැස්වීම.[36]

ආණ්ඩුකාරවරයා මධ්‍යම ආණ්ඩුවේ පාලනයෙන් බැහැර කිරීමට කර ඇති යෝජනා මෙ සේ යඃ

"7. ආණ්ඩුකාරවරයා

"මෙහෙයුම් කමිටුව ඉදිරියේ අදහස් ඉදිරිපත් කළ මහ ඇමතිවරුන් කීප දෙනකු ගේ ම මතය වූයේ විධායක බලය අමාත්‍ය මණ්ඩලය සතු විය යුතු බවත්, ආණ්ඩුකාරවරයා චාරිත්‍රානුකූල කාර්යභාරයක් පමණක් ඉටු කළ යුතු බවත් ය. එක් මහ ඇමතිවරයකු කියා සිටියේ ආණ්ඩුකාර පදවිය සම්පූර්ණයෙන් ම අහෝසි කළ යුතු බව යි.

"ආණ්ඩුකාරවරයාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් නිශ්චිත බලතල ලබාදී ඇති අවස්ථාවල දී හැර ඔහු / ඇය විසින් අමාත්‍ය මණ්ඩලයේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු බව මෙහෙයුම් කමිටුවේ අදහස විය.

"ආණ්ඩුකාරවරයා, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු බව මෙහෙයුම් කමිටුවේ අදහස විය."

වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පළාතක ආණ්ඩුකාරවරයා ජනාධිපතිවරයා ගේ නියෝජිතයකු වන අතර ඔහු පත් කරනු ලබන්නේ ජනාධිපතිවරයා ගේ අභිමතය අනුව ය. එ සේ ම වර්තමාන ව්‍යවස්ථාවේ 154 (ආ) (2) වගන්තියට අනුව ආණ්ඩුකාරවරයා කටයුතු කළ යුත්තේ ජනාධිපතිවරයා ගේ විධායක බලයට අනුකූල ව ය. 13 වන සංශෝධනයේ 154 (ආ) (2) වගන්තිය ව්‍යවස්ථාවට හඳුන්වාදෙන ලද්දේ ශ්‍රී ලංකාවේ ඒකීය භාවය තරමක් දුරට හෝ ආරක්ෂා කරගැනීම සඳහා ය. ඒ වගන්තියට අනුව පළාත් ආණ්ඩුවක් නොමනා ලෙස කටයුතු කරන විට ඊට එරෙහි ව යම් පියවරක් ගැනීමට හෝ ඒ නොමනා ක්‍රියාව නැවැත්වීමට හෝ ජනාධිපතිවරයාට පුළුවන.[37] එහෙත් ආණ්ඩුකාරවරයා ජනාධිපති ගේ ලිපියකින් පත් කළ ද, ආණ්ඩුකාරවරයා මහ ඇමති ගේ නාමිකයකු නම් හෝ මහ ඇමතිවරයා ගේ පාලනය යටතේ සිටින්නකු නම් පළාත් ආණ්ඩුවක නොමනා ක්‍රියාවකට එරෙහි ව මධ්‍යම ආණ්ඩුවට පලිහක් විය නොහැකි ය.

ශ්‍රී ලංකාවේ ඒකීය භාවය විනාශ කිරීමට ගෙනඑනු ලැබ ඇති තවත් යෝජනාවකි මෙය.

(6). පළාත් සභා ප්‍රඥප්ති නීතිගත කිරීම සඳහා ආණ්ඩුකාරවරයා ගේ අනුමතිය අවශ්‍ය නොවන පරිදි ව්‍යවස්ථා ප්‍රතිපාදන වෙනස් කිරීම

වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පළාත් සභා නීතියක් නීතිගත වන්නේ ආණ්ඩුකාරවරයා ගේ අනුමතිය ඊට ලැබුණු පසු ය [154 ඌ (1)]. එහෙත් අතුරු වාර්තාව යෝජනා කරන්නේ ආණ්ඩුකාරවරයාට පළාත් සභා නීතියක් අනුමත කිරීම ප්‍රතික්ෂේප කිරීමට නොහැකි වන ක්‍රමවේදයකි.

---

36. අතුරු වාර්තාවේ II පරිච්ඡේදය, 7 වන ඡේදය.

37. 1987 2 SLR 321හි හා 322හි වර්තමාන 13 වන ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය.

ඒ යෝජනාව මෙ සේ යඃ

"8. පළාත් ප්‍රඥප්තිවල ව්‍යවස්ථානුකූල භාවය නිර්ණය කළ යුත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය මඟින් පමණි.

"මෙහෙයුම් කමිටුවේ මතය වන්නේඃ

"ආණ්ඩුකාරවරයාට ප්‍රඥප්තියට අනුමතිය දීමට හෝ නැවත සලකා බැලීම සඳහා ආපසු යැවීමට හෝ කාලයක් (උදා. සති දෙකක්) ලබාදිය යුතු ය. නියමිත කාලය තුළ ඉහත කී පරිදි කිසි දු ක්‍රියාමාර්ගයක් නොගත හොත් ප්‍රඥප්තියට ආණ්ඩුකාරවරයා ගේ අනුමතිය ලැබී ඇතැ යි සලකනු ලැබේ.

"එ වැනි නිර්දේශ අන්තර්ගත කර හෝ කිරීමකින් තොර ව හෝ පළාත් සභාව විසින් අදාළ ප්‍රඥප්තිය සම්මත කළ හොත්, ආණ්ඩුකාරවරයා විසින් ලබාදී ඇති නියමිත කාලය තුළ (උදාඃ සති දෙකක්) ප්‍රඥප්තියට අනුමතිය දීමට හෝ, එහි ව්‍යවස්ථාදායක වලංගු භාවය ගැන සලකා බැලීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයට[38] යොමු කිරීමට හෝ කටයුතු කළ යුතු ය. ඉහත කී පරිදි කිසි දු ක්‍රියාමාර්ගයක් නොගත හොත්, ප්‍රඥප්තියට ආණ්ඩුකාරවරයා ගේ අනුමතිය ලැබී ඇතැ යි සැලකෙනු ලැබේ.

"පළාත් ප්‍රඥප්ති අධිකරණයෙහි විවරණයට යටත් විය යුතු බවට මෙහෙයුම් කමිටුවේ අදහස විය.

"මහජන ප්‍රවේශය සැලසීම සඳහා සියලු ම පනත් හා ප්‍රඥප්තිවලට මධ්‍යම දත්ත සමුදාය පද්ධතියක් පවත්වාගෙනයෑම සහතික කිරීමට පනවන ලද සියලු පළාත් ප්‍රඥප්තිවල පිටපත් ආණ්ඩුකාරවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු බව ද නිර්දේශ කෙරේ."[39]

අධිකරණයට තීරණය කළ හැක්කේ පළාත් සභා නීතියක් ව්‍යවස්ථානුකූල ද නැත් ද යන්න පමණි. එහෙත් ශ්‍රී ලංකා රජයට පළාත් සභාව විසින් සම්මත කරනු ලබන නීතියක් නීති පොතට ඇතුළත් කරන්නේ ද නැත් ද යන්න තීරණය කිරීමේ අභිමතයක් තිබිය යුතු ය. පළාත් සභාවක් සම්මත කරන නීතියක් රාජ්‍යයේ ප්‍රතිපත්තිවලට පටහැණි නම් හෝ ජාතීන් අතර සංහිඳියාවට බාධාවක් වේ නම් හෝ එ වැනි නීතියක් ව්‍යවස්ථානුකූල වුව ද එ වැනි පළාත් සභා නීතියක් නීතිගත වීම වැළැක්වීමට ශ්‍රී ලංකා රජයට හැකි විය යුතු ය.

ශ්‍රී ලංකාවේ සියලු නීති පාර්ලිමේන්තුවේ අධිකාරියට යටත් විය යුතු බව ජාතික ඒකාබද්ධ කමිටුවේ මතය වේ. ඒ අනුව පාර්ලිමේන්තුවට සාමාන්‍ය බහුතර ඡන්දයකින් සම්මත වූ පළාත් සභා නීතියක් අහෝසි කිරීමට හැකි විය යුතු අතර[40] එ සේ සම්මත වීමට පෙර නුසුදුසු නීතියක් සම්මත වීම වැළැක්වීමට ආණ්ඩුකාරවරයාට හෝ ජනාධිපතිවරයාට හෝ හැකි විය යුතු ය.

(7). පළාත් සභා ප්‍රඥප්තිවල ව්‍යවස්ථානුකූලත්වය නිර්ණය කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය නමින් විශේෂ අධිකරයක් ස්ථාපිත කිරීම

ඉහත උපුටා දැක්වුණු පරිදි පළාත් සභා ප්‍රඥප්ති ව්‍යවස්ථානුකූල භාවය පිරික්සීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයක් පිහිටුවීමට අතුරු වාර්තාවෙන් යෝජනා කෙරී ඇත.

---

38. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මෙහෙයුම් කමිටුවේ අතුරු වාර්තාව, II පරිච්ඡේදයේ, 8 වන ඡේදය, 9 පිටුව.

39. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මෙහෙයුම් කමිටුවේ අතුරු වාර්තාව. 9 පිටුව.

40. වර්තමානයේ 2/3 ක බලයක් අවශ්‍ය ය [ව්‍යවස්ථාවේ 154 අ උ (2) හා (3) වගන්ති].

"8. පළාත් ප්‍රඥප්තිවල ව්‍යවස්ථානුකූලත්වය නිර්ණය කළ යුත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයෙන් පමණි."[41]

මෙ තෙක් ශ්‍රී ලංකාවේ නීතිවල ව්‍යවස්ථානුකූල භාවය පිරික්සූ අප ගේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙනුවට පළාත් සභා නීතිවල ව්‍යවස්ථානුකූල භාවය විමර්ශනය කිරීමට වෙන ම අධිකරණයක් අවශ්‍ය වන්නේ මන්දැ යි ප්‍රශ්නයකි. අතුරු වාර්තාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ අධිකරණ අනුකමිටු වාර්තාවේ මේ ගැන වැඩිදුර සඳහන් වේ. ඒ අනුකමිටු වාර්තාවට අනුව ව්‍යවස්ථා අධිකරණ 'ශ්‍රී ලංකාවේ අධිකරණ සංවිධාන ව්‍යුහයට ඇතුළත් නො වේ.'[42] මේ සුවිශේෂ අධිකරණ පිහිටුවනු ලබන්නේ අප ගේ අධිකරණ පද්ධතියේ සිටින අධිකරණ නිලධාරීන් වෙනුවට විදේශීය NGO වුවමනාවනට අනුව කටයුතු කරන දූෂිත පුද්ගලයන් ගෙන් සැදුම්ලත් 'විදේශිකයන් ගේ උවමනාවට වැඩ කරන' අධිකරණයක් මඟින් පළාත් සභාවල බෙදුම්වාදී වුවමනාවන් නීතිගත කිරීමට ය.

(ආ). උතුරු හා නැඟෙනහිර පළාත් ඒකාබද්ධ කිරීමට ප්‍රතිපාදන ඇතුළත් කිරීම මඟින් ෆෙඩරල් රාජ්‍යයක් නිර්මාණය කිරීමට අවශ්‍ය භූමි ප්‍රදේශය නිර්මාණය කිරීම.

13 වන සංශෝධනයෙන් සංශෝධිත වර්තමාන ව්‍යවස්ථාවේ 154 අ (3) වන වගන්තියට අනුව යාබද පළාත් 2ක් එකතු කොට තනි පරිපාලන ඒකකයක් නිර්මාණය කිරීම සඳහා නීතියක් සම්මත කළ හැකි ය.

ඒ අනුව මේ සඳහා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 37 වන වගන්තියේ ප්‍රතිපාදන සලසා ඇත. එ කී වගන්තියට අනුව ජනාධිපතිවරයාට ප්‍රකාශයක් මඟින් පළාත් 2ක් ඒකාබද්ධ කළ හැකි ය. එ වැනි ප්‍රකාශයක් කරනු ලැබූ විටක ඒකාබද්ධ කළ පළාත් තව දුරටත් ඒකාබද්ධ ව තිබිය යුතු ද යන්න තීරණය කිරීම සඳහා ඒ පළාත්වල ජනතාව සහභාගී වන ජනමත විචාරණයක් පැවැත්විය යුතු ය. ඒ ජනමත විචාරණය පවත්වන දිනය කලින් කල කල් දැමීමට ජනාධිපතිවරයාට පුළුවන. මේ අනුව බෙදුම්වාදීනට ගැති NGO නඩවලට නතු වන ජනාධිපතිවරයකුට ඒ ජනමත විචාරණය පැවැත්වීම කල් දමා උතුරු හා නැඟෙනහිර ඒකාබද්ධ කොට ඊනියා දෙමළ ඓතිහාසික නිජභූමිය නිර්මාණය කළ හැකි ය. මේ නිසා ඉහත 154 අ (3) වගන්තිය වහා ව්‍යවස්ථාවෙන් ඉවත් කළ යුතු ය.

අතුරු කමිටු වාර්තාව උතුරු හා නැඟෙනහිර පළාත් ඒකාබද්ධ කිරීමට යෝජනා ඉදිරිපත් කර ඇත. මේ අනුව පළාත් ඒකාබද්ධ කිරීම පිළිබඳ ව මෙහෙයුම් කමිටුව තව දුරටත් සලකා බලන බව පෙනේ. මේ සම්බන්ධ අතුරු කමිටු වාර්තාවේ සඳහන් වන්නේ මෙ සේ ය.

"පළාත් එකතු කිරීම පිළිබඳ ප්‍රතිපාදන සම්බන්ධයෙන් මෙහෙයුම් කමිටුව තව දුරටත් සලකා බැලිය යුතු ව තිබේ. පහත සඳහන් විකල්ප සාකච්ඡා කර ඇත.

- *පළාත් දෙකක් හෝ වැඩි ගණනක් හෝ එක ඒකකයක් ලෙස කටයුතු කිරීම පිළිබඳ ව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ [154අ (3) වැනි ව්‍යවස්ථාවේ] දැනට පවතින ප්‍රතිපාදන,* ***අදාළ පළාත්වල මහජනයා ගේ ජනමත විචාරණයක් ද*** *අවශ්‍ය ය යන අතිරේක අවශ්‍යතාව සමග රඳවාගත යුතු බව.*

- *ඒකාබද්ධ කිරීමක් සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි විධිවිධාන සැලැස්වීම නො කළ යුතු බව.*

41. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මෙහෙයුම් කමිටුවේ අතුරු වාර්තාව, 9 පිටුව.
42. බලන්නඃ අධිකරණය පිළිබඳ අනුකමිටු වාර්තාවේ 5 වන පිටුව.

- *ව්‍යවස්ථාවෙන් උතුරු හා නැගෙනහිර පළාත් එක් ඒකකයක් ලෙස පිළිගත යුතු බව."*[43]

මෙයින් අදහස් වන්නේ උතුරු හා නැගෙනහිර පළාත් ඒකාබද්ධ කිරීමට සහයෝගය දැක්වීමට රජය සූදානම් බව යි. ප්‍රතිපත්තියක් වශයෙන් පළාත් ඒකාබද්ධ කිරීමට රජය විරුද්ධ නොවන බව මෙයින් ගම්‍යමාන වේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 අ (3) වගන්තියට අනුව යාබද පළාත් දෙකක් නැති නම් තුනක් එකතු කොට තනි පරිපාලන ඒකකයක් නිර්මාණය කිරීමට අවශ්‍ය නීති සකස් කළ හැකි ය. මේ වගන්තිය ව්‍යවස්ථාවට ඇතුළත් කරනු ලැබුවේ 13 වන ව්‍යවස්ථා සංශෝධනයෙනි. දෙමළ නිජ භූමියක් නිර්මාණය කිරීම සඳහා ඉඩ සලසන මේ වගන්තිය ව්‍යවස්ථාවෙන් වහා ඉවත් කළ යුතු බව අපි කියා සිටිමු.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම සඳහා ගෙනඑනු ලැබූ 7 වන සංශෝධනය ද මේ අරමුණු ඉටු කරගැනීමට යොදාගත හැකි තවත් ප්‍රතිපාදනයකි. 5 වන වගන්තියේ අතුරු විධානයේ සඳහන් වන්නේ පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් පරිපාලන දිස්ත්‍රික්ක ඒකාබද්ධ කළ හැකි බව යි. මේ අනුව උතුරු පළාතේ පරිපාලන දිස්ත්‍රික්ක නැගෙනහිර පළාතේ පරිපාලන දිස්ත්‍රික්ක හා ඒකාබද්ධ කිරීමට 5 වන වගන්තිය ඉඩ සලසයි. ඒ අනුව 7 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් 1987 දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හඳුන්වාදුන් 5 වන වගන්තියේ අතුරු විධානය ව්‍යවස්ථාවෙන් ඉවත් කළ යුතු බව අපි කියා සිටිමු.

(ඇ). උතුරු හා නැගෙනහිර පළාත් ඒකාබද්ධ කිරීමේ දී උතුරු හා නැගෙනහිර පළාත්වල ජනතාව ගේ එකඟතාවෙන් පමණක් අනුමතිය ලබාගැනීම.

අතුරු වාර්තාවෙන් ඉදිරිපත් කර ඇති තවත් යෝජනාවක් වන්නේ පළාත් ඒකාබද්ධ කිරීමේ දී එ සේ ඒකාබද්ධ කරන පළාත්වල ජනතාව ගේ අනුමතිය පමණක් ජනමත විචාරණයක දී ලබාගැනීම සඳහා ප්‍රතිපාදන සැලසීම යි.

ශ්‍රී ලංකාවේ සැම බිම් අඟලක් ම රටේ සැම පුරවැසියකුට ම අයිති බව අපි තරයේ ප්‍රකාශ කරන අතර මේ නිසා පළාතක ව්‍යුහාත්මක වෙනසක් සිදු කරන්නේ නම් ශ්‍රී ලංකාවේ සමස්ත ජනතාව ගේ ම අනුමතිය ඊට ලැබිය යුතු බව ප්‍රකාශ කරන අතර පළාත් දෙකක ජීවත් වන ජනතාවට පමණක් වෙන ම පරිපාලන ඒකකයක් නිර්මාණය කිරීමට තීරණය කරගත නොහැකි බව කියා සිටිමු. උතුරු හා නැගෙනහිර පළාත්වල ජීවත් වන බෙදුම්වාදයට සහයෝගය දෙන කොටස්වල අවශ්‍යතාවන් ඉටු කිරීමට කටයුතු නො කළ යුතු බව අවධාරණය කරමු.

(ඈ). පළාත් සභාවක නීතියක් අහෝසි කිරීමට හෝ සංශෝධනය කිරීමට හෝ මධ්‍යම ආණ්ඩුවට ඇති අයිතිය දැඩි ලෙස සීමා කිරීම.

වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 උ (3) වගන්තිය අනුව පළාත් සභා නීතිය අහෝසි කිරීමට හෝ සංශෝධනය කිරීමට හෝ පාර්ලිමේන්තුවට හැකි වේ. එහෙත් පළාත් සභාවක නීතියක් 2/3 ඡන්දයකින් අහෝසි කිරීමට පාර්ලිමේන්තුවට ඇති අයිතිය ඉවත් කර ඇති අතර ඊට හේතුව වන්නේ ශ්‍රී ලංකාව ෆෙඩරල් රාජ්‍යයක් බවට පරිවර්තනය කළ යුතු වීම යි. එ සේ ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන සංශෝධනය කිරීමට ද තිබෙන අයිතිය දුර්වල කිරීම සඳහා දෙ වන මන්ත්‍රණ සභාවක් නිර්මාණය කොට ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට හෝ

43. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මෙහෙයුම් කමිටුවේ අතුරු වාර්තාව, 4 පිටුව.

අහෝසි කිරීමට පාර්ලිමේන්තුවේ අනුමතියට අමතර ව දෙ වන මන්ත්‍රණ සභාවේ ද අනුමතිය අවශ්‍ය බවට ද, ඊට අමතර ව ජනමත විචාරණයේ දී ජනතාව ගේ අනුමතිය ලබාගත යුතු බවට ද අතුරු වාර්තාව යෝජනා කරයි.[44]

(ඉ). කැබිනට් ආණ්ඩුක්‍රමයක් ඇති කිරීමේ මුවාවෙන් මධ්‍යම ආණ්ඩුව දුර්වල කිරීම.

වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජාතික ප්‍රතිපත්තිය තීරණය කිරීමේ බලය ඇත්තේ කැබිනට් මණ්ඩලයට ය. එහෙත් ඒ තත්ත්වය වෙනස් කිරීමට යෝජිත ව්‍යවස්ථා කෙටුම්පත කටයුතු කර ඇත. ඒ සම්බන්ධයෙන් කෙටුම්පතේ 33 වන වගන්තිය සකස් කර ඇත්තේ මෙ සේ ය.

44. විශේෂඥයන්ගේ කෙටුම්පත්, 84 වගන්තිය.

පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක බලය දුර්වල කිරීම

කමිටු නිර්දේශවල සඳහන් වන්නේ 'ජාතික ලැයිස්තුවක්' හා 'පළාත් ලැයිස්තුවක්' පමණි. සමගාමී ලැයිස්තුවක් ගැන සඳහන් නොවන්නේ, සමගාමී ලැයිස්තුව ව්‍යවස්ථාවෙන් ඉවත් කිරීමට ගෙන ඇති තීරණය නිසා ය.

එහි නිර්දේශ අනුව මධ්‍යම රජයට නීති සැකසිය හැක්කේ සාමාන්‍යයෙන් ජාතික ලැයිස්තුවේ ඇති විෂයයන් සම්බන්ධයෙන් පමණි (64 වන වගන්තිය). පළාත් ලැයිස්තුවේ විෂයයක් සම්බන්ධයෙන් නීති පැනවීමට නම් සියලු පළාත් සභාවල අනුමතිය තිබිය යුතු ය. නැත් නම්, පාර්ලිමේන්තුවේ හා දෙ වන මන්ත්‍රණ සභාවේ 2/3ක අනුමතිය සමග ජනමත විචාරණයක දී ජනතාව ගේ අනුමතිය ලැබිය යුතු ය (71 වන වගන්තිය).

මෙහි අරමුණ නම්, පළාත් සභාවක් පනවන නීතියක් වෙනස් කිරීමට නොහැකි තත්ත්වයකට පත් කිරීමට ය. පාර්ලිමේන්තුවට තමන් ගේ නීතියක් සංශෝධනය කිරීම හෝ අහෝසි කිරීම බහුතර ඡන්දයකින් කළ හැකි නමුත් පළාත් සභාවක නීතියක් සංශෝධනය කිරීමට හෝ අහෝසි කිරීමට හෝ 2/3ක බහුතර අනුමතිය සමග ජනමත විචාරණයකින් ජනතා අනුමතිය ලබාගැනීම අවශ්‍ය ය. මෙ මඟින් සිදු කර ඇත්තේ පාර්ලිමේන්තුව සම්පූර්ණයෙන් ම බෙලහීන කොට පළාත් ආණ්ඩු ශක්තිමත් කිරීම ය. මෙහි ඍජු ප්‍රතිඵලය ඒ පළාත් වෙන ම රාජ්‍යයක් ලෙස කටයුතු කිරීමට අවස්ථාව උදා වීම ය.

එ සේ ම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට පාර්ලිමේන්තුවේ මෙන් ම දෙ වන මන්ත්‍රණ සභාවේ ද 2/3 බලයක් අවශ්‍ය ය (82 වන වගන්තිය). එ පමණක් නො ව බලය බෙදීම සම්බන්ධ වගන්ති සංශෝධනය කිරීමට හෝ අහෝසි කිරීමට හෝ පර්ලිමේන්තුව හා දෙ වන මන්ත්‍රණ සභාවේ 2/3 බහුතරයකට අමතර ව ජනමත විචාරණයක දී ජනතා අනුමතිය අවශ්‍ය වනු ඇත (84 වගන්තිය). මෙයින් සිදු කර ඇත්තේ බලය බෙදීමට අදාළ වගන්තිය පළාත් සභා නොමනා ලෙස ක්‍රියාත්මක කරන්නේ වුව ද, සංශෝධනය කිරීම හෝ අහෝසි කිරීම ප්‍රායෝගික ව කළ නොහැකි තත්ත්වයකට පත් කිරීම ය.

දෙ වන මන්ත්‍රණ සභාව

මෙහෙයුම් කමිටුවේ අතුරු වාර්තාවෙන් දෙ වන මන්ත්‍රණ සභාවක් පිහිටුවීමට යෝජනා කර ඇත. මේ ආයතනයෙන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ නීති සම්පාදක බලය සීමා කිරීමක් සිදු වනු ඇත.

අතුරු වාර්තාවේ යෝජනා කර ඇති අන්දමට දෙ වන මන්ත්‍රණ සභාව විස්තර කරන්නේ මෙ සේ යː

"1. ප්‍රධාන වශයෙන් පළාත්වලට නියෝජනයක් ලැබෙන ආකාරයට දෙ වැනි මන්ත්‍රණ සභාවක් ස්ථාපිත කළ යුතු ය යි පොදු එකඟතාවක් දක්නට තිබිණි."

"2. දෙ වැනි මන්ත්‍රණ සභාව සාමාජිකයන් 55 දෙනකු ගෙන් සමන්විත විය යුතු ය යන පදනම මත ඒ සෑම පළාත් සභාවලින් ද (පැවරිය හැකි තනි ඡන්ද පදනම මත ඒ සෑම පළාත් සභාවක් ම සාමාජිකයන් 5 දෙනකු නම් කිරීම මඟින්) හා තනි පැවරිය හැකි ඡන්ද පදනම මත පාර්ලිමේන්තුවෙන් තෝරා පත් කරන සාමාජිකයන් 10 දෙනකු ද විය

යුතු ය යි යෝජනා වී තිබේ. ඒ සාමාජිකයන් 10 දෙනා මහජනතාව අතර හෝ වෘත්තීය වශයෙන් දස්කම් විදහා පෑ, කීර්තිමත් හා අවංක භාවයෙන් යුතු පුද්ගලයන් විය යුතු ය.

"3. සාමාන්‍ය නීති ප්‍රතික්ෂේප කිරීමේ බලයක් දෙ වැනි මන්ත්‍රණ සභාවට නො තිබිය යුතු නමුත්, සාමාන්‍ය නීති නැවැත සලකා බැලීම සඳහා පාර්ලිමේන්තුවට ආපසු යැවිය හැකි වේ. පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමෙන් පසු දෙ වන වර කියවීමට පෙර ඒ පිළිබඳ ව අදහස් විමසීම සඳහා දෙ වැනි මන්ත්‍රණ සභාවට යැවිය යුතු ය.

"4. පහත දක්වා ඇති නෛතික බලතලවලට අමතර ව, දෙ වන මන්ත්‍රණ සභාව මඟින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හෝ නීතියෙන් නියම කරනු ලබන අධීක්ෂණ හා අනිකුත් කාර්යයන් ඉටු කළ හැකි වේ.

"5. විශේෂ (2/3) බහුතරයක් සහිත ව පාර්ලිමේන්තුව හා දෙ වැනි මන්ත්‍රණ සභාව යන දෙකෙන් ම සම්මත වී නැත් නම්, කිසි ම ව්‍යවස්ථා සංශෝධනයක් සම්පාදනය නො විය යුතු ය.

ජනමත විචාරණ අවශ්‍යතාව මතු වී ඇත් නම්, ජනමත විචාරණයක දී ද මහජනයා ගෙන් අනුමත වීමෙන් තොර ව ඒ සංශෝධනය නීතියක් බවට පත් නො වේ.

"6. මූලික අයිතිවාසිකම් හා බලය බෙදා හැරීම ඇතුළු ව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික ලක්ෂණ ව්‍යවස්ථා සංශෝධනයන් මඟින් අනුමත කිරීමේ දී, එ වන් සංශෝධනයන් අතිරේක ව්‍යවස්ථා සුරැකියාවන් ආකාරයෙන් හැරුණු විට, සම්මත කළ නොහැකි වන්නේ ය."[45]

ඉහත යෝජනාවලින් ඉටු කරගැනීමට අපේක්ෂා කරන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට දෙ වන මන්ත්‍රණ සභාවේ 2/3ක අනුමතිය අනිවාර්ය කිරීම වේ.

වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ (13 වන සංශෝධනයෙන් සංශෝධිත පරිදි) බලය බෙදීම පිළිබඳ ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන සංශෝධනය කිරීමට හේ අහෝසි කිරීමට හෝ පළාත් සභාවක නීතියක් සංශෝධනය කිරීමට හෝ අහෝසි කිරීමට හෝ පාර්ලිමේන්තුවේ 2/3ක බලයක් අවශ්‍ය වේ.[46] දෙ වන මන්ත්‍රණ සභාවක් යෝජනා කර ඇත්තේ ඒ මන්ත්‍රණ සභාවේ ද 2/3ක බලයක් ලබාගැනීම අනිවාර්ය කිරීම මඟින් පාර්ලිමේන්තු බලය තව දුරටත් බාල්දු කිරීමට ය. ඔවුන් එ තැනින් නවතින්නේ නැත. ඊට අමතර ව අදාළ පළාත් සභාව නියෝජනය කරන කණ්ඩායමේ බහුතරයක ද අනුමතිය ලබාගත යුතු බව මීට කලින් ඉදිරිපත් කළ 2017 මැයි 3 අතුරු කමිටු වාර්තා කෙටුම්පතින් යෝජනා කෙරිණි. මේ යෝජනා ශ්‍රී ලංකාවේ ඒකීය භාවය විනාශ කරන යෝජනා වේ.

මේ නිසා මේ යෝජනා සම්පූර්ණයෙන් ම ප්‍රතික්ෂේප කළ යුතුවා පමණක් නො ව 13 වන ව්‍යවස්ථා සංශෝධනයේ 154 උ (2) හා (3) වන වගන්ති වහා ව්‍යවස්ථාවෙන් ඉවත් කර ශ්‍රී ලංකාවේ ඒකීය භාවය නැවැත ස්ථාපනය කළ යුතු ව ඇත.

---

45. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ මෙහෙයුම් කමිටුවේ අතුරු වාර්තාව, 20 පිටුව.
46. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 උ (2) හා (3) වගන්ති.

විධායකය දුර්වල කිරීම

(අ). විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම

විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමට පොදු එකඟතාවක් ඇති බව අතුරු වාර්තා කෙටුම්පතේ සඳහන් වේ.[47]

1987 වන තෙක් ශ්‍රී ලංකාවේ පැවැතියේ පිවිතුරු ඒකීය රාජ්‍ය ක්‍රමයකි. 1972 දී සම්මත කරගත් පළමු වන ජනරජ ව්‍යවස්ථාව යටතේ ඒකීය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වූයේ කැබිනට් ආණ්ඩු ක්‍රමයකි. 1977 දී ඒ පළමු වන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙනඑනු ලැබූ දෙ වන ව්‍යවස්ථා සංශෝධනයෙන් ශ්‍රී ලංකාවට විධායක ජනාධිපති ක්‍රමය හඳුන්වාදෙනු ලැබී ය. ඉන් පසු ව 1978 දී සම්මත කරගත් දෙ වන ජනරජ ව්‍යවස්ථාවේ ද විධායක ජනාධිපති ක්‍රමය ඇතුළත් විය. මෙ සේ හඳුන්වාදුන් විධායක ජනාධිපති ක්‍රමය පිළිබඳ නොයෙක් විවේචන එල්ල වී තිබුණ ද 1987 දී ෆෙඩරල් හෝ අර්ධ ෆෙඩරල් හෝ ආකෘතියක් හඳුන්වාදුන් 13 වන ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරගැනීමත් සමඟ ම රාජ්‍යයේ පැවැත්ම සඳහා විධායක ජනාධිපති ක්‍රමයක අවශ්‍යතාව පැහැදිලි විය.

1977ට පෙර පැවැති කැබිනට් ආණ්ඩුක්‍රමය යටතේ යම් විෂය ක්ෂේත්‍රයක් පිළිබඳ තීරණ ගන්නා දේශපාලන අධිකාරිය කැබිනට් අමාත්‍යවරයෙකි. 1987ට පෙර දෙ වන ජනරජ ව්‍යවස්ථාව යටතේ ද ජනාධිපතිවරයා විධායක බලය ක්‍රියාත්මක කළ යුතු ව තිබුණේ ස්වකීය අමාත්‍යවරුන් හරහා ය. එහෙත් 13 වන සංශෝධනය යටතේ මධ්‍යම රජයේ කැබිනට් මණ්ඩලයට අමතර ව විධායක බලය ක්‍රියාත්මක කරන පළාත් සභා මන්ත්‍රීවරුන් ගෙන් සංයුක්ත පළාත් අමාත්‍ය මණ්ඩල පිහිටුවා ඇත. කැබිනට් මණ්ඩලය පාර්ලිමේන්තුවට වග කිව යුතු නමුත් පළාත් තුළ පිහිටුවා ඇති අමාත්‍ය මණ්ඩල පාර්ලිමේන්තු පාලනයෙන් මුක්ත ව ක්‍රියාත්මක වේ. ඔවුන් වග කිව යුත්තේ නම් වගකිව යුත්තේ තමන් ගේ පළාත් සභාවට පමණි.

13 වන සංශෝධනයෙන් හඳුන්වාදී ඇති රාජ්‍ය ව්‍යූහය තුළ පළාත් සභා ලැයිස්තුවේ විෂයයක් සම්බන්ධ ව විධායක බලය ක්‍රියාත්මක කරන්නේ ආණ්ඩුකාරවරයා සහ පළාත් අමාත්‍ය මණ්ඩලය ය. කැබිනට් මණ්ඩලයට ඒ ලැයිස්තුවේ විෂයයක් සම්බන්ධ ව මැදිහත් විය නොහැකි ය. පළාත් සභා විෂයයක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට කැබිනට් මණ්ඩලයේ අමාත්‍යවරුනට නොහැකි අතර පළාත් අමාත්‍ය මණ්ඩලයක නොමනා ක්‍රියාවකට එරෙහි ව යම් තරමක් දුරට හෝ කටයුතු කළ හැක්කේ ජනාධිපතිවරයාට පමණි. මේ නිසා විධායක ජනාධිපති ක්‍රමය සම්පූර්ණයෙන් ම ඉවත් නො කළ යුතු බව අප ගේ මතය යි.

13 වන සංශෝධනයේ 154 ආ (2) වගන්තිය ඇතුළත් කරනු ලැබ ඇත්තේ පළාත් සභාවලට ඉහළින් විධායක බලය ක්‍රියාත්මක කිරීමට ජනාධිපතිවරයාට අවස්ථාව සලසාදීම සඳහා වේ. ඒ වගන්තියට අනුව පළාතක ආණ්ඩුකාරවරයකු ස්වකීය විධායක බලය ක්‍රියාත්මක කළ යුත්තේ ජනාධිපතිවරයා ගේ විධායක බලයට යටත් ව ය. 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ශ්‍රී ලංකාවට හඳුන්වාදුන් ව්‍යූහය තුළ ජනාධිපති ක්‍රමයක පැවැත්ම මේ නිසා වැදගත් වේ.

47. විශේෂඥ කමිටුව විසින් පිළියෙළ කර ඇති කෙටුම්පතෙන් ද විධායක ජනාධිපති ක්‍රමය ඉවත් කර ඇති අතර ඒ වෙනුවට අගමැතිවරයා ගේ උපදෙස් මත කටයුතු කරන ජනාධිපතිවරයකු ආදේශ කර ඇත (18 වගන්තිය). එ කී කෙටුම්පතට අනුව ජනාධිපතිවරයා තෝරාගන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් හා දෙ වන මන්ත්‍රණ සභාවේ මන්ත්‍රීවරුන් එකතු ව ඔවුන් ගේ බහුතර කැමැත්ත මත ය.

සැම විට ම විධායක බලය ජනාධිපති සතු විය යුතු යැ යි නියමයක් නැත. ජනතාවට අවශ්‍ය නම් ඒ බලය රජයේ කැබිනට් මණ්ඩලයට තනි ව හෝ කැබිනට් මණ්ඩලයට හා ජනාධිපති යන දෙකට ම හෝ ලබාදිය හැකි ය. 1972 දී පළමු ජනරජ ව්‍යවස්ථාව පැනවීමේ දී ශ්‍රී ලංකාව අනුගමනය කළ ක්‍රියා පිළිවෙත එය යි. එහෙත් බෙදුම්වාදීනට අවශ්‍ය වන්නේ මෙය නො වේ. ජනතාව සතු විධායක බලය ජනාධිපති හා කැබිනට් මණ්ඩලයට පැවරීමට ඔවුන් එකඟ නැත. ඔවුනට අවශ්‍ය විධායක බලය කැබිනට් මණ්ඩලය හා පළාත් අමාත්‍ය මණ්ඩලය අතර බෙදාදීම යි.

2000 මුල් කාලයේ දී ජනාධිපති ධුරය අහෝසි කිරීම සඳහා ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතු බවට විශාල ජනමතයක් ගොඩ නැගෙමින් තිබිණි. 2000 ව්‍යවස්ථා කෙටුම්පත සම්මත කරගැනීමට උත්සාහ කළේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. 2000 වසරේ දී රජය ඉදිරිපත් කළ ව්‍යවස්ථා කෙටුම්පතේ දැක්වූයේ විධායක බලය මධ්‍යම රජයත්, පළාත් රජෙයෙනුත් වෙන් වෙන් ව ක්‍රියාත්මක කළ යුතු බව යි. ව්‍යවස්ථා කෙටුම්පතේ 2. (2) (ආ) සමඟ කියැවෙන 65 (1) වගන්තියේ සඳහන් වූයේ ජනාධිපතිවරයා මධ්‍යම ආණ්ඩුව සතු විධායක බලය කැබිනට් මණ්ඩලයේ උපදෙස් මත ද, ආණ්ඩුකාරවරයා පළාත් ආණ්ඩුව සතු විධායක බලය පළාත් අමාත්‍ය මණ්ඩලයේ උපදෙස් මත ද ක්‍රියාත්මක කළ යුතු බව ය.

බෙදුම්වාදීනට අවශ්‍ය වන්නේ 2000 අගෝස්තු කෙටුම්පතේ යෝජනා කළ පරිදි ජනතාව සතු විධායක බලය මධ්‍යම ආණ්ඩුව හා පළාත් ආණ්ඩුව අතර බෙදා වෙන් කිරීමට ය. ජනාධිපති සතු විධායක බලය ඔහු ගෙන් ඉවත් කිරීමෙන් පසු ඒ බලය සම්පූර්ණයෙන් කැබිනට් මණ්ඩලය වෙත ප්‍රදානය කිරීමට ඔවුන් ගේ මනාපයක් නැත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව හරහා බහුතර ජනයා බෙලහීන කිරීම

(1) ව්‍යවස්ථා සභාව හා එහි සංයුතිය

මෙහෙයුම් කමිටු අතුරු වාර්තාව මඟින් ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් පිහිටුවීම යෝජනා කර ඇත. ඒ යෝජනාව මෙ සේ ය.

> *"1. මෙහෙයුම් කමිටුවේ මතය වන්නේ නියමිත පරිදි ඉහළ මට්ටමේ රාජ්‍ය හා අධිකරණ නිලධාරීන් මෙන් ම, ස්වාධීන කොමිෂන් සභාවල සාමාජිකයන් පත් කිරීමට ද 19 වැනි සංශෝධනය යටතේ පිහිටුවා ඇති ආකාරයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් ස්ථාපිත කළ යුතු බව යි."*

> *"2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සංයුතිය/ අනුපාතය (පාර්ලිමේන්තු මන්ත්‍රීන්: පාර්ලිමේන්තු මන්ත්‍රීන් නොවන අය) පිළිබඳ ව තීරණය කළ යුතු ව ඇත. ඒ අනුපාතය නිල බලයෙන් පත් වන මන්ත්‍රීවරු 3 දෙනකු ද, මන්ත්‍රී නොවන පුද්ගලයන් 7 දෙනකු ද වශයෙන් විය යුතු යැ යි යෝජනා කරනු ලැබේ"[48]*

ඉහත යෝජනාවලින් සංස්ථාපනය කිරීමට අපේක්ෂිත ව්‍යවස්ථා සභාව 19 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ පිහිටුවා ඇති ව්‍යවස්ථා සභාවට ව්‍යුහාත්මක වශයෙන් සමාන ව්‍යවස්ථා සභාවක් බව පෙනේ.

පසුගිය දින විශේෂඥ කමිටු වාර්තාවෙන් ද යෝජනා කර ඇත්තේ 11 දෙනකු ගෙන් යුත් ව්‍යවස්ථා සභාවක් ය.[49] 19 වන සංශෝධනය යටතේ ස්ථාපිත

---

48. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මෙහෙයුම් කමිටුවේ අතුරු වාර්තාව, මැතිවරණ ක්‍රමය, 26 පිටුව.
49. විශේෂඥයන් ගේ කෙටුම්පත 72 පිටුව.

කළ ව්‍යවස්ථා සභාවේ සිටින දස දෙනාට අමතර ව දෙ වන මන්ත්‍රණ සභාවේ කථානායක ද ව්‍යවස්ථා සභාවේ සාමාජිකයකු කිරීමට යෝජනා කර ඇත.

19 වන සංශෝධනය යටතේ පිහිටුවා ඇති ව්‍යවස්ථා සභාවේ බහුතරයක් සාමාජිකයන් පත් කරනු ලබන්නේ අගමැති හා විපක්ෂ නායක විසිනි. ව්‍යවස්ථා සභාවේ ඡන්ද බලය ඇති සාමාජිකයන් 9 දෙනා ගෙන් හත් දෙනෙක් අගමැති හෝ විපක්ෂ නායක සහ ඔවුන් ගේ නාමිකයෝ ය.

මේ අනුව වර්තමාන ව්‍යවස්ථා සභාවේ සංයුතිය තීරණය කරන්නේ කොළඹ දිස්ත්‍රික්කයේ පර්ලිමේන්තු මන්ත්‍රී අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාත් තිරිකුණාමල මන්ත්‍රී ආර්. සම්බන්ධන් මහතාත් ය. මේ අනුව ශ්‍රී ලංකාවේ ඉහළ රාජ්‍ය නිලධාරීන් හා අධිකරණ නිලධාරීන් පත් කිරීමේ අයිතිය මේ දෙ පළ වෙත ප්‍රදානය කර ඇත. රටේ බහුතරයක් (50%) විසින් තෝරා පත් කරගන්නා ජනාධිපතිවරයා ගේ පත්වීම්වලට වඩා මේ ක්‍රියාපිළිවෙළ සුදුසු යැ යි කියාපෑවත් එය සත්‍ය නොවන බව පැහැදිලි ය.

බටහිර බලවේගවල න්‍යාය පත්‍රවලට අනුව වැඩ කරන අයට අවශ්‍ය වූයේ රාජ්‍යතාන්ත්‍රික පත් කිරීම් ක්‍රියාවලියෙන් බහුතර ජාතිය ඈත් කිරීම ය. අතුරු වාර්තාවට අනුව පළාත් රාජ්‍ය සේවා කොමිසමේ ද පළාත් පොලිස් කොමිසමේ ද සාමාජිකයන් පත් කිරීම සිදු කළ යුත්තේ පළාත් සභාවේ මහ ඇමති හා එහි විපක්ෂ නායක ගේ එකඟත්වයෙනි. එ සේ එකඟත්වයෙන් යෝජනා කරනු ලබන තැනැත්තන් ගේ නම් අනුමත කිරීමට ව්‍යවස්ථා සභාව බැඳී සිටී. එ සේ නොවන්නේ සුදුසු පුද්ගලයන් නොමැති බව ඔවුන් ගේ මතය වන විටක පමණි.

මේ සම්බන්ධයෙන් අතුරු වාර්තාවේ 9.1 (ආ) වගන්තිය පහත උපුටා දක්වමු.

"9.1 පළාත් රාජ්‍ය සේවා කොමිසම

"(ආ) පළාත් රාජ්‍ය සේවා කොමිසමේ සාමාජිකයන් පත් කිරීම සඳහා පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂ නායකයා විසින් එක් ව නම් යෝජනා කළ යුතු ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් එ කී නාම යෝජනා අනුමත කළ යුතු වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් එ කී නාම යෝජනා අනුමත කළ යුතු වන අතර, ඉන් පසු ව ආණ්ඩුකාරවරයා විසින් ඒ පත්වීම් කළ යුතු ය."

පළාත් පොලිස් කොමිෂන් සභා සම්බන්ධයෙන් 2017 සැප්තැම්බර 21 වන දින නිකුත් කළ අතුරු වාර්තාවේ සඳහන් නොවූව ද පසුගිය දින විශේෂඥයන් ඉදිරිපත් කළ කෙටුම්පතේ ඒ සම්බන්ධ ප්‍රතිපාදන ඇතුළත් කරනු ලැබිණි.[50] ඒ නිර්දේශිත ප්‍රතිපාදනවලට අනුව පළාත් පොලිස් කොමිෂන් සභාවට පත් කිරීම් සිදු කළ යුත්තේ මහජනයා ගෙන් හා පළාත් සභාවේ මහ ඇමති හා එහි විපක්ෂ නායකයා ගේ නිර්දේශ සැලකිල්ලට ගැනීමෙනි. එහෙත් ජාතික පොලිස් කොමිෂන් සභාවට පත් කිරීම් සිදු කිරීමේ දී මහජන අදහස් සැලකිල්ලට ගනු නො ලැබේ.

මධ්‍යම ආණ්ඩුව විසින් කරනු ලබන පත් කිරීම් සම්බන්ධයෙන් තම අදහස් ප්‍රකාශ කිරීමට සුළු ජාතිකයනට අවස්ථාව තිබේ. වර්තමාන ව්‍යවස්ථා සභාවේ එක් සාමාජිකයකු පත් කරන්නේ කුඩා පක්ෂවල (ඒ බොහොමයක් සුළු ජාතික පක්ෂ වේ) මන්ත්‍රීන් ගේ එකඟත්වයෙනි. එ සේ ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සංයුතිය බහුත්ව ලක්ෂණ පෙන්නුම් කළ යුතු බව ව්‍යවස්ථාවේ 41 අ (4) වන වගන්තියේ සඳහන් ය. එ සේ ම ව්‍යවස්ථා සභාව විසින් නානාවිධ කොමිෂන් සභාවලට සාමාජිකයන් පත් කිරීමේ දී බහුත්ව ලක්ෂණ පිළිබිඹු වන බව වග බලාගැනීමට ප්‍රයත්න දැරිය යුතු බව 41 ආ (3) වගන්තියේ සඳහන් වේ. ඒ අනුව

50. විශේෂඥ වාර්තාව, 20 වගන්තිය.

කොමිෂන් සභාවලට සාමාජිකයන් පත් කිරීමේ දී සුළු ජාතික නියෝජනයක් පවත්වාගෙනයාම සඳහා ප්‍රතිපාදන සලසා ඇත.

එහෙත් අතුරු වාර්තාවේ යෝජනාවලට අනුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට හෝ පළාත් පොලිස් කොමිෂන් සභාවට හෝ සාමාජිකයන් තෝරා පත් කරගැනීමේ දී පළාතේ සුළු ජාතික නියෝජනයක් යෝජනා කර නැත. මේ අනුව උතුරු පළාතේ පොලිස් කොමිෂන් සභාවේ සාමාජිකයන් තිදෙනා (13 වන සංශෝධනයට අනුව තිදෙනෙකි) අතරින් කිසිවකු සිංහල හෝ මුස්ලිම් හෝ විය යුතු නැත.

අතුරු වාර්තාවට අනුව පළාත් රාජ්‍ය කොමිෂන් සභාවට පත් කිරීම කරනු ලබන්නේ මහ ඇමති හා විපක්ෂ නායක ගේ එකඟත්වයෙනි. එ සේ ම පළාත් පොලිස් කොමිෂන් සභාවට පත් කිරීම් කරනු ලබන්නේ පළාතේ මහ ඇමති හා පළාතේ විපක්ෂ නායක ගේ නිර්දේශ සැලකිල්ලට ගනිමිනි. උතුරු පළාතේ මහ ඇමති ද විපක්ෂ නායක ද අනිවාර්යයෙන් ම දෙමළ ජාතිකයන් වනු ඇත. ඔවුන් ගේ දේශපාලනික හැදියාවන් ගැන කල්පනා කරන විට සිංහලයකු හෝ මුස්ලිම් භක්තිකයකු හෝ උතුරු පළාතේ පොලිස් කොමිෂන් සභාවට පත් කරනු ඇතැ යි අපේක්ෂා කළ නොහැකි ය. ඒ අනුව උතුරු පළාත් පොලිස් කොමිෂන් සභාව 100% දෙමළ ජාතික කොමිෂන් සභාවක් වනු ඇති අතර ජාතික පොලිස් කොමිෂන් සභාව බහුත්ව ලක්ෂණ සහිත පොලිස් කොමිෂන් සභාවක් වනු ඇත. ශ්‍රී ලංකාවේ පිළිගත් ජනවර්ග 8කි. ඒ අනුව ජාතික පොලිස් කොමිෂන් සභාවේ සිංහල නියෝජනය සුළු ප්‍රතිශතයක් වීමට ඉඩ ඇති අතර උතුරු පළාතේ පොලිස් කොමිෂන් සභාව 100% දෙමළ නියෝජනයක් සහිත වනු ඇත.

පසුගිය දින ව්‍යවස්ථා සභාව විසින් පත් කරන ලද අතුරුදහන් වූ තැනැත්තන් ගේ කාර්යාලයට පත් කළ සාමාජිකයන් හත් දෙනා ගෙන් බෞද්ධ වන්නේ එක් අයකු පමණි.

අතුරු වාර්තාවේ 9.1 (ඌ), (එ), (ඒ) වගන්තිවලට අනුව අමාත්‍යාංශ ලේකම්වරුන් ද, දෙපාර්තමේන්තු ප්‍රධානයන් ද, පළාත් අමාත්‍ය මණ්ඩලයේ උපදෙස් මත ආණ්ඩුකාරවරයා විසින් ද, ප්‍රධාන ලේකම්වරයා, ප්‍රධාන අමාත්‍යවරයා ගේ එකඟත්වයට යටත් ව ජනාධිපතිවරයා විසින් ද පත් කරනු ලැබේ.

මෙයින් පෙනීයන්නේ ඉතා ම උපායශීලී ලෙස පළාත් ආණ්ඩුවත් මධ්‍යම ආණ්ඩුවෙන් ස්වායත්ත ව කටයුතු කිරීමට ඉඩ සලසා ඇති බවත් මේ අනුව ආණ්ඩුකාරවරයා ද, සියලු පළාත් නිලධාරීන් ද අමාත්‍ය මණ්ඩලයට රිසි පරිදි පත් කරගැනීම හරහා උතුරු හා නැඟෙනහිර පළාත්වල වෙන ම රජ්‍යයක් ඇති කිරීමට බෙදුම්වාදීන් කටයුතු කරගෙන ඇති බව යි.

ව්‍යවස්ථා අධිකරණය

ව්‍යවස්ථා අධිකරණය සම්බන්ධ පරිච්ඡේදයක් හෝ ව්‍යවස්ථා අධිකරණය යනු කුමක් ද එහි සංයුතිය කෙ බඳු ද යන කරුණු කිසිවක් හෝ මෙහෙයුම් කමිටුවේ අතුරු වාර්තාවේ සඳහන් නොවන නමුත් ව්‍යවස්ථා අධිකරණයක් පිහිටුවීම සඳහා මෙහෙයුම් කමිටුවේ අධිකරණ, මූලික අයිතිවාසිකම් හා මධ්‍ය-පර්යන්ත අනුකමිටු නිර්දේශ කර ඇති බව අතුරු වාර්තාවේ සඳහන් වේ.[51] ශ්‍රී ලංකා රාජ්‍යයේ අනාගත පැවැත්ම සම්බන්ධ තීරණාත්මක අර්ථ කථන හා තීන්දු තීරණ දීමේ ක්‍රියාවලියෙන් ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රධාන අප ගේ අධිකරණ පද්ධතිය ම ඉවත් කොට ව්‍යවස්ථා අධිකරණයට පැවරීමට අදහස් කරන බව අතුරු වාර්තාවෙන් පැහැදිලි ව පෙනේ.

පසුගිය දින මෙහෙයුම් කමිටුවේ විශේෂඥයන් විසින් පිළියෙළ කළ ව්‍යවස්ථා කෙටුම්පතට අනුව ශ්‍රේෂ්ඨාධිකරණයට ඉහළින් ව්‍යවස්ථා අධිකරණය නමින් නව අධිකරණයක් ස්ථාපිත කිරීමට යෝජනා වී ඇත.[52] එ කී යෝජනාවලට අනුව ව්‍යවස්ථාධිකරණය විනිශ්චයකාරවරුන් 7 දෙනකු ගෙන් සංයුක්ත[53] වන අතර ඔවුහු ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබති. මේ ව්‍යවස්ථාධිකරණයේ විනිශ්චයකාරවරුන් වරකට අවුරුදු 5ක් සඳහා[54] පත් කරනු ලබන අතර නැවැත පත්වීමක් ලැබීමට සුදුසුකම් ලබයි.[55] ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් ගේ විශ්‍රාම යන වයස 65ක් ලෙස මේ යෝජනාවල සඳහන් වුව ද ව්‍යවස්ථාධිකරණයේ විනිශ්චයකාරවරුන් ගේ උපරිම වයස් සීමාවක් නිර්දේශ කර නැත. මෙයින් සිදු වන්නේ විශ්‍රාම යන වයසට පැමිණෙන ශ්‍රේෂ්ඨාධිකරණ හෝ අභියාචනාධිකරණ හෝ විනිසුරුවරයකු ව්‍යවස්ථාධිකරණයට පත් කිරීමට හැකි වීම යි. මෙය අධිකරණයේ ස්වාධීනත්වයට බලවත් පහරකි. විශ්‍රාම යාමට ආසන්න ව සිටින විනිසුරුවරයකු ගේ අනාගතය තීරණය කිරීමට විධායකයට මේ නිසා අවස්ථාව උදා වනු ඇත. එය විනිසුරුවරුන් ගේ ස්වාධීනත්වයට වන අයුතු බලපෑමකි.

එ සේ ම අධිකරණ පද්ධතිය තුළ නොසිටි පුද්ගලයනට රාජ්‍යයේ ඉහළ ම අධිකරණය වන ව්‍යවස්ථාධිකරණයට පත් වීමට අවස්ථාව මේ නිසා ඉඩ සැලසෙන අතර, ව්‍යවස්ථා සභාවේ සංයුතිය හා එහි ක්‍රියාකාරිත්වය සැලකීමේ දී මේ ව්‍යවස්ථාධිකරණය NGO විසින් පාලනය කරන ව්‍යවස්ථාධිකරණයක් වීමට ඉඩ ප්‍රස්තාව සැලසෙනු ඇති බව සඳහන් කරන්නේ කනගාටුවෙනි.

ව්‍යවස්ථාධිකරණයේ බලතල අතරට පහත සඳහන් බලතල ඇතුළත් වේ.

(1). ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීම.

(2). පාර්ලිමේන්තුව සම්මත කිරීමට නියමිත හා සම්මත වූ නීති මෙන් ම පළාත් සභා සම්මත කරන නීතිවල ව්‍යවස්ථානුකූල භාවය විමර්ශනය කිරීම

51. බලන්නඃ අතුරු ව්‍යවස්ථාවේ 7 වන පිටුව. ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ අධිකරණ අනුකමිටු වාර්තාවට අනුව (5 වන පිටුව) මේ ව්‍යවස්ථා අධිකරණය, 'ශ්‍රී ලංකාවේ අධිකරණ සංවිධාන ව්‍යුහයට ඇතුළත් නො වේ.

52. 113 වන වගන්තිය.

53. එහි ම 120 වගන්තිය.

54. 120 (10) වන වගන්තිය.

55. එහෙත් ව්‍යවස්ථාධිකරණයේ සභාපතිවරයාට එරෙහි ව කරන චෝදනා විමර්ශනය කිරීමට බලය ඇත්තේ ශ්‍රී ලංකාවේ අධිකරණයට හෝ පොදුරාජ්‍ය මණ්ඩලයේ රාජසභා විනිසුරුවරුනට ය. එය මේ රටේ ස්වාධිපත්‍යය බටහිර බලවේගවලට උකස් කිරීමක් බව කිව යුතු ය.

(3). ඔවුන් ගේ තීන්දු නැවැත විමසුමට ලක් කිරීම.

(4). මධ්‍යම රජය හා පළාත් අතර ඇති ආරවුල් විසඳීමට කටයුතු කිරීම.

(5). නීතිය මඟින් ව්‍යවස්ථාධිකරණය වෙත පැවරෙන වෙනත් බලතල.

සාමාන්‍යයෙන් ඉහත බලතල සියල්ල වර්තමානයේ ක්‍රියාත්මක කරන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අගවිනිසුරු පත් කරන එහි විනිසුරුවරු 3 දෙනකු විසිනි. ඒ විනිශ්චයකරුවන් කවුරුන් ද යන්න පිළිබඳ තීරණය කිරීමට විධායකයට අවස්ථාවක් නැත. එහෙත් ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමට මෙන් ම මධ්‍යම රජය හා පළාත් රජයන් අතර ආරවුල් විසඳීම එන්.ජී.ඕ.කරුවන් ගෙන් ගහන ව්‍යවස්ථා සභාවක් විසින් පත් කරන සුවිශේෂ ව්‍යවස්ථාධිකරණයකට පැවැරීම යෝජනා කරන්නේ කවර අරමුණකින් ද යන්න තේරුම් ගැනීම අපහසු නො වේ.

මේ රටේ ව්‍යවස්ථාව අර්ථ කථනය කිරීම මෙන් ම පාර්ලිමේන්තු හා පළාත් සභා අණ-පනත්වල ව්‍යවස්ථානුකූල භාවය නිර්ණය කිරීම ද අප ගේ ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉවත් කර රටට, ජනතාවට වග නොකියන එන්.ජී.ඕ. නඩ අතට පත් කිරීමට දරන මේ ප්‍රයත්නය සහමුලින් ම පරාජය කළ යුතු ව ඇත.

රාජ්‍ය ඉඩම් සම්බන්ධ බලය

(1) ඉඩම් පිළිබඳ බලය මධ්‍යම රජය හා පළාත් රාජ්‍යය අතර බෙදීම

රාජ්‍ය ඉඩම් භාවිතය පිළිබඳ යෝජිත විධිවිධාන අතුරු වාර්තාවේ III කොටසේ 'රාජ්‍ය ඉඩම්' යටතේ දැක්වේ. එහි රජයේ ඉඩම් භාවිතය පිළිබඳ 8, 9, 10 හා 11 වන වගන්ති සලකා බැලීම වැදගත් වේ:

> *"8. ජාතික ඉඩම් හා ජල භාවිත ප්‍රතිපත්තියට යටත් ව, නියමිත නෛතික ක්‍රියාවලියට අනුකූල ව,* ***ජාතික ලැයිස්තුවේ සඳහන් කර ඇති විෂයයන් හා කාර්යයන් සම්බන්ධයෙන්*** *ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරම්භ වන අවස්ථාවේ මධ්‍යම රජයට එහි ආයතන හෝ ඕනෑ ම රාජ්‍ය සංස්ථාවකට රාජ්‍ය පාලනය යටතේ ඇති හෝ නතු කරගත් හෝ ඉඩම්, කේන්ද්‍රය විසින් භාවිතයට ගත හැකි වේ.*
>
> *"9. පළාත් ලැයිස්තුවේ ඇති ඕනෑ ම විෂයයක් හෝ කාර්යයක් සඳහා භාවිතයට ගැනීම සඳහා ඉහත සඳහන් ඕනෑ ම රජයේ ඉඩමක් නිදහස් කරගැනීමට පළාත් පරිපාලනයට මධ්‍යම රජය සමඟ සාකච්ඡා කොට ඉල්ලා සිටීමට හැකි වේ.*
>
> *එ වැනි ඉඩමක් නිදහස් කිරීම මධ්‍යම රජය ප්‍රතික්ෂේප කරන අවස්ථාවල දී 14, 15 සහ 16 යන ඡේදවල දක්වා ඇති ප්‍රතිපාදන අදාළ වේ.*
>
> *"10. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරම්භ කිරීමට පෙර පවරාගත් හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරම්භ වන විට ජනරජයට හිමිකම් ඇති, අගනුවර භූමි භාගය තුළ පිහිටා ඇති රජයේ ඉඩම් භාවිත කිරීමට කේන්ද්‍රයට හිමිකම් තිබේ.*
>
> ***"11. පළාත තුළ ඇති අන් සියලු ම රාජ්‍ය ඉඩම් භාවිතයට ගැනීමට සෑම පළාතකට ම හිමිකම් ඇති අතර එ වැනි රාජ්‍ය ඉඩම් පහත දැක්වෙන කරුණුවලට යටත් විය යුතු ය.***
>
> *(අ). ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වීමට අත්‍යාසන්නයේ ඒ ඉඩමේ නීත්‍යනුකූල පදිංචිය හෝ අයිතිය හෝ සතු වූ ඕනෑ ම පුද්ගලයකු විසින් භුක්ති විඳින ලද අයිතිවාසිකම්; හා*
>
> *(ආ). මේ පරිච්ඡේදයේ දක්වා ඇති ප්‍රතිපාදනවලට යටත් ව,* ***පළාත් ලැයිස්තුවේ දක්වා ඇති කරුණු සඳහා පළාත් පරිපාලනයට ඒ ඉඩම් භාවිත කළ හැකි අතර අදාළ ලිඛිත නීතියට අනුකූල ව හා ජාතික ඉඩම් භාවිත ප්‍රතිපත්තියට යටත් ව ඉඩම් භුක්තිය, ඉඩම් විකිණීම හා අන්සතු කිරීම, ඉඩම් පරිහරණය, ඉඩම්වල පදිංචි කරවීම හා ඉඩම් වැඩිදියුණු කිරීම ඇතුළු ව ඉඩම් කෙරෙහි හෝ ඉඩම් විෂයයෙහි ඇති අයිතිවාසිකම් සඳහා හෝ හිමිකමක් ඇත."***[56]

මේ අනුව මධ්‍යම රජයට රාජ්‍ය ඉඩම් භාවිත කළ හැකි වන්නේ ජාතික (සංවෘත) ලැයිස්තුවේ සඳහන් විෂයයන් සම්බන්ධයෙන් පමණි. පළාතක ඇති අන් සියලු ඉඩම් පළාත් රජය සතු වන අතර පළාත් සභා ලැයිස්තුවේ කටයුතු සඳහා ඒ ඉඩම් උපයෝගී කරගත හැකි ය.

---

56. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මෙහෙයුම් කමිටුවේ අතුරු වාර්තාව, III පරිච්ඡේදය.

ජාතික ලැයිස්තුවේ ඇති කාරණා උතුරු නැඟෙනහිර පළාත්වල ජනතාවට ඍජු ව අදාළ වන කාරණා නොවන නිසා උතුර හා නැඟෙනහිර පළාත්වල සිංහල ජනතාවට ඍජු ව අදාළ වන විෂය පළාත් සභා ලැයිස්තුවට ඇතුළත් වන හෙයින් ඒ සම්බන්ධයෙන් තීන්දු තීරණ ගැනීම පළාත් ආණ්ඩුවට පැවරෙන අතර, උතුරු හා නැඟෙනහිර පළාත්වල සිංහල ජනතාවට ඉඩම් කැබැල්ලක් වත් ලබාදීමට මධ්‍යම ආණ්ඩුවට නොහැකි වීමේ අවදානමක් මේ නිසා ඇති වනු නොඅනුමාන ය.

එ සේ ම සමගාමී ලැයිස්තුවක් පිළිබඳ ඉහත වගන්තිවල කිසි දු සඳහනක් නොමැති වීමට හේතුව වී ඇත්තේ සමගාමී ලැයිස්තුව ව්‍යවස්ථාවෙන් ඉවත් කිරීමට යෝජනා වී ඇති නිසා ය.

රජයේ ඉඩම් ව්‍යවස්ථාවේ තිබෙන ලැයිස්තු පදනම් කරගෙන මධ්‍යම රජය හා පළාත් රජය අතර බෙදා වෙන් කිරීම රාජ්‍යයේ ඒකීය භාවයට හානිකර බැවින් ඉහත යෝජනා ඇතුළු ව වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය හරහා ඇතුළත් කළ විධිවිධාන අපි ප්‍රතික්ෂේප කර සිටිමු.

(2). ජනාවාස පිහිටුවීමේ දී සිංහල ජනතාවට සිදු කෙරෙන වෙනස්කම්

ජනාවාස පිහිටුවීම සම්බන්ධයෙන් 13 වන ඡේදයේ දැක්වෙන්නේ මෙ සේ ය:[57]

> *"13. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරම්භ වීමෙන් පසු ජනාවාස පිහිටුවීමේ වැඩසටහන්වල ප්‍රමුඛතාව දිය යුත්තේ **දිස්ත්‍රික්කයේ ඕනෑ ම උපකොට්ඨාසයක නීතියෙන් පිළිගන්නා ලද ඉඩම් නැති පුද්ගලයනට වන අතර, ඊ ළඟට දිස්ත්‍රික්කයේ ඉඩම් රහිත පුද්ගලයනට ද ඉන් පසු පළාතේ පුද්ගලයනට ද යනුවෙනි."***

මේ අනුව ඉඩම් බෙදාදීමේ දී අදාළ දිස්තිරික්ක උපකොට්ඨාසයේ ඉඩම් නැති පුද්ගලයනට පළමු ව ද, දිස්තිරික්කයේ ඉඩම් නොමැති තැනැත්තනට දෙ වනු ව ද, ඉන් පසු පළාතේ පුද්ගලයනට ද ඉඩම් බෙදාදිය යුතු ය. **මෙයින් පැහැදිලි වන්නේ පළාතෙන් පිටත සිටින ජනතාවට ඉඩම් ඉල්ලා සිටීමේ අයිතිය අහිමි කර ඇති බව යි.**

උතුරු හා නැඟෙනහිර පළාත් දෙක සාපේක්ෂ වශයෙන් ශ්‍රී ලංකාවේ ජනගහන ඝනත්වය අඩු පළාත් දෙකකි. එ නම් අනාගත ජනාවාස පිහිටුවීම සඳහා සුදුසු පළාත් දෙකකි. එහි ඇති ඉඩම් පළාතේ ජනතාවට පමණක් ලබාදීම මඟින් කිරීමට උත්සාහ ගෙන ඇත්තේ බණ්ඩාරනායක-චෙල්වනායගම් හා ඩඩ්ලි-චෙල්වනායගම් වර්ගවාදී ගිවිසුම්වලට එහා ගිය වර්ගවාදී ව්‍යූහයක් නිර්මාණය කිරීම යි.

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පුද්ගලයන් පදිංචි කිරීමේ දී ජාතික ජන අනුපාතයට අනුව පුද්ගලයන් තෝරාගැනීම කළ යුතු ය. එහෙත් ඒ පිළිවෙත මේ යෝජනාවලින් වෙනස් කර ඇත.

---

57. අතුරු වාර්තාවේ III පරිච්ඡේදය, 12-17 පිටු.

XIV වන පරිච්ඡේදය

මැතිවරණ ක්‍රමය

මැතිවරණ ක්‍රමය මිශ්‍ර මන්ත්‍රී සමානුපාතික ක්‍රමයක් විය යුතු යැ යි අතුරු වාර්තාව යෝජනා කරයි.

> *"1. මැතිවරණ ක්‍රමය, අවසාන ප්‍රතිඵලයේ සමානුපාතික බව (ආසන වෙන් කිරීම) තහවුරු කරන මෙන් ම, ඍජු ව ම මැතිවරණ කොට්ඨාසවලින් පත් වන (එ වැනි මන්ත්‍රීන් මැතිවරණ කොට්ඨාසයට වග කීම සහතික කරන) මිශ්‍ර මන්ත්‍රී සමානුපාතික ක්‍රමයක් විය යුතු ය."*[58]

මැතිවරණ කොට්ඨාසයට වග කියන මන්ත්‍රීවරයකු ආසනවලින් තේරී පත් වන ක්‍රමයක් නිර්දේශ කිරීම ඵලදායී නමුදු අවසාන ප්‍රතිඵලයේ සමානුපාතික බව ඒ ලෙස ම තහවුරු කරන ප්‍රතිඵලයක් නිර්මාණය වන ආකාරයට සමානුපාතික ආසන වෙන් කිරීමෙන් සිදු වන්නේ එක දු පක්ෂයකට හෝ පෙරමුණකට හෝ පාර්ලිමේන්තු බලය ලබාගත නොහැකි තත්ත්වයක් නිර්මාණය වීම යි. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ අරමුණ වන්නේ බහුතරයේ කැමැත්ත මත සමාජය පාලනය කළ හැකි නියෝජනයක් සැකසීම ය. මේ නිසා සිදු කළ යුතු ව ඇත්තේ සමානුපාතික ව වෙන් කරන ආසන මුළු ඡන්ද ප්‍රතිඵලයේ අනුපාතයට වෙන් කිරීම මිස අවසාන ප්‍රතිඵලයේ සමානුපාතික බව තහවුරු කිරීමට යෑම නො වේ.

එ නමුත් සෑම ඡන්ද දායකයකුට ම තමන් ගේ ආසනයේ අපේක්ෂකයාට අමතර ව තමා කැමැති පක්ෂය සඳහා වෙන ම ඡන්දයක් ප්‍රකාශ කිරීමේ අවස්ථාව දීම ඔස්සේ මේ යෝජනාවලිය සැකසූවන් බලාපොරොත්තු වන්නේ සාධාරණ නියෝජනයක් සහිත ස්ථාවර පාර්ලිමේන්තුවක් වෙනුවට භේද-භින්න වුණු දුර්වල පාර්ලිමේන්තුවක් නිර්මාණය කිරීම බව පෙනේ. ඡන්දය ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් අතුරු වාර්තාවේ ඇති යෝජනා මෙ සේ යඃ

> *"9. සෑම ඡන්දදායකයකුට ම ඡන්ද දෙකක් ලැබෙන අතර ඒ දෙක ම එක ම පත්‍රිකාවක අඩංගු වනු ඇත."*
>
> *"මෙයින් එක් ඡන්දයක් තනි මන්ත්‍රී කොට්ඨාසයේ (හෝ බහු මන්ත්‍රී කොට්ඨාසයේ) අපේක්ෂකයා සඳහා වන අතර අනික් ඡන්දය පක්ෂය සඳහා වේ."*[59]

1977න් පසු ක්‍රියාත්මක වූ සමානුපාතික ඡන්ද ක්‍රමයේ ප්‍රධාන නිෂේධනීය ප්‍රතිඵලයක් වූයේ එ මඟින් දිස්ත්‍රික්කයේ ම විසිරුණු ඡන්ද එකතු කර ප්‍රතිශත සාදාගැනීමේ අභිලාෂයන් මත ජනවර්ග, ආගම්, කුල ආදි ලෙස පමණක් නො ව ආදිශිෂ්‍ය ආදි විකාරරූපී පදනම් මත ද ජන සමාජය භේද-භින්න කිරීමේ ප්‍රවණතා ඉස්මතු වීම ය. තමන් ගේ ආසනයේ නියෝජිතයා තේරීමට ඡන්දයක් දෙනවා වෙනුවට තමන් ගේ අභිමතය පරිදි නියෝජිතයා වෙනුවෙන් භාවිත කරන ඡන්දයට අමතර ව පක්ෂය වෙනුවෙන් තවත් ඡන්දයක් ප්‍රකාශ කිරීමට ඉඩ දීම මඟින් සිදු වනුයේ යළිත් වරක් සමාජ භින්නතාවන් වඩාත් තීව්‍ර කරන සාධකයක් බවට අප ගේ මැතිවරණ ක්‍රියාවලිය පත් වීම ය. මීට අමතර ව අනුපාත ගණනය කරන ඒකකය අතීතයේ පටන් මෙ රට ජනයාට හුරුපුරුදු වී තිබෙන දිස්ත්‍රික්කය වෙනුවට පළාත බවට පත් කිරීමට කටයුතු කර ඇත.

---

58. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මෙහෙයුම් කමිටුවේ අතුරු වාර්තාව, මැතිවරණ ක්‍රමය, 21 පිටුව.
59. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ මෙහෙයුම් කමිටුවේ අතුරු වාර්තාව, මැතිවරණ ක්‍රමය, 6 පිටුව.

"5. සමානුපාතික නියෝජනය (PR) අනුපූරක ආසන පළාත් හා/හෝ ජාතික මට්ටම් අනුව වෙන් කෙරෙනු ඇත."[60]

මෙ මඟින් කෙරෙනුයේ ජනවර්ගය, ආගම, කුලය ආදි පදනම් මත නිර්මාණය වූ කුඩා පක්ෂවලට පළාත් තුළ සමානුපාතික ඡන්ද අනුපාත අනුව තමන් ගේ නියෝජිතයන් පත් කරගැනීමේ බල පොරයක් නිර්මාණය වීම ය. මේ ඡන්ද ක්‍රමය හේතු වනු ඇත්තේ තව තවත් සමාජ ඉරිතැළීම් මතු ව තහවුරු වීමට ය. විවිධ ආකාරයෙන් බෙදුණු දූර්වල මොන ම පක්ෂයකට වත් ස්ථාවර රජයක් පිහිටුවිය නොහැකි දූර්වල පාර්ලිමේන්තුවක් බිහි වීම මේ මැතිවරණ ක්‍රමයේ අනිවාර්ය ප්‍රතිඵලයක් වනු ඇත. මේ තත්ත්වය තුළ ව්‍යවස්ථා සංශෝධනයට හෝ පළාත් සභාවක නීතියක් අත්හිටුවීමට හෝ අවශ්‍ය කෙරෙන 2/3ක බහුතරය අප ගේ පාර්ලිමේන්තුවට කිසි විටෙකත් ලබාගත නොහැකි වනු ඇත.

මැතිවරණ ක්‍රමය පිළිබඳ අතුරු වාර්තාව ඉදිරිපත් කර ඇති යෝජනා 11 අතර පහත සඳහන් යෝජනාව සලකා බැලීම වැදගත් වේ.

"6. පුද්ගලයන් අවතැන් වීමේ හේතුවෙන් ඇති වූ විෂමතා හානි පූරණය කිරීම සඳහා නියමිත කාලයකට උතුරු පළාතට අතිරේක ආසන නියමිත සංඛ්‍යාවක් වෙන් කරනු ඇත."[61]

ඉහත යෝජනාව දෙමළ ජාතික සන්ධානයට තම මන්ත්‍රීවරුන් සංඛ්‍යාව වැඩි කරගැනීම සඳහා නිර්ලජ්ජිත ව කර ඇති යෝජනාවකි. උතුරේ දෙමළ ත්‍රස්තවාදීන් ගේ ජනවාර්ගික විශුද්ධි කිරීම් ඇරඹීමට පෙර යාපනය දිස්ත්‍රික්කයේ පමණක් විසි දහස ඉක්මවූ සිංහල ජනතාවක් ජීවත් විය. මුස්ලිම් ජනයා ලක්ෂ ගණනක් යාපනය දිස්ත්‍රික්කයෙන් පලවාහැරි බව ප්‍රකට ය.

60. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ මෙහෙයුම් කමිටුවේ අතුරු වාර්තාව,මැතිවරණ ක්‍රමය, 6 පිටුව.

61. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මෙහෙයුම් කමිටුවේ අතුරු වාර්තාව, 23 පිටුව.

XV වන පරිච්ඡේදය

ජාතික ආරක්ෂාවට වන බලපෑම

(අ). 13 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ නීති තත්ත්වය

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් හඳුන්වාදුන් පළාත් සභා ක්‍රමය පිළිබඳ ව ඇති ප්‍රධාන ගැටලුව පළාත් රාජ්‍යයෙන් වෙන් වී යෑමට ඇති ඉඩකඩ යි. මේ අභියෝගයට යම් තරමකට හෝ මුහුණ දීම සඳහා 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට විධිවිධාන ගණනාවක් ඇතුළත් කරනු ලැබිණි. ඒ වගන්ති සමහරක් මෙ සේ යඃ

"154 එ. (1) අත්‍යවශ්‍ය සැපයුම් සහ සේවා පවත්වාගෙනයාමට තර්ජනයක් එල්ල වී තිබීමේ හෝ යුද්ධයක් හෝ විදේශ ආක්‍රමණයක් හෝ සන්නද්ධ කැරැල්ලක් හෝ නිසා ශ්‍රී ලංකාවේ ආරක්ෂාවට තර්ජනයක් එල්ල වී තිබීමේ හේතුව මත මහජන ආරක්ෂක ආඥාපනතේ හෝ මහජන ආරක්ෂාව සම්බන්ධයෙන් තත්කාලයේ බලපවත්නා නීතිවල විධිවිධාන ක්‍රියාත්මක කරන ප්‍රකාශනයක් ඒ ආඥාපනතේ හෝ නීති හෝ යටතේ කරනු ලැබූ විට, යම් ආණ්ඩුකාරවරයකු විසින් ක්‍රියාත්මක කළ යුතු විධායක බලය ක්‍රියාත්මක කළ යුතු වන ආකාරය සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් ඒ ආණ්ඩුකාරවරයාට විධාන නිකුත් කළ හැක්කේ ය. ඒ විධාන ඒ ප්‍රකාශනය කිරීම සඳහා හේතු වශයෙන් එහි දක්වා ඇති හේතුවලට අදාළ විය යුත්තේ ය.

පැහැදිලි කිරීමඃ

අත්‍යවශ්‍ය සැපයුම් සහ සේවා පවත්වාගෙනයාමට තර්ජනයක් එල්ල වී ඇති බව හෝ යුද්ධයක් හෝ විදේශ ආක්‍රමණයක් හෝ සන්නද්ධ කැරැල්ලක් හෝ නිසා ශ්‍රී ලංකාවේ හෝ එහි දේශයේ යම් කොටසක හෝ ආරක්ෂාවට තර්ජනයක් එල්ල වී ඇති බව ප්‍රකාශ කරමින් මහජන ආරක්ෂක ආඥාපනත යටතේ ප්‍රකාශනයක්, ඒ අන්තරාය අත්‍යාසන්න බවට ජනාධිපතිවරයා සෑහීමට පත් වේ නම් ඒ සේවා සහ සැපයුම් ඇත්ත වශයෙන් ම ඇණහිටීමට හෝ ඒ යුද්ධය හෝ ආක්‍රමණය හෝ කැරැල්ල හෝ ඇත්ත වශයෙන් ඇති වීමට පළමු ව ජනාධිපතිවරයා විසින් කළ හැක්කේ ය.ඃ

එ සේ වුව ද, එ වැනි යම් ප්‍රකාශනයක් ශ්‍රී ලංකාවේ යම් කොටසක පමණක් ක්‍රියාත්මක ව පවතින අවස්ථාවක, මේ ව්‍යවස්ථා යටතේ විධාන නිකුත් කිරීමට ජනාධිපතිවරයා සතු බලය අත්‍යවශ්‍ය සැපයුම් හා සේවා පවත්වාගැනීමට හෝ ශ්‍රී ලංකාවේ ආරක්ෂාව ස්ථිර කිරීම සඳහා හෝ යෝග්‍ය වේ නම් සහ එ සේ යෝග්‍ය වන තාක් දුරට, ඒ ප්‍රකාශනය ක්‍රියාත්මක ව පවතින පළාත නොවන පළාතකට ද ව්‍යාප්ත විය යුත්තේ ය.

(2). මහජන ආරක්ෂක ආඥාපනත හෝ මහජන ආරක්ෂාවට අදාළ ව තත්කාලයේ හෝ බලපවත්නා නීතිය යටතේ හෝ කරන ලද ප්‍රකාශනයක් සියලු ම කාර්ය සඳහා තීරණාත්මක විය යුතු අතර එය කිසි ම අධිකරණයක දී ප්‍රශ්න කරනු නො ලැබිය යුත්තේ ය. තව ද ඒ ප්‍රකාශනය පිළිබඳ ව හෝ ප්‍රකාශනය කිරීමේ හේතු පිළිබඳව හෝ ඒ හේතු පවතින්නේ ද යන්න පිළිබඳ ව හෝ මේ ව්‍යවස්ථාව යටතේ දෙන ලද යම් විධානයක් පිළිබඳ ව හෝ කිසි ම අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් විසින් හෝ විභාග කිරීම, මතයක් ප්‍රකාශ කිරීම හෝ වෙනත් යම් ආකාරයකින් ප්‍රශ්න කිරීම හෝ කරනු නො ලැබිය යුත්තේ ය."

මේ අනුව අත්‍යාවශ්‍ය සැපයුම් හා සේවා පවත්වාගෙනයෑමට තර්ජනයක් එල්ල වී තිබීම නිසාවෙන් හෝ යුද්ධයක් හෝ විදේශීය ආක්‍රමණයක් හෝ සන්නද්ධ කැරැල්ලක් හෝ නිසා ශ්‍රී ලංකාවේ ආරක්ෂාවට තර්ජනයක් එල්ල වූ විටක මහජන ආරක්ෂක පනත හරහා යම් පළාතක ආණ්ඩුකාරවරයකු ඒ පළාතේ විධායක බලය කෙසේ ක්‍රියාත්මක කළ යුතු ද යන්න පිළිබඳ ව විධානය කිරීමට ජනාධිපතිවරයාට හැකි ය. එ සේ කිරීම සඳහා අවශ්‍ය සාධයක වූයේ ශ්‍රී ලංකාවේ ආරක්ෂාව පිළිබඳ තර්ජනයක් අත්‍යාසන්න ව පවතින බවට ජනාධිපතිවරයා සෑහීමකට පත් වීම යි. ඉහත 154 එ වගන්තියේ පැහැදිලි කිරීමේ විශේෂයෙන් සඳහන් වන්නේ ඒ සේවා හා සැපයුම් ඇත්ත වශයෙන් ම ඇණහිටීමට හෝ යුද්ධය, ආක්‍රමණය නැති නම් කැරැල්ල ඇත්ත වශයෙන් ම ඇති වීමට හෝ පළමු ව ජනාධිපතිවරයාට ඊට මැදිහත් විය හැකි බව යි.

මෙහි දී විශේෂයෙන් සඳහන් කළ යුතු වන්නේ ඇත්ත වශයෙන් ම සේවා සහ සැපයුම් ඇණහිටීමක් හෝ යුද්ධයක් ආක්‍රමණයක් නැති නම් කැරැල්ලක් ඇති වීමට හෝ පළමු ව අවශ්‍ය පියවර ගැනීමට ජනාධිපතිවරයාට බලය තිබීම යි.

(ආ). 2000 ව්‍යවස්ථා කෙටුම්පතෙහි විධිවිධාන

එහෙත් 2000 ව්‍යවස්ථාව කෙටුම්පත් කළ විධිවිධානවලින් ජනාධිපති සතු මේ අභිමතය සීමා කිරීමට යෝජනා කෙරිණි. 2000 කෙටුම්පතේ ප්‍රතිපාදනවල දැක්වෙන්නේ ජනාධිපතිවරයාට මහජන ආරක්ෂක පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට, 'ජනරජයේ එක්සත් භාවයට හා ස්වෛරී භාවයට **පැහැදිලි හා විද්‍යමාන අන්තරායක් පෙන්නුම්** කරන සන්නද්ධ කැරලි, කෝලාහල, බරපතළ අභ්‍යන්තර කලබල හෝ පළාත් පාලනාධිකාරියේ යම් ක්‍රියාවක් හෝ නොකරහැරීමක් හෝ නිසා පළාතක ආරක්ෂාවට හෝ මහජන යථා පැවැත්මට හෝ තර්ජනයක්' තිබිය යුතු වීම යි.

මේ අනුව ත්‍රස්ත ප්‍රහාරයක දී හෝ ආණ්ඩුව පෙරළීමට කුමන්ත්‍රණය කරන අවස්ථාවක දී හෝ ඒ බව බුද්ධි අංශ වාර්තා කර තිබුණ ද ජනාධිපතිවරයාට හදිසි නීතිය ක්‍රියාත්මක කළ නොහැකි ය. එ සේ කළ හැකි වන්නේ අන්තරාය මතුපිටින් විද්‍යමාන වූ පසු ව පමණි.

මේ ප්‍රතිපාදන රටේ ජාතික ආරක්ෂාවට බරපතළ තර්ජනයකි. 2000 ව්‍යවස්ථාව කෙටුම්පතේ 220 වන වගන්තියේ මෙය විස්තර වන්නේ මෙ සේ ය:

> *"220 (1) ජනරජයේ එක්සත් භාවයට සහ ස්වෛරී භාවයට* ***පැහැදිලි හා විද්‍යමාන අන්තරායක්*** *පෙන්නුම් කරන සන්නද්ධ කැරලි, කෝලාහල, බරපතළ අභ්‍යන්තර කලබල හෝ පළාත් පාලනාධිකාරයේ යම් ක්‍රියාවක් හෝ නොකරහැරීමක් නිසා පළාතක ආරක්ෂාවට හෝ මහජන යථා පැවැත්මට තර්ජනයක් පවත්නා බව, අග්‍රාමාත්‍යවරයා විසින් දෙන ලද උපදෙස් අනුව ජනාධිපතිවරයා ගේ මතය වන අවස්ථාවක, මහජන ආරක්ෂාවට අදාළ නීතියේ විධිවිධාන ඒ පළාතේ බලාත්මක කරන්නා වූ ප්‍රකාශනයක් ජනාධිපතිවරයා විසින් කරනු ලැබිය හැක්කේ ය."*

13 වන සංශෝධනයේ කලින් සඳහන් 154 ඒ වගන්තිය යටතේ ජනාධිපතිවරයා කරන ලද විධානයකට අනුකූල ව කටයුතු කිරීමට ආණ්ඩුකාරවරයා හෝ යම් පළාත් සභාවක් හෝ පැහැර හැර ඇති විටක ඒ පළාතේ පරිපාලනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූල ව තීරණය කළ හැකි ය. එ වැනි අවස්ථාවක දී පළාතේ පරිපාලනය ජනාධිපතිවරයාට පවරාගැනීමට හෝ පාර්ලිමේන්තුව මඟින් ක්‍රියා කිරීමට හෝ අවකාශය ලැබෙන පරිදි ප්‍රකාශනයක් නිකුත් කිරීමට ජනාධිපතිවරයාට බලය ලැබේ. එ වැනි ප්‍රකාශනයක් කරනු ලැබූ විට දින 14ක්

ඇතුළත පාර්ලිමේන්තු අනුමතිය ලබාගත යුතු ය. එ සේ අනුමතිය ලැබූ ප්‍රකාශයක බලපෑම මාස දෙකකින් අවසන් වන නමුත් අවුරුද්දක කාල සීමාවකට වැඩි නොවන කාල සීමාවක් සඳහා දීර්ඝ කරනු ලැබිය හැකි ය. මෙ සේ ජනාධිපතිවරයා විසින් නිකුත් කර ඇති ප්‍රකාශනයක් අවුරුද්දක කාල සීමාවකින් පසු අවසාන වන නමුත් නැවත එ වැනි ප්‍රකාශනයක් කිරීමට බාධාවක් නැත. මේ අනුව පළාත් සභාවක් රාජ්‍යයේ ආරක්ෂාවට තර්ජනයක් වන පරිදි කටයුතු කරන අවස්ථාවක ඊට මැදිහත් වීමට ජනාධිපතිවරයාට බලය තිබේ. ජනාධිපති සතු මේ බලය සීමා කිරීම බෙදුම්වාදීන් ගේ තවත් අවශ්‍යතාවකි. ඉහත සඳහන් පරිදි 2000 කෙටුම්පතේ, අන්තරාය විද්‍යමාන විය යුතු බව බෙදුම්වාදීන් සඳහන් කළේ මේ නිසා ය.

(ඇ). අතුරු කමිටු වාර්තාවේ වර්තමාන නිර්දේශ

අතුරු කමිටු වාර්තාවේ නිර්දේශය බොහෝ සෙයින් 2000 අගෝස්තු මස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ ව්‍යවස්ථා කෙටුම්පතේ ප්‍රතිපාදනවලට සමාන ය.

ඒ නිර්දේශයන් මෙ සේ යඃ

*"XXX. පළාත් පරිපාලනයක් විසින් සන්නද්ධ කැරලි ගැසීමක් හෝ අරගලයක් ප්‍රවර්ධනය කරන්නා වූ තත්ත්වයක් පැන නැගී ඇත් නම් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව චේතනාන්විත ව උල්ලංඝනය කිරීමක් තුළින් හෝ, ජනරජයේ භෞමික අඛණ්ඩතාව හෝ පරමාධිපත්‍යයට **පැහැදිලි සහ විද්‍යමාන අනතුරක්** ඇති කෙරෙන්නේ නම් ජනාධිපතිවරයා අග්‍රාමාත්‍යවරයා ගේ උපදෙස් මත ප්‍රකාශනයක් මඟින්-*

(අ) පළාත් පරිපාලනයේ සියලු හෝ යම් කර්තව්‍යයන් සහ පළාත් ආණ්ඩුකාරවරයා, ප්‍රධාන අමාත්‍යවරයා, අමාත්‍ය මණ්ඩලය හෝ යම් ආයතනයක් හෝ අධිකාරියක් වෙත පවරා ඇති හෝ විසින් ක්‍රියාත්මක කළ හැකි බලතල සියල්ල හෝ ඉන් සමහරක් ජනාධිපතිවරයා වෙත පවරාගත හැකි ය; සහ

(ආ) මේ ඡේදයේ (අ) අනුඡේදය යටතේ බලතල ඵලදායී ව ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය වන විට දී, පළාත් සභාව විසුරුවා හැරිය හැකි ය.

(ඇ) ඒ ප්‍රකාශනය කිරීම සඳහා හේතු, ප්‍රකාශනයේ ඇතුළත් විය යුතු ය.

එ වැනි ප්‍රකාශනයක් පාර්ලිමේන්තුවේ අනුමතියට සහ අධිකරණ සමාලෝචනයට යටත් විය යුතුය."[62]

මේ අනුව මේ අතුරු කමිටු වාර්තාව ද නිර්දේශ කරන්නේ ජනාධිපතිතුමාට මැදිහත් වීමට **පැහැදිලි හා විද්‍යමාන අනතුරක්** තිබිය යුතු බව යි.

වර්තමාන ව්‍යවස්ථාවට අනුව අන්තරාය පැහැදිලි හා විද්‍යමාන වීම අවශ්‍ය නො වේ. එ වැනි තත්ත්වයක් උත්සන්න වීමට ආසන්න නම් ඒ තත්ත්වය ඇති වීමට පෙර බුද්ධි අංශවලින් ලැබෙන තොරතුරු මත ජනාධිපතිවරයාට මැදිහත් විය හැකි ය.

මේ අතුරු කමිටු නිර්දේශය පරිදි ව්‍යවස්ථාව සංශෝධනය කළ හොත් අන්තරාය සිදු වීමට පෙර ඊට ප්‍රතිකර්ම යෙදීම උගහට වනු ඇත.

62. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මෙහෙයුම් කමිටුවේ අතුරු වාර්තාව, 27 පිටුව.

නීතිය හා සාමය - මහ ඇමති පාලනය කරන පොලිසි නිර්මාණය කිරීම

13 වන සංශෝධනයෙන් ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව කැබලි කොට මුළු දිවයින තුළ ම ක්‍රියාත්මක වන ජාතික පොලිසියකුත්, එක් එක් පළාත සඳහා පළාත්බද පොලිසියත් ඇති කිරීමට කටයුතු කෙරිණි.[63] ජාතික පොලිසිය මධ්‍යම රජය විසින් ද පළාත්බද පොලිසි පළාත් ආණ්ඩු විසින් ද පාලනය කෙරේ.

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් හඳුන්වාදුන් පළාත් සභා ලැයිස්තුවේ 1 වන පරිශිෂ්ටයේ දක්වා ඇති ප්‍රමාණයට පළාතක් ඇතුළත මහජන සාමය පැවැත්වීම හා පොලිස් බලතල ක්‍රියාත්මක කිරීමේ වගකීම පළාත් පොලීසිය වෙත පවරා තිබේ.[64]

ජාතික පොලිසියේ ප්‍රධාන වගකීම වන්නේ කොළඹ නගරය, කෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුර හා ජනාධිපතිවරයා විසින් තීරණය කරනු ලබන ඒ නගරවලට තදාසන්න ප්‍රදේශවල මහජන සාමය පවත්වාගැනීම, ජාතික ආරක්ෂාව, ප්‍රභූවරුන් ගේ ආරක්ෂාව සහ ඔවුනට එරෙහි ව සිදු කරනු ලබන වැරදි විමර්ශනය කිරීම හා අනාවරණය කරගැනීම වේ.[65]

13 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් හඳුන්වාදුන් ආකෘතියට බොහෝ සෙයින් සමාන අකෘතියක් යටතේ පොලිස් බලතල ලබාදීමට වර්තමාන යෝජනාවලින් ද යෝජනා වී ඇත. මේ යෝජනාවලට අනුව ද පොලිසිය ජාතික හා පළාත් වශයෙන් බෙදා ඇති අතර පළාතට වෙන් වූ පොලිසියක් පවත්වාගෙන යෑමට විධිවිධාන සලසා ඇත.[66]

විශේෂඥ කමිටු නිර්දේශවලට අනුව පොලිස් ප්‍රතිපත්ති සම්බන්ධ ව ජාතික පොලිසිය නීතිය හා සාමය පිළිබඳ මධ්‍යම රජයේ අමාත්‍යවරයාට වග කිව යුතු අතර පළාතක පොලිසියක් ඒ පළාතේ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යවරයාට වග කිව යුතු ය. පොලිසිය දේශපාලනයෙන් මුක්ත විය යුතු බව කෑමොර දෙන මොවුන්, පොලිස් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ව අමාත්‍යවරුන් මැදිහත් කරගන්නට උත්සාහ කරන්නේ මන්දැ යි ප්‍රශ්නයකි. එ සේ ම මේ යෝජිත විධිවිධානවල ඍජු ප්‍රතිඵලය වන්නේ පොලිස් ප්‍රතිපත්ති මධ්‍යම රජය හා පළාත් ආණ්ඩු විවිධ ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම යි.

නීතිය හා සාමය යන විෂයය පළාත් සභා ලැයිස්තුවට දැනට ම ඇතුළත් කර ඇති අතර යෝජිත ව්‍යවස්ථාව ද ඊට වඩා වෙනස් වේ යැ යි අපේක්ෂා කළ නොහැකි ය. මේ නිසා පළාතකට ආවේණික වූ වෙන ම ප්‍රතිපත්ති හා නීති පළාත් සභාවකට සම්මත කරගැනීමට ඉඩ සැලසෙනු ඇත. උදාහරණයක් වශයෙන් පළාතක පොලිසි ස්ථානගත කිරීමේ දී සිංහල හා මුස්ලිම් ප්‍රදේශවලට අගතියක් වන පරිදි පළාත් පොලිසි ක්‍රියාත්මක කිරීම මෙහි ප්‍රතිඵලය වනු ඇත.

නව ව්‍යවස්ථා සංශෝධනය මඟින් ඇමතිවරයකුට අපරාධ විමර්ශනය හා නඩු පැවරීම සම්බන්ධයෙන් සුවිශේෂ නියෝග දීමට නොහැකි බවට විධිවිධාන

63. නව වන උපලේඛනය, අයිතමය 1 හා 1 වන පරිශිෂ්ටය.

64. 9 වන උපලේඛනයේ 1 වන පරිශිෂ්ටයේ 11 වන වගන්තියට අනුව පළාත භාර ව සිටින පළාත් පොලිසියේ ප්‍රධානයා, "ප්‍රධාන අමාත්‍යවරයාට වග කිව යුතු අතර, ඔහු ගේ පාලනය යටතේ සිටිය යුතු ය."

65. නව වන උපලේඛනයේ පළාත් සභා ලැයිස්තුවේ 1 වන වගන්තිය.

66. පොලිස් බලතල පිළිබඳ අනුකමිටු වාර්තාව.

ඇතුළත් කිරීමට යෝජනා කර ඇතත් එය ක්‍රියාත්මක වීමේ දී නීතිය හා සාමය පිළිබඳ ඇමතිවරයාට බලපෑම් කිරීමට ඉඩ ලැබෙනු ඇති බව සඳහන් කළ යුතු ව ඇත.

13 වන ව්‍යවස්ථා සංශෝධනයේ මෙන් ම "විශේෂඥයන් ගේ" කෙටුම්පතට ද අනුව සාමාන්‍ය පුරවැසියනට එරෙහි ව සිදු කරන වැරදි විමර්ශනය කිරීමේ වගකීම ඇත්තේ පළාත් පොලිසියට යි. ජාතික පොලිසිය ප්‍රභූවරුනට එරෙහි ව සිදු කරන වැරදි විමර්ශනය කිරීම සිදු කරයි. වර්තමාන උතුරු මහ ඇමති ගේ වර්ගවාදී ස්වභාවය අනුව පළාත් පොලිසියට අපරාධ විමර්ශනය කිරීමේ වගකීම පැවරීම උතුරු හා නැගෙනහිර පළාත්වල සිංහල ජනයා ගේ ආරක්ෂාවට බලවත් තර්ජනයක් බව පැවසිය යුතු ය.

මූලික අයිතිවාසිකම් - අන්‍යාගමිකකරණය, සමලිංගික ක්‍රියා නීතිගත කිරීම හා විදේශිකයනට පුරවැසිභාවය ලබාදීම.

මූලික අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදයට ද බරපතළ සංශෝධන ගණනාවක් කිරීමට යෝජනා වී තිබේ. මූලික අයිතිවාසිකම් පිළිබඳ අනුකමිටුවේ නිර්දේශ අතර පහත සඳහන් නිර්දේශ පිළිබඳ විශේෂයෙන් සඳහන් කළ යුතු ව ඇත.

(1). පුරවැසියනට පමණක් සීමා වූ සංස්කෘතික හා ආගම ප්‍රකාශ කිරීමේ නිදහස සියලු තැනැත්තනට විවෘත කිරීම.

වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සංස්කෘතිය භුක්ති විඳීමේ හා ආගම ප්‍රකාශ කිරීමේ නිදහස ඇත්තේ පුරවැසියනට පමණි.[67] එහෙත් අනුකමිටුව යෝජනා කරන්නේ මේ අයිතිවාසිකම් සියලු තැනැත්තනට නිරාවරණය කළ යුතු බව යි. ශ්‍රී ලංකාවට නොගැළපෙන විවිධ පර සංස්කෘතීන් හා ආගම් මෙ රටට පහසුවෙන් ආනයනය කිරීම මෙහි අරමුණ යි. ඒ අනුව විවිධ ඉස්ලාම් හා ක්‍රිස්තියානි මූලිධර්මවාදී ආගම් මෙ රටට එන විජාතිකයන් හරහා ප්‍රවර්ධනය කිරීමට මඟ සැලසෙනු ඇත.

(2). ලිංගිකත්වය, ලිංගික දිශානතිය මත වෙනස්කමක් නො කළ යුතු බව ව්‍යවස්ථාගත කිරීමෙන් සමලිංගික කටයුතු නීතිගත කිරීම

වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(2) වගන්තියේ සඳහන් වන්නේ කිසියම් **පුරවැසියකු** වර්ගය, ආගම, භාෂාව, කුලය, **ස්ත්‍රී පුරුෂ භේදය**, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත වෙනස්කමකට භාජනය නො කළ යුතු බවයි.[68]

'ස්ත්‍රී පුරුෂ භේදය' මත වෙනස්කමකට භාජනය නො කළ යුතු ය යනුවෙන් අදහස් කරන්නේ යමකු ගැහැනියක ද පිරිමියකු ද යන්න මත වෙනස්කමක් නො කළ යුතු බව යි. එහෙත් "ලිංගික දිශානතිය" හා "ලිංගිකත්වය" යන්නට සමලිංගිකයන්, බහුලිංගිකයන් හා මෙ රට සංස්කෘතියට නොගැළපෙන ලිංගික ක්‍රියාකාරකම්වල නිරතවන්නන් ඇතුළත් විය හැකි අතර එ වැනි කටයුතුවල නිරත වීම මත කිසි ම වෙනස්කමක් කළ නොහැකි වන පරිදි නව යෝජනා[69] සකස් කර ඇත. ඒ අනුව සමලිංගික විවාහ, සමලිංගික ප්‍රදර්ශන, සමලිංගික පෙරහැර පැවැත්වීමට නිදහස ලබාදීම මෙහි අරමුණ බව පෙනේ. මෙය ශ්‍රී ලංකාව වැනි බෞද්ධ රටකට නොගැළපෙන කටයුත්තක් බව සඳහන් කළ යුතු ව ඇත.[70]

එ සේ ම එ කී යෝජනාවල සඳහන් වන්නේ සියලු ලිඛිත හා ලිඛිත නොවන නීති ව්‍යවස්ථාවට යටත් ව කියවිය යුතු බවත් එ කී මූලික අයිතිවාසිකම්වලට පටහැණි නීති එහි අනනුකූලතාවේ ප්‍රමාණයට අවලංගු විය යුතු බව යි.[71] මේ අනුව

67. වර්තමාන ව්‍යවස්ථාවේ 14 (1) (ඉ) හා (ඊ) වගන්ති.
68. වර්තමාන ව්‍යවස්ථාවේ 12(2) වගන්තිය පුරවැසියන්ට සීමා වුව ද නව යෝජනාවල සියලු තැනැත්තන්ට මේ අයිතිවාසිකම විවෘත කර ඇත.
69. මූලික අයිතිවාසිකම් පිළිබඳ අනුකමිටු වාර්තාව, 15 පිටුව.
70. මූලික අයිතිවාසිකම් පිළිබඳ අනුකමිටු වාර්තාව, 45 පිටුව.
71. මූලික අයිතිවාසිකම් පිළිබඳ අනුකමිටු වාර්තාව, 39 පිටුව.

පිරිමින් අතර සිදු වන අස්වාභාවික ලිංගික ක්‍රියා නීතිවිරෝධී කර ඇති දණ්ඩනීති සංග්‍රහයේ වගන්ති අවලංගු වී යන අතර පිරිමින් අතර හෝ ගැහැනුන් අතර හෝ විවාහ සිදු කිරීම හා එ වැනි විවාහ ප්‍රවර්ධනයට ඉඩ සැලසෙනු ඇත. මේ යෝජනා මෙ රටේ සංස්කෘතිය හා සභ්‍යත්වය විනාශ කරන ප්‍රතිපාදන බව සඳහන් කළ යුතු ය.

එහෙත් විශේෂයෙන් එ කී යෝජනාවල සඳහන් වන්නේ ඉහත සඳහන් විධිවිධාන පුද්ගල නීති සම්බන්ධයෙන් අදාළ නොවන බව යි.[72] පුද්ගල නීති යන්නට මුස්ලිම් හා උඩරට විවාහ හා දික්කසාද සම්බන්ධ නීතිය ඇතුළත් වන අතර මුස්ලිම්වරුනට විශේෂ වරප්‍රසාද ලබාදෙන නීති, එ නම් මුස්ලිම් භක්තිකයනට අඩු වයසින් විවාහ වීමට හා පහසුවෙන් දික්කසාද වීම සඳහා තිබෙන විධිවිධානවලට මේ යෝජනා කිසි දු බලපෑමක් ඇති නොකරනු ඇත.

(3). ආගම් ප්‍රවර්ධනයට ඉඩ සැලසීම හරහා අන්‍යාගමිකකරණය නීතිගත කිරීම.

වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (1) (ඉ) වගන්තිය මෙ සේ ය.

*"(ඉ) එකලා ව හෝ අන් අය සමඟ, ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලික ව තම ආගම, ලබ්ධිය හෝ විශ්වාසය ඇදහීමෙන්, පිළිපැදීමෙන්, ප්‍රගුණ කිරීමෙන් සහ ඉගැන්වීමෙන් **ප්‍රකාශ කිරීමේ** නිදහසට;"*

ඉහත වගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට යෝජනා වී ඇතඃ

*"සෑම තැනැත්තකුට ම තම ආගම හෝ විශ්වාසය තනි ව ම හෝ අන් අය හා සමග හෝ ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලික ව හෝ ඇදහීම මඟින්, පිළිපැදීම මඟින්, ප්‍රගුණ කිරීම මඟින්, **ප්‍රචාරය කිරීම** මඟින් හා ඉගැන්වීම මඟින් ප්‍රකාශ කිරීමේ නිදහසට හිමිකම් ඇත්තේ ය."*[73]

ඉහත වගන්ති දෙකේ වැදගත් වෙනස් කමක් හඳුනාගත හැකි ය. එ නම් නව යෝජනාවේ 'ප්‍රචාරය කිරීම' (Propogation) යන වචනය අලුතෙන් එක් කර ඇත. ආගමක් ප්‍රචාරය (Propogation) හා ආගමක් ප්‍රකාශ කිරීම (manifestation) අතර පැහැදිලි වෙනසක් තිබෙන බව අධිකරණය පිළිගෙන ඇති කාරණයකි. ආගම් ප්‍රචාරය (Propogation) යනු ආගමක් ප්‍රවර්ධනය යි. නැත හොත් තම වර්ගයා වැඩි කිරීම යි (නැතහොත් තම ආගමට හැරවීම යි). ආගම් ප්‍රවර්ධනය කිරීම බලහත්කාරකමින්, වංචාවෙන් ආධාර දීමෙන් හා සදාචාර විරෝධී ක්‍රියා මඟින් සිදුකරන බව පැහැදිලි සත්‍යයකි.

මේ යෝජනා මඟින් සිදු කර ඇත්තේ ආගම ප්‍රකාශ කිරීමේ (manifestation) නිදහසට අමතර ආගම ප්‍රචාරය කිරීම නැත හොත් ප්‍රවර්ධනය (Propogation) කිරීමේ නිදහස ද හොර රහසේ ඇතුළත් කිරීමට පියවර ගැනීම යි.

(4). පුරවැසියන් නොවන ශ්‍රී ලංකාවේ ස්ථිර පදිංචිය ලබාගෙන ඇති අයට පුරවැසියනට හිමි සියලු අයිතිවාසිකම් ලබාදීම.

මූලික අයිතිවාසිකම් පිළිබඳ අනුකමිටු යෝජනා අතර පුරවැසියන් නොවන, එහෙත් ශ්‍රී ලංකාවේ ස්ථිර පදිංචියක් ඇති අයට පුරවැසියන් ගේ අයිතිවාසිකම්

72. මූලික අයිතිවාසිකම් පිළිබඳ අනුකමිටු වාර්ථාව, 39 පිටුව.
73. අනුකමිටු වාර්තා නැවත ප්‍රකාශනය, 18 පිටුව.

ලබාගැනීමට ඉඩ ලබාදී ඇත්තේ මෙ සේ යඃ[74]

> *"යම් රටක පුරවැසියකු නොවූ ද නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බලාත්මක වන දිනයේ දී ශ්‍රී ලංකාවේ ස්ථිර සහ නෛතික පදිංචිකරුවකු ව සිටියා වූ ද එ වැනි පදිංචිකරුවකු ලෙස දිගට ම සිටින්නා වූ ද යම් තැනැත්තකුට, මේ ව්‍යවස්ථාව මඟින් ශ්‍රී ලංකාවේ පුරවැසියකුට හිමිකම ඇති, ප්‍රකාශිත සහ පිළිගත් සියලු ම අයිතිවාසිකම්වලට හිමිකම තිබිය යුතු ය."*

මෙහි දී විශේෂයෙන් සඳහන් කළ යුතු තවත් කරුණක් වන්නේ දරුවනට පුරවැසි භාවය ලබාගැනීමේ අයිතිය තහවුරු කිරීම හරහා ශ්‍රී ලංකාවේ ස්ථිර පදිංචියට පැමිණි අයට දා ව ලැබෙන දරුවනට ශ්‍රී ලංකාවේ පුරවැසි භාවය ලබාගැනීමට අවස්ථාව සලසා තිබීම යි.[75]

74. අනුකම්ටු වාර්තා නැවත ප්‍රකාශනය, 41 පිටුව.
75. මූලික අයිතිවාසිකම් පිළිබඳ අනුකම්ටු වාර්තාවේ දැක්වෙන ළමා අයිතිවාසිකම් කොටස බලන්න, 31 පිටුව.